Civil Aviation Authority
Sri Lanka

Safe and Efficient Skies for All

සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්

වාර්ෂික වාර්තාව 2020

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය



Safe and Efficient Skies for All

වාර්ෂික වාර්තාව - 2020

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ
15 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ තේමා ගීතය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
කිත් යසසින් සුදිලේ
හෙළි කොටැ හේළී හෙළේ //

සක්විති රාවණ ආදි යුගෙන්
දඬු මොණරින් ගුවන දිනා //
වික්මැති ලක්දන වා රිය පොළිනුත්
පෑ විදු නුවණ මනා //

'උවදුරු තොර බව සඳහා මුල්වෙමු'
වෙයි පෙර වැකිය අපේ //
'ඉක්මන් අය මග නැගුමෙහා මුල්වෙමු'
මේ වෙයි දැකුම අපේ //

රටවැසි යුතුකම් ඉටුවෙන අයුරින්
මව්බිම හා බැඳෙමු //
සමාජ මෙහෙවර, සාරදහම් රැක
වගකීමෙන් පුදමු //

පද රචනය : කලාශූරී අරිසෙන් අහුබුදු (දිවංගත)
ගායනය : කලාකීර්ති දේශමාන්‍ය ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව (දිවංගත)
සංගීතය : කලාකීර්ති දේශමාන්‍ය ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව (දිවංගත)

ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී,

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය යටතේ නියමිත ව්‍යවස්ථාමය අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වශයෙන් 2020 වාර්ෂික වාර්තාව සම්පාදනය කරන ලදී. 2020 ජනවාරි 01 වන දින සිට 2020 දෙසැම්බර් 31 වන දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්හි සාරාංශයක් සහ 2020 මුදල් වර්ෂය සඳහා අධිකාරියෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මෙහි ඇතුළත් වී ඇත.

උපුල් ධර්මදාස
සභාපති

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
2021 පෙබරවාරි 28 වනදා



අප පිළිබඳව

දැක්ම

සැමට නිරුපද්‍රත අහසක් සහතික කරමින් ප්‍රවීණ සහ විශ්වසනීය ගුවන්සේවා නිරුපද්‍රතතා නියාමකයකු බවට පත් වීම.

මෙහෙවර

උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර නියාමනය මගින්, ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමගත් ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතා සමගත් අනුගත නිරුපද්‍රත, සුරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් මෙහෙයවීම සුසාධනය කිරීම.

ආදර්ශ පාඨය

"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"



සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්

වසර ගණනාවක් පුරා අපි ගෝලීය ප්‍රමිතීන් සම්පූර්ණයෙන්ම ග්‍රහණය කර ගැනීමට සහ අනුගතවීමට අපි අපගේ මෙහෙයුම් හැඩගස්වා ප්‍රතිනිර්මාණය කරමින් සිවිල් ගුවන්සේවා කර්මාන්තයේ දර්ශනය පරිවර්තනය කරමින් සිටින්නෙමු. අපි අහසේ නිරුපද්‍රතතාව සහ ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතරම, වඩාත් තිරසාර සහ පරිසර හිතකාමීව ඊළඟ පරම්පරාව සඳහා අහස ආරක්ෂා කරන බවට සහතික වන්නෙමු. ඵලදායී නියාමනය සහ උපාය මාර්ගික සැලසුම් තුළින්, අපට නව යුගයක් කරා යාමට හැකි වී ඇති අතර, සියලු දෙනාටම කාර්යක්ෂම අහසක් නිර්මාණය කරමින් සුරක්ෂිත පියාපත් මත අපි විශිෂ්ටත්වය කරා පියාසර කරමින් සිටින්නෙමු.

පටුන

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ තේමා ගීතය / 02

ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. / 03

සංක්ෂිප්ත යෙදුම් / 07

නාමාවලිය / 08

සභාපතිතුමාගේ සමාලෝචනය / 10

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය / 13

CAASL හි පැතිකඩ / 17
හැඳින්වීම / 17
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සාමාජිකයින් / 19
CAASL හි 13 වන අධ්‍යක්ෂ මණ්ඩලය හැඳින්වීම / 22

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය / 26
ආකල්පය / 26
අරමුණු / 26
උපාය මාර්ග / 26
සාරධර්ම / 26
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ආසන්න ඉලක්ක / 26
අපේක්ෂිත ප්‍රතිඵල / 26
ප්‍රතිදානය / 27

නියාමන විෂය ක්ෂේත්‍රය / 28

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම / 30
අධිකාරියෙහි කාර්යභාරය / 30
අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් / 30
අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලනය / 30
අධිකාරියෙහි විධායක බලතල / 30
අධිකාරියෙහි කමිටු / 30
කාර්ය මණ්ඩල කමිටුව / 31
විගණන සහ කළමනාකරණ කමිටුව / 31
NGAP ශ්‍රී ලංකා වැඩසටහන - ජාතික කමිටුව / 31
සිවිල් ගුවන්සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව (CADEC) / 32
හවුල්කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම / 32
අධිකාරියේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීම / 32
වගවිය යුතු බව / 32
බැඳියා පිළිගැටුම් / 32
තත්ත්ව සහ අභ්‍යන්තර විගණනය / 32
ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූලවීම / 33
ආචාර ධර්ම / 33

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය / 34

පාලනය සහ කළමනාකරණය / 39
CAASL රැස්වීම් / 39

ගුවන්සේවා නිරුපද්‍රවතා අධීක්ෂණ ඒකකය / 39
නීති සහ බලාත්මක කිරීමේ ඒකකය / 41
තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ (ICT) ඒකකය / 42
සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සහ මාධ්‍ය ඒකකය / 42
ගුවන් වෛද්‍ය සේවා ඒකකය / 43

තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය / 44
පරිසරය, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය / 45

ගගන නාවික සේවා නියාමන ශාඛාව / 47
ගගන යාත්‍රාංගන හා පහසුකම් අංශය / 47
ගුවන් සංචරණ සේවා අංශය / 48

පියාසර නිරුපද්‍රවතා නියාමන ශාඛාව / 53
පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය / 53
ගුවන්යානා මෙහෙයුම් අංශය / 54
ගුවන්යානා ලියාපදිංචි කිරීම් සහ ගුවන් යෝග්‍යතා අංශය / 55

ගුවන්සේවා ආරක්ෂණ නියාමන ශාඛාව / 58
ගුවන්සේවා ආරක්ෂණ අංශය / 58

ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව / 61
ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය / 61
මානව සම්පත් හා දේපළ කළමනාකරණ අංශය / 63
මූල්‍ය හා ආදායම් කළමනාකරණ අංශය / 67

ප්‍රධාන කාර්ය සාධන දර්ශක – 2020 / 68

ගමනාගමන තොරතුරු / 74

මුල්‍ය ප්‍රකාශන – 2020 / 77

විගණකාධිපතිගේ වාර්තාව – 2020 / 103

විගණකාධිපති වාර්තාවට පිළිතුරු – 2020 / 108

www.caa.lk

සංක්ෂිප්ත යෙදුම්

AE&F	ගගන යාත්‍රාංගන සහ පහසුකම්
ANS	ගුවන් සංතරණ සේවා
AASL	සී/ස ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම
ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ADRM	ගගන යාත්‍රාංගන
AME (BL)	ගුවන්යානා නඩත්තු ඉංජිනේරු (මූලික බලපත්‍රය)
AML	ගුවන්යානා නඩත්තු බලපත්‍රය
AMO	අනුමත නඩත්තු සංවිධානය
AMT	ගුවන්යානා නඩත්තු කාර්මික
ANR	ගුවන් සංතරණ රෙගුලාසි
AOC	ගුවන්යානා මෙහෙයුම් සහතිකය
AS	ගගන නාවික සේවා
ASN	ගුවන්සේවා නිරුපද්‍රතතා නිවේදනය
ASM	ගුවන්සේවා නිරුපද්‍රතතා අධීක්ෂණය
AT&ER	ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන
ATC	ගුවන් ගමන් පාලනය/ගුවන් ගමන් පාලක
ATM	ගුවන් ගමන් කලමනාකරණය
AV. SEC	ගුවන්සේවා සුරක්ෂිතතාව
AW	ගුවන් යෝග්‍යතාව
AWE	ගුවන් යෝග්‍යතා ඉංජිනේරු
BIA	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල
BIRD	කුරුලු ගැටීම් (Bird Strike)
CAASL	ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
CADEC	සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව
CEO	ප්‍රධාන විධායක නිලධාරී
COSCAP-SA	මෙහෙයුම් නිරුපද්‍රතතාව හා අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව වර්ධනය කිරීමේ - දකුණු ආසියා සහයෝගිතා වැඩසටහන
CSI	මැදිරි නිරුපද්‍රතතා පරීක්ෂක
C of R	ලියාපදිංචි කිරීමේ සහතිකය
D	අධ්‍යක්ෂ
DDG/ASR	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් අවකාශ සහ සුරක්ෂිතතා නියාමන)
DDG/ CAER	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන)
DDG/FSR	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පියසර නිරුපද්‍රතතා නියාමන)
DDG/ AVSER	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන්සේවා සුරක්ෂිතතා නියාමන)
D/AE&F	අධ්‍යක්ෂ/ගගන යාත්‍රාංගන සහ පහසුකම්
D/ANS	අධ්‍යක්ෂ/ගුවන් සංතරණ
D/AOPS	අධ්‍යක්ෂ/ගුවන්යානා මෙහෙයුම්
D/ARAW	අධ්‍යක්ෂ/ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා
D/ATER	අධ්‍යක්ෂ/ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන
D/AVS	අධ්‍යක්ෂ/ගුවන්සේවා සුරක්ෂිතතා
D/ HR&PM	අධ්‍යක්ෂ/මානව සම්පත් සහ දේපළ කළමනාකරණ
D/F&RM	අධ්‍යක්ෂ/මූල්‍ය සහ ආදායම් කළමනාකරණ

D/TO&PL	අධ්‍යක්ෂ/පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර
D/ER&P	අධ්‍යක්ෂ/පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති
D/QIA	අධ්‍යක්ෂ/තත්ත්ව සහ අභ්‍යන්තර විගණන
DG	අන්තරායකර ද්‍රව්‍ය
DGCA	සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්
EASA	යුරෝපා ගුවන්සේවා නිරුපද්‍රතතා නියෝජිත ආයතනය
ER&P	පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති
FIR	පියාසර තොරතුරු කලාපය
FS	පියාසර නිරුපද්‍රතතාව
FPP	පියාසර කාර්යපටිපාටි වැඩසටහන
FUEL	ඉන්ධන සම්බන්ධ
GCOL	බිම ගැටීම
GSA	පොදු අලෙවි නියෝජිත
ICAO	ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය
ICT	තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණය
IS	ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය
PBN	කාර්යසාධන පාදක සංතරණය
LALT	අඩු උන්නතාංශ මෙහෙයුම්
LCC	අඩු වියදම් ගුවන් ප්‍රවාහන සමාගම්
LA&EU	නීති සහ බලාත්මක කිරීමේ ඒකකය
MAC	ගුවන් ආසන්නතාව/ACAS අනතුරු ඇඟවීම්/දුරස්භාවය නැති වීම/ ආසන්න ගැටීම්
MED	වෛද්‍ය
MRIA	මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල
NCASP	ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන
OTHR	වෙනත්
Q&IA	තත්ත්ව සහ අභ්‍යන්තර විගණන
RAMP	භූමි හැසිරවීම්
RI	ගුවන් ධාවනපථය ආක්‍රමණය - වාහන, ගුවන්යානා හෝ පුද්ගලයා
RPK	ආදායම් මගී කිලෝමීටර්
RTK	ආදායම් ටොන් කිලෝමීටර්
SARPs	ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්
SAARC	දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය
SARI	දකුණු ආසියානු කලාපීය ප්‍රාරම්භනය
SCF-NP	පද්ධති/සංරචක ක්‍රියාවිරහිතවීම් හෝ දුර්වලවීම්
SCF-PP	බලෝත්පාදක ක්‍රියාවිරහිතවීම් හෝ දුර්වලවීම්
SEC	සුරක්ෂිතතාව
SLAS	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
SLCAP	ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා ප්‍රකාශය
SLFRS	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති
SMS	නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රමය
SSP	රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන
TO&PEL	පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර
TURB	කුණාටු මුණගැසීම්
USAP	විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන
USOAP	විශ්ව නිරුපද්‍රතතා අධීක්ෂණ විගණන වැඩසටහන
WILD	වනජීවී ගැටුම
WSTRW	සුළං මාරුව හෝ ගිගුරුම් කුණාටුව

නාමාවලිය

ප්‍රධාන කාර්යාලය : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
අංක 152/1, මිනුවන්ගොඩ පාර,
කටුනායක, ශ්‍රී ලංකාව.

දුරකථන	:	94 -11-2304632, 94-11-2358800
ෆැක්ස්	:	94 -11-2304644
විද්‍යුත් තැපැල් ලිපිනය	:	info@caa.lk
වෙබ් අඩවිය	:	www.caa.lk
තැපැල් ලිපිනය	:	තැ.පෙ. 535, කොළඹ
විදුලි සංදේශ ලිපිනය	:	එයාර්සිවිල් AIRCIVIL
AFTN ලිපිනය	:	VCCCYAYX

කටුනායක කාර්යාලය : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
FD II, පිටත්වීමේ පර්යන්තය
BIA, කටුනායක

දුරකථන	:	94 -11-2252269
ෆැක්ස්	:	94 -11-2252269

මත්තල කාර්යාලය : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල
මත්තල

දුරකථන	:	94 -47-7510530
ෆැක්ස්	:	94 -47-7510541

ගුවන් යෝග්‍යතා උප කාර්යාලය : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
කොළඹ ගුවන් තොටුපල
රත්මලාන

දුරකථන	:	94 -11 -3135828
ෆැක්ස්	:	94 -11 -2635756

ගිණුම් පරීක්ෂකවරු : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති
නීතිපතිවරු : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, නීතිපති
බැංකුකරු : ලංකා බැංකුව
රක්ෂණකරු : සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"



සභාපතිතුමාගේ සමාලෝචනය



මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (MRIA), ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ සෞභාග්‍යයේ සලකුණක් වන, වනගත ප්‍රදේශයක වර්ග මීටර් 12,000 ක් පුරා විහිදුණු, පරීක්ෂා කිරීමේ කවුළු දොළහක් (12), සහ තොටුපලවල් දෙකක් (02), මෙන්ම දැනට විශාලතම වාණිජ ගුවන්යානා හසුරුවා ගැනීමේ හැකියාව ඇති මනරම් පර්යන්ත ගොඩනැඟිල්ලකි.

සභාපතිතුමාගේ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ 2 වන ජාත්‍යන්තර ගුවන් තොටුපල වන MRIA වාණිජ මෙහෙයුම් සඳහා 2013 වසරේ මාර්තු 18 වන දින එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් ආරම්භ කරන ලද අතර, මෙහෙයුම් සඳහා කැපවූ විදේශීය ගුවන් සමාගම් දෙකක (02) සහභාගීත්වයෙන් සැමරුම් උත්සවය අලංකෘත විය.

එක්සත් ජනපදයේ සහ එක්සත් ජනපද පුරවැසි බව ලත් ශ්‍රී ලාංකිකයන් රැගෙන ගිය එක්සත් ජනපදයෙන් ආරම්භ වූ සැමරුම් පියසැරිය සංවිධානය කිරීම සඳහා පහත අත්සන් කරන ලද පුද්ගලයා මූලික විය. එහි අරමුණ වූයේ ජාතික අභිමානය ඉස්මතු කිරීම බැවින් ගමනේ දෙවන අදියර ලෙස එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ (UAE) සිට පැමිණීමට ජාතික ගුවන්සේවය තෝරා ගන්නා ලදී. දැන්, CAASL හි සභාපතිවරයා වශයෙන්, මම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති රාමුවේ රට හඳුන සෞභාග්‍යයේ දැක්ම සඳහා දායකවීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

2019 නොවැම්බරයේ ලොව ආක්‍රමණය කර ගෝලීය ආර්ථිකය පහළට ඇද දැමූ කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන් 2020 වසර සිවිල් ගුවන්සේවා කර්මාන්තයේ පමණක් නොව මුළු ලෝකයේම පැවැත්ම සඳහා වඩාත්ම අභියෝගාත්මක වසරක් විය. නව ප්‍රවේශයන් ගවේෂණය කරන තෙක් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා මාස කිහිපයකට නතර විය.

අපගේ ජාතික ගුවන් සේවයේ (Sri Lankan Airlines Ltd) සම්පූර්ණ ගුවන්යානා ඇණියද මාස දෙකකට ආසන්න කාලයක් නවතා දමා ඇත. සීමිත අවස්ථා තිබියදීත්, සියලුම භාණ්ඩ ප්‍රවාහන ගුවන්යානා මෙහෙයුම් සිදු කළ හැකි බව ඉක්මනින් අවබෝධ වූ අතර, මෙම මෙහෙයුම සඳහා එහි එක් ගුවන් යානයක් පරිවර්තනය කිරීමට අවශ්‍ය අනුමැතිය අප අධිකාරිය විසින් ලබා දෙන ලදී. පසුව, සෞඛ්‍ය බලධාරීන්ගේ සමීප පරීක්ෂාව යටතේ, දේශීය ආරක්ෂක මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර ගුවන්සේවා ආරක්ෂක පියවර සපුරාලීම යටතේ විදේශ රටවලින් ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් BIA හරහා ආරම්භ කරන ලදී.

සේවාව වෙත සෞඛ්‍ය මාර්ගෝපදේශ හඳුන්වාදීම වරින් වර නිකුත් කරන ලද ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ ICAO මාර්ගෝපදේශයන්ට අනුකූලව, අප අධිකාරිය විසින් සියලුම පාර්ශවකරුවන් වෙත ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශය පිළිබඳ මූලික විධානයක් නිකුත් කරන ලද අතර, එය කොවිඩ්-19 පැතිරීම පාලනය කිරීමට හා වැළැක්වීමට පියවර ගැනීමට හැකි වන පරිදි යාවත්කාලීන කිරීම් සහිතව අඛණ්ඩව කරගෙන යනු ලැබේ.

CAASL (ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය) කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන සහ විනෝදාත්මක පහසුකම් - මානව සම්පත ආයතනයේ පුද්ගල සහ සාමූහික දායකත්වයෙන් බාධාවකින් තොරව මෙහෙයුම් සිදුකිරීමට ඇති වටිනාම සම්පත බව CAASL පිළිගනී. එබැවින්, සියලුම තරාතිරම්වල සේවකයින් නියෝජනය කරමින් අලුතින් පත් කරන ලද නිලධාරී මණ්ඩලය සම්බන්ධ කර ගනිමින්, දැනට ක්‍රියාත්මක වැඩසටහන සංශෝධනය කිරීමට සභාපතිවරයා සහ DGCA/CEO භාර ගන්නා ලදී. මූල්‍ය තත්ත්වය ස්ථාවර වූ පසු එහි ප්‍රතිලාභ පිළිඹිබු වනු ඇත.

සභාපතිතුමාගේ සමාලෝචනය

රාවණා රජු සහ ප්‍රාග් ඓතිහාසික ගුවන් සේවයේ ඔහුගේ භූමිකාව – නුවරඑළිය සහ වැලිමඩ ප්‍රදේශවල හඳුනාගත් ස්ථාන ජාතික සංචාරක සැලැස්මට ඇතුළත් කිරීම සඳහා ඓතිහාසික කරුණු මත පවතින තොරතුරු සත්‍යාපනය කිරීම සඳහා ගවේෂණය කිරීමට CAASL පෙරමුණ ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය මෙම ප්‍රදේශවල සංචාරක ව්‍යාපාරයේ දියුණුවට දායක වනු ඇතැයි විශ්වාස කෙරෙන අතර එමඟින් පුරෝකථනය කරන ලද ආර්ථික වර්ධනය සමඟ එහි ජනතාවගේ ජීවන තත්ත්වය ද ඉහළ යනු ඇත.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල (MRIA) – 'නව-සාමාන්‍ය' තත්ත්වයට සමගාමීව, MRIA හි වාණිජ ගුවන්යානා මෙහෙයුම් 2020 දෙසැම්බර් සිට නැවත ආරම්භ කර ඇත. CAASL විසින් MRIA හි Aerodrome සහතිකය මෙම වසර සඳහා අලුත් කර ඇත. මේ සම්බන්ධයෙන් ගුවන් තොටුපල ක්‍රියාකරු වන Airport and Aviation Services (Sri Lanka) Ltd විසින් ආරක්ෂාව, සහ මඟින් හැසිරවීම යන ක්ෂේත්‍රවල දී සිදු කරන ලද සැලකිය යුතු දායකත්වය සිහිපත් කෙරේ. මෑත අතීතයේ MRIA වරලත් ගුවන් ගමන් කිහිපයකට අවස්ථාව සලසා දී ඇති අතර ගුවන්සේවාවන් ද මඟී සහ සියලුම භාණ්ඩ මෙහෙයුම් සඳහා උනන්දුවක් දක්වා ඇත. මෙම සේවා ආයතන ශ්‍රී ලංකාව වෙත සහ පිටතට සංචාර වැඩි කරන අතරම රජය විසින් ලබා දෙන විවිධ සහන ද භුක්ති විඳිති. සීමාසහිත ශ්‍රී ලංකන් චියාර්ලයින්ස් සමාගම MRIA හි නම් කරන ලද නැවතුම් සේවා නියෝජිතයා ලෙස භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රමුඛත්වය දෙමින් වැඩිදියුණු කිරීම් කරයි.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (MRIA), ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ සෞභාග්‍යයේ සලකුණක් වන, වනගත ප්‍රදේශයක වර්ග මීටර් 12,000ක් පුරා විහිදුණු, පරීක්ෂා කිරීමේ කවුළු දොළහක් (12), සහ තොටුපලවල් දෙකක් (02), මෙන්ම දැනට විශාලතම වාණිජ ගුවන්යානා හසුරුවා ගැනීමේ හැකියාව ඇති මනරම් පර්යන්ත ගොඩනැඟිල්ලකි.

ශ්‍රී ලංකාවේ 2 වන ජාත්‍යන්තර ගුවන් තොටුපල වන MRIA වාණිජ මෙහෙයුම් සඳහා 2013 වසරේ මාර්තු 18 වන දින එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් ආරම්භ කරන ලද අතර, මෙහෙයුම් සඳහා කැපවූ විදේශීය ගුවන් සමාගම් දෙකක (02) සහභාගීත්වයෙන් සැමරුම් උත්සවය අලංකෘත විය.

චක්සත් ජනපදයේ සහ චක්සත් ජනපද පුරවැසි බව ලත් ශ්‍රී ලාංකිකයන් රැගෙන ගිය චක්සත් ජනපදයෙන් ආරම්භ වූ සැමරුම් පියසැරිය සංවිධානය කිරීමට පහත අත්සන් කරන ලද පුද්ගලයා මූලික විය. එහි අරමුණ වූයේ ජාතික අභිමානය ඉස්මතු කිරීම බැවින් ගමනේ දෙවන අදියර ලෙස චක්සත් අරාබි එමීර් රාජ්‍යයේ (UAE) සිට පැමිණීමට ජාතික ගුවන් සේවය තෝරා ගන්නා ලදී. දැන්, CAASL සභාපතිවරයා වශයෙන්, මම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති රාමුවේ රට හඳුන සෞභාග්‍යයේ දැක්ම සඳහා දායක වීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

ජාතික ගුවන් සංතරණ සැලැස්ම
ජාතික ගුවන් සංතරණ සැලැස්ම ශ්‍රී ලංකාවේ ගුවන් සීමාව හරහා ගුවන් ගමනාගමනය වඩාත් ආරක්ෂිත සහ කාර්යක්ෂම කිරීම සඳහා සකස් කර ඇත. මෙය තවමත් කෙටුම්පත් ආකෘතියේ පවතින අතර ගෝලීය ගුවන් සංතරණ සැලැස්මේ විධිවිධානවලට අනුකූල වන ආසියා පැසිෆික් කලාපයේ අවශ්‍යතා සපුරාලමින් සංවර්ධනය වෙමින් පවතී.

සිවිල් ගුවන්සේවා මෙහෙයුම්වල ප්‍රාණ ඇපකරු සිදුවීම් සඳහා නියෝජිතයන් පත් කිරීම
ප්‍රාණ ඇපකරයට ගැනීමේ තත්ත්වයන් විසඳීමට සහාය වීම සඳහා සාකච්ඡාකරුවන්/නියෝජිතයන් ලෙස නිසි පුහුණුව ලත් සහ නම් කරන ලද පුද්ගලයින් පහසුවෙන් ලබා ගත හැකි වීම ජාත්‍යන්තර පරිචයකි. මෙම අධිකාරියේ ගුවන්සේවා ආරක්ෂක අංශයේ මැදිහත්වීම මත ආරක්ෂක අමාත්‍යාංශයට මෙම අවශ්‍යතාවය පිළිබඳ ඒත්තු ගැන්වීම නිසා සාකච්ඡා කිරීමේ කුසලතා පිළිබඳ පුහුණුව ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් 09 දෙනෙකු සේවයේ යොදවා තිබේ. මෙය සමාලෝචිත වර්ෂය තුළ මෙම අධිකාරිය ලබාගත් තවත් ජයග්‍රහණයකි.

ගුවන් ප්‍රවාහන අංශය – 2020 වර්ෂය තුළ BIA සහ MRIA හි සම්පූර්ණ මඟී සංචරණ සංඛ්‍යාලේඛන සහ එම වසරේ ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් රැගෙන ගිය මුළු මඟීන් සංඛ්‍යාව, 2019 අනුරූප සංඛ්‍යා සමඟ සපයයි.

මූල්‍ය ප්‍රකාශය – 2019 අනුරූප ප්‍රකාශයට විරෙහිව 2020 වර්ෂයේ CAASL ආදායම නිරූපණය කරන අතර විචල්‍ය ප්‍රතිශත පවතී.

තුති පිදුම – 2004 සිට 2020 අප්‍රේල් දක්වා CAASL හි දීර්ඝ සේවා කාලයකින් පසු 2020 අප්‍රේල් මාසයේදී විශ්‍රාම යමින් සිය ධුරයෙන් ඉවත් වූ අධ්‍යක්ෂ ජනරාල් - H M C නිමල්සිරි මහතාටත්, සමාලෝචිත වර්ෂයට එක්වෙමින් වහාම වැඩ භාරගත් කපිතාන් තේමිය අබේවික්‍රම මහතාටත් මගේ අවංක කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

කොවිඩ් - 19 ව්‍යාප්තිය නිසා ඇති වූ දුෂ්කරතා මධ්‍යයේ සෑම තරාතිරමකම සේවකයින්, පාර්ශවකරුවන් සහ රාජ්‍ය නිලධාරීන් පවත්වාගත් ඔවුන්ගේ විශිෂ්ට කාර්ය සාධනය සහ සුහද සබඳතාව සඳහා කෘතඥතාව පළ කරමි.

සෑම විටම තම වගකීම්, උපකාර සහ මගපෙන්වීම පිළිබඳව කල්පනාකාරීව කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ටද මාගේ අවංක ප්‍රණාමය හිමිවේ.

ගරු සංචාරක අමාත්‍යතුමා, ගුවන්සේවා සහ ආර්ථික කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ දෙකෙහිම ලේකම්වරු සහ එහි සියලුම නිලධාරීන්, ඔවුන්ගේ මඟපෙන්වීම්, සහ සහයෝගිතාව වෙනුවෙන් ගෞරවයෙන් සිහිපත් කරනු ලැබේ.



උපුල් ධර්මදාස
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය



කොවිඩ්-19 වසංගතය තුළ භාණ්ඩ හා සේවා සැපයීමට වඩාත් පහසු ක්‍රමයක් වන ඩ්‍රෝන් තාක්ෂණ සේවා රටට ලබාදීමට හැකියාවක්, සහ උනන්දුවක් ඇති ස්වේච්ඡා ඩ්‍රෝන් ක්‍රියාකරුවන් හඳුනාගැනීම සඳහා විශේෂ වැඩසටහනක් දියත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, දැනුම, කුසලතා සහ වෛද්‍ය පරීක්ෂණ මගින් ඩ්‍රෝන ක්‍රියාකරුවන් 20 දෙනෙකු තෝරාගෙන ඇති අතර, මානුෂීය කාර්යයන්හි නිරීක්ෂණ කටයුතු සඳහා ඩ්‍රෝන යානා ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ට අවසර ලබා දී ඇත.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

ගුවන් ප්‍රවාහනය යනු ආර්ථික හා සමාජීය ප්‍රගතිය ඇති කරන, මිනිසුන්, රටවල් සහ සංස්කෘතීන් සම්බන්ධ කරන, ගෝලීය වෙළඳපොළට ප්‍රවේශය සපයන, වෙළඳ හා සංචාරක ව්‍යාපාරය උත්පාදනය කරන සහ සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින ජාතීන් අතර සම්බන්ධතා ඇති කරන නව්‍ය කර්මාන්තයකි. පරිසර දූෂණය, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම සහ දේශගුණික විපර්යාසවලට ප්‍රතිචාර දක්වන අතරම එය වඩාත් කඩිනම්, විධිමත්, කාර්යක්ෂම සහ ආරක්ෂිතම ප්‍රවාහන මාධ්‍යයක් වේ. ප්‍රවාහන කර්මාන්තය සම්පත් සහ යටිතල පහසුකම්වල කාර්යක්ෂම දායකයෙකු බවට ඔප්පු වී ඇත. එය ධනය උත්පාදනය කරන අතර රැකියා උත්පාදනය ද කරයි.

ගෝලීය වශයෙන් කෙවිඩ්-19 රෝගය පැතිරීම හේතුවෙන් ගුවන්සේවා කර්මාන්තයේ පැවැත්ම සඳහා 2020 වසර අභියෝගාත්මක වසරක් විය. ලෝකයේ ගුවන්යානා මෙහෙයුම් බොහොමයක් සීමා කර ඇති අතර, සමාලෝචිත වර්ෂය තුළ ඉතා සීමිත පියාසැරි ප්‍රමාණයක් වාර්තා විය.

කෙසේ වෙතත්, කර්මාන්තය මුහුණ දෙන ගෝලීය අභියෝග මධ්‍යයේ වුවද, 2020 දේශීය ගුවන්සේවා කර්මාන්තයට තවත් වැදගත් වසරක් වූ අතර, විශේෂයෙන් සංචාරක අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ සහ සිවිල් ගුවන්සේවා විෂය භාර රාජ්‍ය අමාත්‍ය ගරු DV චානක මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ ප්‍රධාන සන්ධිස්ථාන මාලාවක් ඇති කිරීමට හැකි විය.

ක්‍රියාත්මක කිරීමේ සම්මතය - SLCAIS-053, නියමු රහිත ගුවන්යානා පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ CAASL විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත් (SARPs) වලට අනුකූලව සියලුම පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් වැඩිදියුණු කරන ලදී. නියමුවන් රහිත ගුවන් මෙහෙයුම් සඳහා ස්වයංක්‍රීය පද්ධති ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික කටයුතු ද ආරම්භ කරන ලදී.

ලියාපදිංචි ඩ්‍රෝන යානා 385 ක් ක්‍රියාත්මක වන අතර ඉන් ඩ්‍රෝන යානා 167 ක් 2020 වසරේ භෞතිකව පරීක්ෂාවට ලක් කරන ලදී. තවද, මිනිසුන් රහිත ගුවන්යානා (UAV) ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතීන් 473 ක් ලබා දී ඇති අතර, විශේෂයෙන් සාදන ලද ඩ්‍රෝන යානා 06 ක් ද පරීක්ෂා කර ලියාපදිංචි කරන ලදී.

කොවිඩ්-19 වසංගතය තුළ භාණ්ඩ හා සේවා සැපයීමට වඩාත් පහසු ක්‍රමයක් වන ඩ්‍රෝන් තාක්ෂණ සේවා රටට ලබාදීමට හැකියාවක්, සහ උනන්දුවක් ඇති ස්වේච්ඡා ඩ්‍රෝන් ක්‍රියාකරුවන් හඳුනාගැනීම සඳහා විශේෂ වැඩසටහනක් දියත් කරන ලදී. භාණ්ඩ හා සේවා සැපයීමේ පහසුම ක්‍රමය වන ඩ්‍රෝන් තාක්ෂණය යොදාගෙන හදිසි සේවා සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ බලධාරීන් වෙතින් පැවරෙන වගකීම් භාර ගත හැකි සුදුසුකම් ලත් ඩ්‍රෝන ක්‍රියාකරුවන්ගේ සංචිතයක් හඳුනා ගැනීම මෙහි අරමුණ විය. එමඟින් දැනුම, නිපුණතා සහ වෛද්‍ය පරීක්ෂණ මඟින් ඩ්‍රෝන ක්‍රියාකරුවන් විසි දෙනෙකු (20) තෝරාගෙන මානුෂීය කාර්යයන්හි නිරීක්ෂණ මෙහෙයුම් සඳහා ඩ්‍රෝන යානා ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දෙන ලදී.

ගුවන් ගමන් වාර 121 ක් වාර්තා වී ඇති අතර ඉන් ගුවන්යානා 107 ක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත. විදේශිකයන් 14 ක් ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇත.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද 2020 ජාතික ඵලදායිතා සම්මානය සඳහා CAASL අයදුම් කළ අතර තත්ත්ව කළමනාකරණ පද්ධතියක් (QMS) ක්‍රියාත්මක කිරීමට සහ 2021 වර්ෂයේදී ISO 9001:2015 සහතිකය ලබා ගැනීමට මූලික පියවර ගන්නා ලදී.

පාරිභෝගික අපේක්ෂාවන්ට සරිලන සේ සේවාවල ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින් CAASL විසින් සපයනු ලබන දැනට පවතින පද්ධතිවල ඵලදායිතාව සහ සේවාවන්හි ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා පාරිභෝගික සමීක්ෂණ දෙකක් සිදු කරන ලදී. පසුගිය වසර දෙක හා සසඳන විට වසර පුරා කාර්ය මණ්ඩල සන්නිවේදනය, ඍත්තීයභාවය සහ ප්‍රතිචාර දැක්වීමේ දියුණුවක් ඇති බව නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය තුළ "රාවණා රජු සහ අහිමි වූ ගුවන් ආධිපත්‍යය" (King Ravana and Lost Heritage of Aviation dominance) පිළිබඳ පර්යේෂණයේ මූලික අදියර අවසන් කර ඇති අතර, ඊට අදාළ සාහිත්‍යමය මූලාශ්‍ර එකතු කිරීම, අදාළ ස්ථානවල සාක්ෂි ලේඛනගත කිරීම, සහ පුරාණ ගුවන් තොටුපල ස්ථාන තක්සේරු කිරීම දැනට සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා රජය (GOSL) රත්මලාන ගුවන් තොටුපල පුද්ගලික පෙට් මෙහෙයුම් ඇතුළු ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා සංවර්ධනය කළ හැකි ගුවන් තොටුපලක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, CAASL විසින් එහි මූලික පියවරක් ලෙස ගුවන්යානා සහතිකය ලබා දීමට පෙර අනුකූලතාවය සඳහා ගුවන් තොටුපල සහතික කිරීමේ ක්‍රියාවලිය හරහා ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා ගුවන් යානයේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා විගණනයක් පැවැත්වීම සහ අවශ්‍ය නිර්දේශ ගුවන් තොටුපල ක්‍රියාකරු (AASL-Airport and Aviation Services Sri Lanka Ltd) වෙත ලබා දී ඇත.

අනුමත "ගුවන් සංතරණ සේවා (ANS) නිරීක්ෂණ සැලැස්ම 2020" ශ්‍රී ලංකාව තුළ ගුවන් සංතරණ සේවා සැපයීමේදී ආරක්ෂිත අධීක්ෂණ පද්ධතියේ සඵලතාවය සහතික කිරීම සඳහා මෙහෙයුම් මධ්‍යස්ථාන/පද්ධතිවල නියමිත පරීක්ෂණ අසූ එකක් (81) සමඟ සිදු කරන ලදී. SAR සේවා සැපයීම සහතික කිරීම සඳහා Aeronautical Search & Rescue Services හි සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා රජය සහ GOI අතර ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා CAASL ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඉන්දියාවේ ගුවන් තොටුපල අධිකාරිය සමඟ අබණ්ඩව සාකච්ඡාවක නිරත විය.

COVID-19 වසංගතය සමඟ ගුවන්සේවා කර්මාන්තය අඩාල වීම - 2019 දෙසැම්බර් මාසයේ ආරම්භයේ සිට, ගුවන් වෛද්‍ය සේවා අංශය කොවිඩ්-19 වසංගත රෝග පැතිරීම වැළැක්වීමේ පියවර ක්‍රියාවට නැංවිය. පසුව CAASL තුළ කාර්ය සාධක බලකායක් ස්ථාපිත කරන ලද අතර, සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කර CAASL මූලස්ථාන ගොඩනැගිල්ලට පැමිණෙන සේවකයින් සහ අමුත්තන් සඳහා අවශ්‍ය පහසුකම් සපයන ලදී.

ඉන් පසුව එය කර්මාන්තයේ චිනම් ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල සහ ගුවන්සේවා තුළ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ ද්‍රව්‍ය සකස් කර ඇත. CAASL වෛද්‍යවරයා හදිසි සේවාවන් වෙත පැමිණ ඇත.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

ජාත්‍යන්තර සහ ජාතික සෞඛ්‍ය අවශ්‍යතා දෙකම දැඩි ලෙස අනුගමනය කරමින්, CAASL විසින් සමාලෝචිත වර්ෂය තුළ මූලික විධාන දෙකක් (02) ප්‍රකාශයට පත් කරන ලද අතර, අනුගමනය කළ යුතු පූර්ව ආරක්ෂාව සහ ගුවන්සේවා කර්මාන්තයේ අනුකූලතාවය සඳහා මාර්ගෝපදේශ සපයයි.

1. මූලික විධානය 09 - කොවිඩ්-19 වසංගතයට අදාළව කාර්ය මණ්ඩල සාමාජිකයින් කළමනාකරණය කිරීම පිළිබඳ ගුවන් සමාගම් සඳහා මාර්ගෝපදේශ.
2. මූලික විධානය 10 - කොවිඩ්-19 වසංගතයට අදාළව ගුවන් තොටුපල ක්‍රියාකාරිත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ සියලුම ගුවන් තොටුපල සඳහා මාර්ගෝපදේශ.

කාලය හිතකර අතට හැරුණු විට නව සාමාන්‍ය තත්ත්වය යටතේ BIA සහ MRIA හි වාණිජ ගුවන්යානා මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සඳහා ගුවන් තොටුපල ක්‍රියාකරු වනම් AASL වැඩිදුර මග පෙන්වීම සඳහා සහාය විය. වෛරසය රට තුළ සහ ජාත්‍යන්තරව පැතිරීමේ ශීඝ්‍රයෙන් වෙනස් වන ස්වභාවය හේතුවෙන් ගුවන් වෛද්‍ය සේවා අංශය සුපරීක්ෂාකාරීව සිටින ලදී.

CAASL විසින් නියමුවන්, ගුවන් ගමන් පාලකවරුන්, කැබින් කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ සිසුන් සඳහා සාමාන්‍ය පරීදි වෛද්‍ය ඇගයීම් 2020 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක වන තුරු අඛණ්ඩව සිදු කරන ලදී. සේවාලාභීන්ට සේවා සැපයීමට සහ පසුබෑම ඉවත් කිරීමට පූර්ණ ධාරිතාවයෙන් 2020 මැයි 18 වැනි දින සේවාවන් නැවත ආරම්භ කරන ලදී. සංචරණ සීමා කාලය තුළ CAASL හි අනෙකුත් අදාළ අංශවල සහාය ඇතිව අන්තර්ජාල ක්‍රියාවලියක් හරහා CAASL හි සේවාලාභීන්ගේ වෛද්‍ය ඉතිහාසය සහ වර්තමාන වෛද්‍ය තත්ත්වය තනි තනිව තක්සේරු කර බලපත්‍ර දීර්ඝ කිරීමට විශේෂ අනුමැතිය ලබා දෙන ලදී. පනවා ඇති සංචාරක සීමාවන් හේතුවෙන් විදේශයන්හි අතරමං වූ CAASL බලපත්‍රලාභීන්ගේ වෛද්‍ය සහතික දීර්ඝ කිරීමට අනුමැතිය ලබාදීමට විශේෂ විධිවිධාන සලසා ඇත.

CAASL හි අනෙකුත් අදාළ අංශවල සහාය ඇතිව කළ අන්තර්ජාල ක්‍රියාවලි. පනවා ඇති සංචාරක සීමාවන් හේතුවෙන් විදේශයන්හි අතරමං වූ CAASL බලපත්‍රලාභීන්ගේ වෛද්‍ය සහතික දීර්ඝ කිරීමට අනුමැතිය ලබාදීමට විශේෂ විධිවිධාන සලසා ඇත.

වසර අවසන් වන විට ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්යානා ලියාපදිංචිය විශාල ගුවන්යානා 25 ක් (MTOW>5700KGS), සැහැල්ලු ගුවන්යානා 43 ක්, හෙලිකොප්ටර් 07 ක්, උණු වා බැලූන් 07 ක් සහ අති සැහැල්ලු යානා 02 ක් ඇතුළුව මුළු ගුවන්යානා 84 ක් දක්වා ඉහළ ගොස් ඇත.

ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන (NCASP) ඇමුණුම 17 හි 17 වන සංශෝධන විධිවිධාන ඇතුළත් කරමින් සමාලෝචනය කර 3 වන සංස්කරණය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ජාතික සිවිල් ගුවන්සේවා හදිසි සැලැස්ම (NCACP) ද සකස් කර ගුවන්සේවා ආරක්ෂක කොටස් හිමියන්ගේ අදහස් සඳහා ඔවුන් අතර බෙදා හරින ලදී. අදාළ AVSEC නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවූ ගුවන්යානා ක්‍රියාකරුවන්, ගුවන් තොටුපල ක්‍රියාකරුවන් සහ ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, විදේශ ගුවන්සේවා සහ ජාතික ගුවන්සේවා 38ක ආරක්ෂක වැඩසටහන් සමාලෝචනය කරන ලදී. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම මධ්‍යයේ, සමාලෝචිත වර්ෂය පුරාවටම, අනුමත කාලසටහනට අනුව ආරක්ෂක නිරීක්ෂණ කටයුතු විශාල ප්‍රමාණයක් සිදු කරන ලද අතර, ඒ යටතේ ආරක්ෂක පරීක්ෂණ 40ක් සහ ආරක්ෂක පරීක්ෂණ 03ක් සම්පූර්ණ කරන ලදී.

CAASL හි මුළු සේවක සංඛ්‍යාව වසර අවසන් වන විට සාමාජිකයින් එකසිය හැත්තෑ හය (176) ක් විය. ප්‍රධාන විධායක නිලධාරි හැර CAASL සේවකයින් ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ රැකියා කාණ්ඩයේ එක් (1) නිලධාරියෙකුගෙන් ද, ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ රැකියා කාණ්ඩයේ නවයක් (9) සහ කළමනාකරු කාණ්ඩයේ විසිහතර දෙනෙකුගෙන් (24) සමන්විත වේ. වත්මන් සංඛ්‍යාලේඛනවලට අනුව, සාමාජිකයින් හතළිස් හතරක් (44) නෛතික/මෙහෙයුම්/අමතර යන කාණ්ඩයේ සේවයේ යොදවා ඇති අතර සාමාජිකයින් හය (6) කනිෂ්ඨ කළමනාකරු යටතේ වර්ගීකරණය කර ඇත. තවද, සාමාජිකයින් පස් දෙනෙකු (5) කළමනාකරණ සහකාර - තාක්ෂණික සහ පනස් එක් (51) දෙනෙක් කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන ලෙස සේවයේ යොදවා ඇත. ප්‍රාථමික මට්ටමේ නිපුණතා සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු අය යටතේ, එක් එක් කාණ්ඩය සඳහා පිළිවෙලින් කාර්ය මණ්ඩල සාමාජිකයින් දහඅටක් (18) සහ දහහතක් (17) බැගින් සේවයේ යොදවා ඇත.

1992 අංක 55 දරන ගුවන් සංචරණ පනතේ සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධාන අනුව ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්ට (මගී), බලපත්‍රලාභීන්ට මගීන්, භාණ්ඩ ප්‍රවාහනය සහ තැපැල් මගින් ගුවන් මගින් ප්‍රවාහනය කිරීමට අවසර ලබා දේ. CAASL විසින් බලපත්‍ර නිකුත් කිරීම සහ එය වාර්ෂිකව අලුත් කිරීම ශ්‍රී ලංකාව තුළ එවැනි ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයකි.

නියාමන අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා CAASL බලපත්‍රලාභීන් නිරීක්ෂණය සිදු කරන අතර සමාලෝචිත වසර තුළ මෙම ක්‍රියාකාරකම් සඳහා බාධා ඇති විය. එබැවින් බස්නාහිර පළාත තුළ කොවිඩ්-19 වසංගතය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමේ පසුබිමක සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව අප්‍රේල් මාසයේ සිට නිරීක්ෂණ අත්හිටුවන ලදී.

කෙසේ වෙතත්, දීර්ඝ කාලයක් තිස්සේ ගැටලුවක්ව පැවති භාණ්ඩ ප්‍රවාහන සේවා සපයන්නන් (නියෝජිතයින්) සඳහා බලපත්‍ර ලබාදීමේ රෙගුලාසි කෙටුම්පත් කිරීමට කටයුතු ආරම්භ කර ඇත. කෙටුම්පත් රෙගුලාසි කර්මාන්තය තුළ ඔවුන්ගේ නිරීක්ෂණ සහ අදහස් තිබේ නම් ඒවා ද බෙදාගෙන ඇත. එම රෙගුලාසි නියාමන රාමුවක් යටතට ගෙන ඉදිරි වර්ෂයේදී අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

වර්ෂය තුළ මගී පැමිණිලි 52ක් ලැබී ඇති අතර ඉන් පැමිණිලි 20ක් වසර අවසන් වන විට විසඳා අවසන් කර ඇත. ඉතිරි පැමිණිලි විමර්ශනය කරමින් පවතින අතර ඒවායෙන් ධනාත්මක ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. මෙම පැමිණිලිවලින් බොහොමයක් ගුවන්සේවා මෙහෙයුම් අඩාල වීමෙන් තම ගමන්වලට බාධා වීම හේතුවෙන් මුදල් ආපසු ඉල්ලා සිටින මගීන්ගෙන් විය.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

කොවිඩ්-19 ගුවන් ගමන් සීමා කිරීම් හේතුවෙන්, ජාතික කොවිඩ්-19 කාර්ය සාධක බලකාය හරහා පැමිණෙන මගීන් සඳහා නව අනුමත කිරීමේ ක්‍රියාවලියක් හඳුන්වා දෙන ලදී. එහිදී, ශ්‍රී ලංකාවට පැමිණෙන ඕනෑම මගියෙකු සඳහා පළමු අනුමැතිය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබා දිය යුතු අතර 2 වන අනුමැතිය CAASL අධ්‍යක්ෂ (AT/ER) විසින් ලබා දෙනු ලැබේ. 2020 දෙසැම්බර් මස අවසන් වන විට CAASL විසින් ශ්‍රී ලාංකික වෙනත් රටවල පුරවැසියන් ඇතුළුව ශ්‍රී ලංකාවට පැමිණෙන මගීන්ට පහසුකම් සැලසීම සඳහා එවැනි අනුමත කිරීම් 20,000ක් පමණ සකස් කර ඇත.

සිදු කරන ලද මෙහෙයුම් වලින් බහුතරයක් අතරමං වූ ශ්‍රී ලාංකිකයන් ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් විය. ඒ හා සමානව ගුවන් සමාගම්වල නිත්‍ය ගුවන් ගමන්වල නිරන්තර කාලසටහන්ගත වෙනස්කම් සහ තාවකාලික මෙහෙයුම් සිදු විය. මෙම දුෂ්කර කාල පරිච්ඡේදය තුළ ගුවන් සමාගම් සඳහා එවැනි කාලසටහන් අනුමත කිරීම් 1061 ක් CAASL විසින් ලබා දෙන ලදී.

2020 වැඩසටහන් අයවැය- අධ්‍යක්ෂණය සහ කළමනාකරණය, ගුවන් අභ්‍යවකාශ සහ ගුවන්සේවා ආරක්ෂක නියාමනය, ගුවන් ගමන් ආරක්ෂණ නියාමනය සහ ආයතනික කටයුතු සහ ආර්ථික නියාමනය යන ප්‍රධාන වැඩසටහන් හතරක් යටතේ ඊළඟ වසරේ වියදම් ලෙස දක්වා ඇත. සංශෝධිත ඇස්තමේන්තුගත පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලට සාපේක්ෂව රුපියල් මිලියන 963 ක් ලෙස ගණනය කරන ලද පුරෝකථන සංශෝධිත ආදායම මිලියන 937 කි. ඇස්තමේන්තුගත වියදම පෙර වසරේ ඇස්තමේන්තුගත වියදමට සාපේක්ෂව 57% ක අඩුවීමක් පෙන්නුම් කර ඇති අතර පෙර වසරේ ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව පුරෝකථන ආදායම 63% ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

CAASL ආදායම පෙර වසරට සාපේක්ෂව 61% කින් අඩුවී ඇත. රුපියල් මිලියන 2.504 ක් වූ සත්‍ය ආදායම රුපියල් මිලියන 985 දක්වා අඩු වී ඇති අතර, එතෙර විකුණුම් අධිභාරය සහ විදෙස් ගතවීම් බද්දේ (Embarkation Levy) සේවා ගාස්තුවෙන් උපයාගත් ආදායමෙන් ද සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි.

සමාලෝචිත වර්ෂය (2020) ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා අතිශයින් තීරණාත්මක වූවත්, අපගේ සේවකයින්ගේ සහ ක්ෂේත්‍රයේ හවුල්කරුවන්ගේ කැපවීම සහ සහයෝගය ඇතිව වසර පුරා ශ්‍රී ලංකාව තුළ අප විසින් බොහෝ වැඩකටයුතු සිදු කර ඇත.

ඉදිරි වර්ෂයේදී අපගේ පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව පෙරටත් වඩා ඉතා ඉක්මනින් ශ්‍රී ලංකාවේ වේගවත් සංවර්ධනය සහ ලෝකය සමඟ සම්බන්ධ වීම සඳහා ධනාත්මක මනසකින් අප කටයුතු කරනු ඇති බව නිසැකය. එමගින් අපේ මාතෘභූමියට ආර්ථික සමෘද්ධිය ගෙන එනු ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ සමස්ථ කාර්ය මණ්ඩලය සහ CAASL හි අධ්‍යක්ෂ මණ්ඩලය මා සමග එකට එක්ව කටයුතු කරන බවට විශ්වාස කරමි. ජය!

කපිතාන් තේමිය අබේවික්‍රම
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

CAASL හි පැතිකඩ

හැඳින්වීම

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ වර්ෂ 2002 දෙසැම්බර් මස 27 වන දින ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිහිටුවන ලදී. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය යටතේ අදාළ ගිණුම් විගණන කාර්යය සඳහා රජයේ ව්‍යවසායක් වශයෙන් සලකනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූලික කාර්යභාරය වනුයේ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ජාතික ආර්ථිකයේ වර්ධනයට දායක වන සිවිල් ගුවන්සේවා කර්මාන්තයේ නිරුපද්‍රවතාවට, සුරක්ෂිතතාවට, ක්‍රමවත්භාවයට සහ පරිසර හිතකාමීභාවයට අදාළව වඩාත් ඉහළ කාර්යසාධන මට්ටමක් ඉලක්ක කර ගනිමින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ ඇතුළත් ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ කටයුතු කරමින් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් සම්මත කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව දේශීය සිවිල් ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සාමාජිකයින් අට (08) දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් 05 දෙනෙකු පත් කරනු ලබන්නේ සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යතුමා විසිනි. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මුදල් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ නියෝජිතයකු සහ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් නිල බලයෙන් CAASL හි සාමාජිකත්වය ලබන ඉතිරි තිදෙනා වෙති. CAASL හි සභාපතිවරයා සහ උප සභාපතිවරයා පත් කරනු ලබන්නේ සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යතුමා විසිනි. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ව්‍යවස්ථානුකූලව CAASL හි ප්‍රධාන විධායක නිලධාරිවරයා ද වෙයි.

පත්කරනු ලබන සාමාජිකයින්ගේ නිල කාලය පත්කරනු ලබන දිනයේ සිට ඉදිරියට වසර තුන (03) ක් වේ.

සිවිල් ගුවන්සේවා අධිකාරිය සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යතුමාගේ සාමාන්‍ය මෙහෙයවීමට සහ පාලනයට යටත් වේ.

අංශ සහ ඒකක පිළිබඳ හැඳින්වීම

ගගන යාත්‍රාංගන සහ පහසුකම් අංශය

ගගන යාත්‍රාංගනවලට අදාළ නිරුපද්‍රවතාව සම්බන්ධ නියාමන කාර්යයන් ඉටුකිරීමේ දී සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්ට සහාය වීමේ වගකීම ගගන යාත්‍රාංගන සහ පහසුකම් අංශයට පැවරී ඇත. මීට ශ්‍රී ලංකාව තුළ පිහිටි ගගන යාත්‍රාංගන, ජලාශ යාත්‍රාංගන සහ හෙලිකොප්ටර තොටුපල ඇතුළත් වන අතර ගගන යාත්‍රාංගන සහ හෙලිකොප්ටර තොටුපොල සඳහා වන ප්‍රමිති පිළිබඳ කාර්යයන් ද ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා පහසුකම් සැපයීම ද මීට අයත් වේ.

ගුවන් සංතරණ සේවා අංශය

අන්තර්ජාතික සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් අනුගමනය කරනු ලබන අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත භාවිතයන්ට අනුකූලව කොළඹ FIR තුළ ගුවන් යාත්‍රා සේවා සැපයීම පාලනය කරන නීති රීති සම්පාදනය කිරීම ගුවන් සංතරණ සේවා අංශයේ මූලික වගකීම වන අතර ශ්‍රී ලංකාවේ ගුවන් සංතරණ සේවා සැපයුම්කරුවන් විසින් මෙම ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීම ද එහි වගකීමකි.

පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය

අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව, පුහුණු සංවිධාන සහ සිවිල් ගුවන්සේවාවට සම්බන්ධ නිරුපද්‍රවතා සංවේදී කාර්යයන් හි නිරතවන පුද්ගලයින් සහතික කිරීම සහ සෝදිසි කිරීම් සඳහා අවශ්‍ය රීති සහ කාර්යපටිපාටි විකාශනය කිරීම පිළිබඳ වගකීම පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය වෙත පැවරී ඇත.

ගුවන්යානා මෙහෙයුම් අංශය

ගුවන්යානා මෙහෙයුම්කරුවන් සහතික කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීමේ සහ අනුමත කිරීමේ ක්‍රියාවලියක් සහ අනතුරුව සිදු කරනු ලබන අඛණ්ඩ නිරුපද්‍රවතා නියාමන අධීක්ෂණයක් හරහා ශ්‍රී ලංකාව ඇතුළත අන්තරායකාරී ද්‍රව්‍ය ගුවනින් ප්‍රවාහනය කිරීම ඇතුළු වාණිජ ගුවන්සේවා කාර්යයන්හි නිරුපද්‍රවතාව අධීක්ෂණය කිරීම ගුවන්යානා මෙහෙයුම් අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා අංශය

ගුවන් යෝග්‍යතා අංශය මෙරට සිවිල් ගුවන්සේවාවේ ගුවන් යෝග්‍යතාවයට අදාළ කාර්යයන් පවත්වා ගෙන යාමට සහාය වෙයි. පුළුල් වශයෙන් සලකන විට, ගුවන් ප්‍රවාහන මෙහෙයුම්කරුවන්, අනුමත ගුවන්යානා නඩත්තු සංවිධාන සහ ගුවන්යානා සැලසුම් කිරීම/නිෂ්පාදනය/නවීකරණය/ අලුත්වැඩියාව සහ නඩත්තුව යන කාර්යයන්හි නිරත වන වෙනත් පුද්ගලයින් හෝ සංවිධාන කිසිවක් අධීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන්සේවා කර්මාන්තයෙහි නිරත වන පුද්ගලයින් පුහුණු කිරීමට අදාළ කාර්යයන්ද මීට ඇතුළත් වේ.

මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය

මෙම අංශය CAASL හි ප්‍රධාන කාර්යභාරය සඳහා වන සහායක සේවාවන් වශයෙන් ඒකාබද්ධ ශාඛාව යටතේ ක්‍රියාත්මක වෙයි. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, කාර්ය මණ්ඩලය පුහුණුව, කාර්ය මණ්ඩල වෙන්කර දීම, සේවක සංඛ්‍යාවේ තනතුරු නිර්මාණය කිරීම, සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සාමාන්‍ය පාලනය මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ.

මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය

සිවිල් ගුවන්සේවා අධිකාරියේ/රජයේ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවලට අනුකූලව සීමිත මූල්‍ය වත්කම් කාර්යක්ෂම ලෙස, ඵලදායී ලෙස සහ සකසුරුවම්න් කළමනාකරණය කිරීමත්, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ICASL විසින් පළ කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් තැබීම සහ සත්‍ය සහ සාධාරණ තත්ත්වයේ මූල්‍ය ගිණුම් ලබා දීමත් මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේය.

ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය

ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීම සම්බන්ධයෙන් වගකීම දරන සිවිල් ගුවන්සේවා අධිකාරියේ ඒකාබද්ධ ශාඛාවේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අංශයකි.

CAASL හි පැතිකඩ

ගුවන්සේවා සුරක්ෂිතතා අංශය

ශ්‍රී ලංකාව තුළ සිවිල් ගුවන්සේවා මෙහෙයුම් සිදු කිරීම සඳහා සුරක්ෂිත පරිසරයක් සහතික කිරීම සඳහා සියලුම ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා ප්‍රමිතීන් සපුරාලීම පිණිස ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම ගුවන්සේවා සුරක්ෂිතතා අංශයේ මූලික පරමාර්ථය වන්නේය.

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය සිවිල් ගුවන්සේවා සංවර්ධන කාර්යයන් සහ සිවිල් ගුවන්සේවාව ප්‍රවර්ධනයට අදාළ පර්යේෂණ කටයුතු සිදු කිරීම, CAASL සංබ්‍යාලේඛන වැඩසටහන් කළමනාකරණය, CAASL විසින් සංවිධානය කරනු ලබන විවිධ ඉසව්, භෞතික යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන්, CAASL ලේඛන/වාර්තා/ප්‍රවෘත්ති නිවේදන පළකිරීම සහ ජාත්‍යන්තර ගුවන්සේවා වැඩසටහන සඳහා කාබන් ඕෆ්සෙටින් සහ අඩු කිරීමේ යෝජනා ක්‍රමය (CORSIA) ක්‍රියාත්මක කිරීම සම්බන්ධව වගකීම දරයි.

තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන ඒකකය

CAASL හි ව්‍යාපාර සහ සේවා අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම සඳහා අවශ්‍ය වන කාර්යක්ෂම, සුරක්ෂිත විශ්වාසවන්ත සහ තිරසාර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සපයා දෙයි.

නීති සහ බලගැන්වීම් ඒකකය

CAASL හි නීති සහ බලගැන්වීම් කාර්යයන්ට අදාළ කටයුතු මනාව සංවිධානය කිරීම නීති සහ බලගැන්වීම් ඒකකයේ ප්‍රධාන අරමුණයි.

තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය

තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ CAASL හි අවදානම් කළමනාකරණ, පාලන සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට ස්වාධීනව සහතික කිරීම සහ තත්ත්ව අවශ්‍යතා සම්පූර්ණ කෙරෙන බවට සහතික වීමත්ය.

ගුවන්සේවා නිරුපද්‍රතතා අධීක්ෂණ ඒකකය

ගුවන්යානා අනතුරු හා සිද්ධි විමර්ශන සම්බන්ධයෙන් රජයේ වගකීම් සහතික කිරීම සහ අනුපිළිවෙලින් ICAO ඇමුණුම 13 සහ ඇමුණුම 19 හි අඩංගු ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්වලට අනුකූලව රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන් (SSPs) ක්‍රියාත්මක කිරීම ගුවන්සේවා නිරුපද්‍රතතා අධීක්ෂණ ඒකකය සතු වගකීමකි. ICAO ඇමුණුම 13 යටතේ ගුවන්යානා අනතුරු සහ සිද්ධි විමර්ශනය යටතේ පරිපාලන කටයුතු සිදු කිරීම ඒකකයේ ප්‍රධාන කාර්යයන් වේ. රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන් (SSPs) ක්‍රියාවට නැංවීමේදී, මෙහෙයුම් නිරුපද්‍රතතා අවදානම් අඛණ්ඩව අඩු කිරීම, නිරුපද්‍රතතා අධීක්ෂණ පද්ධතියක තීරණාත්මක අංග අටක් ක්‍රියාත්මක කිරීම සහ ඵලදායී රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන් (SSPs) පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම වැනි නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ICAO ඇමුණුම 19 යටතේ නිරුපද්‍රතතා කාර්යයන් කළමනාකරණය කිරීමට මෙම ඒකකය සහාය ලබා දෙයි.

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සංවර්ධන සහ මාධ්‍ය ඒකකය

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සංවර්ධන සහ මාධ්‍ය ඒකකය සාමාන්‍ය ජනතාව අතර, විශේෂයෙන් තරුණ පරම්පරාව අතර ගුවන්සේවා දැනුම වැඩි දියුණු කිරීම, වර්තමාන සහ විශ්වාසදායක ගුවන්සේවා සම්බන්ධ පුවත් සමඟ ප්‍රජාව යාවත්කාලීන කිරීම සහ විද්‍යුත්, මුද්‍රිත මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා CAASL ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ ගුවන් සංස්කෘතියක් නිර්මාණය කිරීමේ වගකීම දරයි.

ගුවන් වෛද්‍ය සේවා ඒකකය

මෙම ඒකකය CAASL බලපත්‍රලාභීන්ගේ වෛද්‍ය ඇගයීම් සඳහා පහසුකම් සපයනවා පමණක් නොව, එය අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍ර වන ගුවන් වෛද්‍ය පුහුණුව, පර්යේෂණ, කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර ගුවන් වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම, ඇතුළත් වීමේ ස්ථානවල මහජන සෞඛ්‍ය සේවා, නිරීක්ෂණ ක්‍රියාකාරකම්, CAASL හි අනෙකුත් අංශ සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම් සහ CAASL සේවාදායකයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ සුබසාධනය සහතික කිරීම යනාදිය ඇතුළත් විශාල ක්ෂේත්‍රයකි. තවද, ගුවන් වෛද්‍ය සේවා ඒකකය රජයට සහ ගුවන්සේවා කර්මාන්තයට අභ්‍යවකාශ ආරක්ෂණ විසඳුම් සහ මහජන සෞඛ්‍ය ආරක්ෂණ විසඳුම් අඛණ්ඩව සපයයි. ගුවන් වෛද්‍ය සේවා ඒකකයේ සේවාවන් ගුවන් ආරක්ෂාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන ඇත.

CAASL හි පැතිකඩ

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සාමාජිකයින්

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි (CAASL) 13 වන අධ්‍යක්ෂ මණ්ඩලය

අනුක්‍රමික අංකය	නම	තනතුර
01.	උපුල් ධර්මදාස මහතා	සභාපති
02.	අමිත විජයසූරිය මහතා	උප සභාපති
03.	නිහාල් ජයවර්ධන මහතා	CAASL හි සාමාජික
04.	ඩබ්ලිව්.එම්.එස්. චමින්ද වෙලේගම මහතා	CAASL හි සාමාජික
05.	සරල චින්තක කරුණාරත්න මහතා 2020 ජූනි 26 දක්වා	CAASL හි සාමාජික
හොබවන තනතුර හේතුවෙන් මණ්ඩල සාමාජිකත්වය දරන		
06.	(විශ්‍රාමික) මේජර් ජෙනරාල් පී.ඩී.එච්. කමල් ගුණරත්න	නිල බලයෙන් පත් වූ සාමාජික ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්
07.	පී.කේ. අයන්ති ද සිල්වා මිය	නිල බලයෙන් පත් වූ සාමාජික අමාත්‍යවරයා විසින් නම් කරන ලද මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිත (මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්)
08.	එච්.එම්.සී. නිමල්සිරි මහතා 2020 අප්‍රේල් 06 දක්වා කපිතාන් තේමිය අබේවික්‍රම 2020 අප්‍රේල් 07 සිට	නිල බලයෙන් පත් වූ සාමාජික ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී

අමාත්‍යාංශ නිරීක්ෂිකා - ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අනුක්‍රමික අංකය	නම	තනතුර
01.	අවන්ති සේනාරත්න මහත්මිය	අමාත්‍යාංශ නිරීක්ෂිකා අධ්‍යක්ෂ (ගුවන්සේවා) ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය



උපුල් ධර්මදාස මහතා
CAASL හි සභාපති



අමිත විජයසූරිය මහතා
CAASL හි උප සභාපති



කපිතාන් තේමිය අබේවික්‍රම
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී
නිල බලයෙන් පත් වූ සාමාජික



පී.කේ. අයන්ති ද සිල්වා මිය
අමාත්‍යවරයා විසින් නම් කරන ලද මුදල් විෂය භාර
අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිත
(මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ
අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්)
නිල බලයෙන් පත් වූ සාමාජික



නිහාල් ජයවර්ධන මහතා. PC
CAASL හි සාමාජික



සරල චින්තක කරුණාරත්න මහතා
CAASL හි සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩලය



(විශ්‍රාමික) මේජර් ජෙනරාල්
පී.ඩී.එච්. කමල් ගුණරත්න
ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ
අමාත්‍යාංශයේ ලේකම්
නිල බලයෙන් පත් වූ සාමාජික



ඩබ්.එම්.එස්. චමින්ද වෙලේගම මහතා
CAASL හි සාමාජික



අවන්ති සේනාරත්න මහත්මිය
අමාත්‍යාංශ නිරීක්ෂිකා,
අධ්‍යක්ෂිකා (ගුවන්සේවා)
ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂක මණ්ඩලය

CAASL හි 13 වන අධ්‍යක්ෂ මණ්ඩලය හැඳින්වීම

උපුල් ධර්මදාස මහතා
CAASL හි සභාපති

උපුල් ධර්මදාස මහතා 2020 ජනවාරි 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරියේ සභාපතිවරයා ලෙස වැඩ භාර ගන්නා ලදී.

උපුල් ධර්මදාස මහතා 1952 දී උපත ලැබූ අතර මාතර රාහුල, සිල්වෙස්ටර් සහ සාන්ත තෝමස් යන විද්‍යාලවල පාසල් අධ්‍යාපනය හැදෑරිය. 1972 දී ඔහු ලංකා හෝටල් පාසලෙන් උපාධිය ලබා සිලෝන් ඔබරෝයි හෝටලයේ සේවය කළේය. ඉන්පසු ඔහු එයාර් සිලෝන් ආයතනයට සම්බන්ධ වී UTA පුහුණුව ලබා 1974 - 1979 දක්වා එහි සේවය කර ඇත.

1979 දී ඔහු "ලංකා කල්‍යාණී" කැඩෙට් පුහුණු නෞකාවේ මුදල් භාරකරු (Purser) ලෙස යාත්‍රා කළ අතර 1980 දක්වා සේවයේ නියුක්ත විය.

තවද, 1980 දී උපුල් ධර්මදාස මහතා වික්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ලොස් ඇන්ජලීස් වෙත සංක්‍රමණය වී ආහාර හා පෝෂණය පිළිබඳ උපාධියක් සම්පූර්ණ කළේය. මීට අමතරව, 1982 සිට 1987 දක්වා ඔහු කැලිෆෝනියා ප්‍රාන්තයේ ඉහළ පෙළ රෝහල්වල පෝෂණවේදියෙකු ලෙස සේවය කර ඇත.

1984 දී ඔහු ඇමරිකාවේ Upul Travels Services ආයතනය දියත් කරමින් අර්ධකාලීන සංචාරක ව්‍යාපාරයක් ආරම්භ කළේය. 1989 දී ඔහු 'Institute of Certificate travel Agent of Massachusetts' වෙතින් සංචාරක කර්මාන්තයේ ඉහළම ශ්‍රේණිගත සහතිකය ලබා ගත්තේය. සංචාරක කර්මාන්තයේ උපදේශකයෙකු ලෙස, CTC (Certified Travel Consultant) නමින් විශේෂිත ප්‍රමිතියක් ද ඔහුට පිරිනමන ලදී. ඔහු 1999 දී ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් හි ප්‍රධාන අලෙවි නියෝජිතයෙක් බවට ද පත් විය.

ඔහු ප්‍රවේශපත්‍ර සහ සංචාරක ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අඛණ්ඩ විශේෂඥ පුහුණුවක් ලබා ඇත. මීට අමතරව, ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ 'Upperclass Travel Inc' නමින් සමාගමක් පිහිටුවමින් සංචාරක වෘත්තිකයන් 150,000 කට අධික පිරිසකට සේවා සපයන අතර පළමු / ව්‍යාපාරික පන්තියේ ගමන් සඳහා වට්ටම් ලබා දුන්නේය. ඔහු 2006 දී මුළු කැලිෆෝනියා සහ නෙවාඩා ප්‍රාන්තයටම සුඛෝපභෝගී වාහන සේවා සපයන ලොස් ඇන්ජලීස් හි ඉහළ පන්තියේ ලිමොසින් සේවාවක් නිර්මාණය කළේය. එසේම, ඔහු 2009 දී ලොස් ඇන්ජලීස් හි ශ්‍රී ලංකා ලිමොසින් සංගමයේ සභාපතිවරයෙකු ලෙස පත් කරන ලදී. ඔහු 2011 දී කැලිෆෝනියාවේ ලොස් ඇන්ජලීස් හි UEI Inc. මූල්‍ය ආයතනය නිර්මාණය කළ අතර 2014 දී Utravel.com ජාත්‍යන්තර සංචාරක වෙන්කිරීමේ (Booking) සේවාව සංවර්ධනය කළේය.

ඔහු ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් පිරිනමන ලද 2006 සුවිශේෂී ජයග්‍රාහක සම්මානයේ ජයග්‍රාහකයා විය. 2017 දී ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා/ඇමරිකා සංස්කෘතික සංවිධානය විසින් පිරිනමන ලද ශ්‍රී ඇමරිකා සම්මානයේ ජයග්‍රාහකයා ද වේ.

1984 සිට 2020 දක්වා කාලය තුළ ශ්‍රී ලංකන් ගුවන් සේවයට උතුරු ඇමරිකාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200කට අධික ප්‍රමාණයක් සමග වැඩිම ආදායමක් ගෙන ඒමට උපුල් ධර්මදාස මහතා මූලික විය.

අමිත විජයසූරිය මහතා
CAASL හි උප සභාපති

අමිත විජයසූරිය 1981 දී සීමාසහිත එයාර් ලංකා ගුවන් සේවයට සම්බන්ධ විය. වසර 38ක ඔහුගේ සේවා කාලය තුළ ඔහු ශ්‍රී ලංකාව සහ විදේශයන්හි ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු කිහිපයක් හොබවා ඇත.

ඔහුගේ මෙහෙයුම්වල ප්‍රධාන විශේෂත්වය වූයේ ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය, සියලුම කැබිනට් අමාත්‍යවරුන්, සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සියලුම VVIP සංචාර පිළිබඳව කටයුතු කිරීමයි. ඔහු අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ, පොලිස්පති ඇතුළු ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ගේ සියලුම විදේශ සංචාර භාරව කටයුතු කළේය. විජයසූරිය මහතාට විකුණුම් සහ අලෙවිකරණය, මහජන සම්බන්ධතා, උසස්වීම් සහ රාජ්‍ය හා මහජන කටයුතු වැනි ගුවන්සේවා අංශයේ අත්දැකීම් සම්භාරයක් ඇත. විශ්‍රාම ගැනීමෙන් පසු ඔහු ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මහජන සහ රාජ්‍ය කටයුතු පිළිබඳ උපදේශකයෙකු ලෙස නැවත පත් කරන ලදී.

කපිතාන් තේමිය අබේවික්‍රම
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී - නිල බලයෙන් පත් වූ සාමාජික

කපිතාන් තේමිය අබේවික්‍රම, ඔහුගේ ධූරය ඊට පෙර හෙබවූ එච් එම් සී නිමල්සිරි මහතා විශ්‍රාම යාමෙන් පසු 2020 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ භාර ගන්නා ලදී. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත්වීමට පෙර, කපිතාන් තේමිය කුවේට්හි ජසීරා එයාර්වේස් හි ජ්‍යෙෂ්ඨ කපිතාන්වරයෙක් ලෙස සේවය කරමින් සිටියේය.

කපිතාන් තේමිය 1990 වසරේ එයාර් ලංකා හි ගුවන්සේවා ක්ෂේත්‍රයේ කීර්තිමත් වෘත්තීය ජීවිතය ආරම්භ කළේ ලොක්හීඩ් ට්‍රයිස්ටාර් බල ඇණියේ පියාසර ඉංජිනේරුවෙකු ලෙසය. ඔහු නොබෝ කලකින්ම ට්‍රයිස්ටාර් හි පළමු පෙළ නිලධාරියෙකු බවට පත් වූ අතර පසුව එයාර්බස් බල ඇණියේ සහ එයාර්බස් A320/A330/A340 බල ඇණිවල කපිතාන් ලෙස පත් විය. ඔහු සමාගම සඳහා නම් කරන ලද පරීක්ෂක නියමුවෙකු සහ VVIP නියමුවෙකු ද විය.

2008 වසරේ සිට කිංග්ෆිෂර් එයාර්ලයින්ස් හි කපිතාන් ලෙස සේවය කළ අතර එයාර්ලයින් එයාර්බස් ඇණියේ සිවිල් ගුවන්සේවා පිළිබඳ ඉන්දියානු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම් කරන ලද පරීක්ෂක නියමුවෙකු ලෙසද සේවය කළේය. ඉන්දියානු සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නීති රීතිවලට අනුව ඔහු Kingfisher wide body fleet උපදේශක සහ නියමු පුහුණුව හඳුන්වාදීම ආරම්භ කළ අතර VVIP පියාසර කිරීමට ද වරප්‍රසාද ලද්දේය.

2011 වර්ෂයේදී ඔහු මිහින් ලංකා හි ප්‍රධාන නියමු - පුහුණු හා ප්‍රමිති ධූරයට පත් වූ අතර, එහිදී ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ නම් කරන ලද පරීක්ෂක නියමුවෙකු වූ අතර නව්‍ය කැඩෙට් නියමු ඇතුළත් කිරීම් සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දැරිය. මෙම භූමිකාවේදී ඔහුට ගුවන් සමාගම වෙනුවෙන් CAASL හි බොහෝ නියාමන අවශ්‍යතා සපුරාලීමට සිදු විය. නව ගුවන්යානා ඇතුළත් කිරීමේදී පිළිගැනීමේ පරීක්ෂණ පියාසැරි පැවැත්වීමට අමතරව, කපිතාන් තේමිය විශේෂ සහ VVIP ගුවන් ගමන් සඳහා ද සම්බන්ධ විය.

අධ්‍යක්ෂක මණ්ඩලය

ශ්‍රී ලංකාවේ සිට කපිතාන් තේමිය 2015 හි සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම් ලෙස හිමාලයා ගුවන් සේවයට බැඳෙමින් කඳුකර නේපාලයට පා තැබුවේය. එහිදී ද ඔහු නේපාලයේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ නම් කරන ලද පරීක්ෂක නියමුවෙකු ලෙස කටයුතු කළේය. නේපාල සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියාමන සහ බලපත්‍ර අවශ්‍යතා සපුරාලීම සඳහා ගුවන් නියමුවන්, තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ මැදිරි කාර්ය මණ්ඩලය සඳහා පුහුණුවීම් සම්බන්ධීකරණය කිරීමේ වගකීම ද දැරූ කණ්ඩායමේ සාමාජිකයෙකු වූ ඔහු එහි ගුවන් ක්‍රියාකරු සහතිකය ලබා ගැනීමට ප්‍රධාන වශයෙන් දායක විය. හිමාලය සඳහා නව ගුවන්යානා පිළිග ැනීමේ පරීක්ෂණ පියාසැරි පැවැත්වීමට ඔහුට නැවත වරක් බලය ලැබුණි. නේපාලයේ ගරු අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ අණදෙන නිලධාරියා කපිතාන් තේමියට විය.

Himalaya Airlines සිට ඔහු 2016 දී කුවේට් හි Wataniya Airways වෙත මාරු වූයේ කුවේට් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවශ්‍යතා අනුව සියලුම නියාමන අංශ සපුරාලමින් මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස වැඩ භාර ගැනීම සඳහා ය. ඔහු ගුවන් සමාගමට ගුවන් ක්‍රියාකරු සහතිකය ලබා ගැනීමට උපකාර කළ අතර සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන්, ඊජිප්තුව, ඉරානය, ඉරාකය, තුර්කිය, ලෙබනනය, ඉන්දියාව, නේපාලය සහ නැගෙනහිර යුරෝපීය රටවල්වල සිට අසල්වැසි රාජ්‍යයන් වෙත ගුවන් සමාගමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කළේය. Wataniya Airways සඳහා ගුවන්යානා පිළිගැනීමේ පරීක්ෂණ පියාසැරි ද කපිතාන් තේමිය විසින් සිදු කරන ලදී.

කැප්ටන් තේමිය ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් ප්‍රාථමික හා උසස් අධ්‍යාපනය ලබා ඇති අතර කැලිෆෝනියාවේ ඕක්ලන්ඩ් හි සියෙරා ගගන විද්‍යා ඇකඩමියේ පියසර පුහුණුව ලබා ඇත.

(විශ්‍රාමික) මේජර් ජෙනරාල් පී.ඩී.එච්. කමල් ගුණරත්න
ආරක්ෂක ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය
නිල බලයෙන් පත් වූ සාමාජික

ජෙනරාල් කමල් ගුණරත්න වසර 35කට වැඩි කීර්තිමත් යුධ දිවියකට හිමිකම් කියමින් ආරක්ෂක සහ සිවිල් - හමුදා සම්බන්ධීකරණය යන සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රධාන පත්වීම් රැසක් හිමිකරගෙන, 2019 නොවැම්බර් 20 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙසත්, 2020 අගෝස්තු 26 දින ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ, අභ්‍යන්තර ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙසත් වැඩ භාර ගන්නා ලදී.

(විශ්‍රාමික) ජෙනරාල් කමල් ගුණරත්න උසස් හමුදා නිලධාරියෙකු වූ අතර, දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) විසින් මෙහෙයවන ලද ත්‍රස්තවාදයේ ආරම්භයේ සිටම ඊට එරෙහිව සටන් වැදීමට ඉමහත් දායකත්වයක් ලබා දුන්නේය. ඔහු 2008 අප්‍රේල් සිට 2009 ජූලි දක්වා ජයග්‍රාහී 53 සේනාංකයේ අණදෙන නිලධාරී (GOC) වූ අතර, ඔහු 2009 මැයි 19 වන දින 30 වසරක එල්ටීටීඊ ත්‍රස්තවාදය මුළුමනින්ම තුරන් කළ සිවිවන ඊළාම් යුද්ධයේ අවසන් අදියරේ මානුෂීය මෙහෙයුමේදී තම හමුදාවන්ට අණ දුන්නේය. ඔහු 2009 සිට 2010 දක්වා වන්නි ආරක්ෂක සේනා ආඥාපති (SF W) ලෙස ද කටයුතු කර ඇත. ඔහුගේ හමුදා දිවියේ අවසාන අදියරේදී ඔහු යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී පත්වීම් දෙකක් සහකාර ජෙනරාල් සහ අණදෙන මාස්ටර් ජෙනරල් ලෙස කටයුතු කළේය.

(විශ්‍රාමික) ජෙනරාල් කමල් ගුණරත්න 2012 සිට 2015 දක්වා බ්‍රසීලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානියා ලෙස ද සේවය කර ඇත. 2016 වසරේ ක්‍රියාකාරී හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ඔහු Hayleys PLC වැනි පෞද්ගලික අංශයේ ආයතනවල ඉහළ තනතුරු හොබවා ඇත. ඔහු ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට යුද සාහිත්‍යය නව්‍යකරණය කළ කතුවරයකු වන අතර එහි රණමඟ ඔස්සේ නන්දිකඩාල්, කඩොල් ඇත්තු, උත්තරා දේවි, පාතාලයෝ සහ ගෝධාභය සිංහල සහ ඉංග්‍රීසි අනුවාද වැනි මෙරට විප්ලවීය සාහිත්‍ය ග්‍රන්ථ කිහිපයක් ප්‍රකාශයට පත් කර ඇත. තවද ඔහු පසුගිය කාලයේ සුප්‍රසිද්ධ සෙබල පුතු ගීතය වැනි නිර්මාණ කිහිපයක්ම රචනා කළ ප්‍රවීණ ගී පද රචකයෙකි.

ඔහු Balochistan විශ්ව විද්‍යාලයෙන් යුද්ධ කලාව සහ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇති අතර මදුරාසි විශ්ව විද්‍යාලයෙන් ඔහුගේ දර්ශන විශාරද උපාධිය ද ලබා ඇත. (විශ්‍රාමික) ජෙනරාල් කමල් ගුණරත්න වීර වික්‍රම විභූෂණ, රණ වික්‍රම පදක්කම, රණ ශූර පදක්කම වැනි ශූර සම්මාන කිහිපයකින් පිදුම් ලැබුවේ ඔහුගේ නිර්භීත ක්‍රියා සහ සටන් බිමේ සුවිශේෂී දක්ෂතාවන් වෙනුවෙනි. ඔහුගේ කීර්තිමත් යුධ සේවා කාලය තුළ නොකැළැල්, සුවිශේෂී සහ ආදර්ශමත් හැසිරීම සඳහා උත්තම සේවා පදක්කමත්, ක්‍රියාන්විත මෙහෙයුම් අතරතුර යෙදී සිටියදී ප්‍රහාරයකට ලක් වීම වෙනුවෙන් දේශ පුත්‍ර සම්මානයටත් හිමිකම් කීවේය. ඔහු විවාහ වී සිටින්නේ චිත්‍රානි ගුණරත්න මහත්මිය සමඟ වන අතර ඔවුන්ට දියණියක ද සිටී.

අධ්‍යක්ෂක මණ්ඩලය

පී.කේ. අයන්ති ද සිල්වා මිය
භාණ්ඩාගාර නියෝජිත,
නිල බලයෙන් පත් වූ සාමාජික

අයන්ති ද සිල්වා මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වන අතර ප්‍රතිපත්තිමය තීරණ සඳහා රජයේ ආයෝජනවල ප්‍රතිඵල වාර්තා කිරීමේ වගකීම දරයි.

අයන්ති විසින් රාජ්‍ය ආයෝජනවලින් සාමාන්‍ය ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීම සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන අධීක්ෂණය, ඇගයීම සහ අනුග්‍රහය දැක්වීම සඳහා වූ ක්‍රියාකාරී කණ්ඩායමට නායකත්වය සපයනු ලබයි.

අයන්ති 1994 දී සහකාර අධ්‍යක්ෂවරියක් ලෙස රාජ්‍ය සේවයට එක් වූ අතර සාර්ව ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික සැලසුම්කරණය, ජාතික අයවැයකරණය සහ ප්‍රතිඵල අධීක්ෂණය යන ක්ෂේත්‍රවල භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු වෙත සිය කැපී පෙනෙන සේවාව ලබා දුන්නාය. ඇයගේ වසර 27ක වෘත්තීය ජීවිතය තුළ ඇය ජාතික ජල මණ්ඩලය, ලංකා විදුලි සමාගම, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඇතුළු රාජ්‍ය ආයතන 15ක අධ්‍යක්ෂ මණ්ඩලයේ හොබවන තනතුර හේතුවෙන් මණ්ඩල සාමාජිකත්වය ලබා සිටියාය.

ඇය ආර්ථික විද්‍යාඥයන්, ඇගයුම්කරුවන්, සහ ජන විඤාශකයින් යන ශ්‍රී ලංකාවේ වෘත්තීය සංගම් 03 ක ක්‍රියාකාරී සාමාජිකාවකි.

ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ සහ ශාස්ත්‍රපති ගෞරව උපාධි ලබා ඇත. එසේම ඇය ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ඔස්ට්‍රේලියාවේ Flinders විශ්වවිද්‍යාලයෙන් මෙන්ම ජනවිකාස පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

නිහාල් ජයවර්ධන මහතා. PC
CAASL හි සාමාජික

මහනුවර ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ඔහු 1980 වසරේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් විය. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වසර 3 යි මාස 10 කින් පසු 1983 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස ඔහු ලියාපදිංචි විය. පසුව ඔහු 1984 ජූලි මාසයේදී නීතිපති දෙපාර්තමේන්තුවට බැඳුණි.

ඔහු 1990-91 අධ්‍යයන වර්ෂයේදී ලන්ඩන් යුනිවර්සිටි කොලේජ් විසින් මහජන ජාත්‍යන්තර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ප්‍රදානය කරන ලද අතර 1991 වර්ෂයේදී ඔහුද එංගලන්තයේ සහ වේල්සයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර්වරයෙකු ලෙස ලියාපදිංචි විය. ඔහු ගුවන්සේවා නීති ක්ෂේත්‍රයේ විශාල පළපුරුද්දක් දරයි. ඔහු කලක් සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවේ නීති උපදේශකවරයෙකු ලෙස කටයුතු කළ අතර සිවිල් ගුවන්සේවා අධිකාරී පනත සහ සිවිල් ගුවන්සේවා පනත කෙටුම්පත් කිරීමේදී සක්‍රීයව සහභාගී විය. ඔහු රටවල් විශාල සංඛ්‍යාවක් සමඟ ද්විපාර්ශ්වික ගුවන්සේවා ගිවිසුම් ගණනාවක සාකච්ඡාවලට සහභාගී වී ඇත. 2004 වසරේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ ඔහු 2013 ජූලි දක්වා එම තනතුරේ කටයුතු කළේය. සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත්වූ ඇති ඔහු 2019 දෙසැම්බර් මාසයේ සිට එම තනතුරේ කටයුතු කරයි.

ඔහු 1996 සිට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නීති උපදේශකයින්ගේ කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය. මෙම කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ඔහු 1996 සිට 2005 දක්වා රජය විසින් සිදු කරන ලද රජයේ ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රමුඛතම වැඩසටහන් (ජාතික ගුවන් සේවය වන එයාර් ලංකා පුද්ගලීකරණය කිරීම, කොළඹ වරායේ ඇතැම් කොටස් පෞද්ගලීකරණය, වැවිලි, රක්ෂණ සහ විදුලි සංදේශ අංශයේ රජයේ ව්‍යවසායන් පෞද්ගලීකරණය) සියල්ලටම පාහේ සහභාගී විය. 2003 අප්‍රේල් මාසයේදී ඔහු මෙම නීති උපදේශක කණ්ඩායමේ නායකයා වූ අතර 2005 මැයි මාසයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යන තෙක් ම එම තනතුරේ කටයුතු කළේය.

2002 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුවේ සංස්ථා අංශයේ සමස්ත පරිපාලනය භාරව ඔහුව පත් කරන ලදී. ඔහු රජයේ සංස්ථා 200 ක පමණ නීතිමය කටයුතු මෙහෙයවීය.

ඔහු 1993 මැයි මාසයේ සිට සමාගම් නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සහභාගී වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2007 අංක 7 දරන සමාගම් පනත බලාත්මක විය. ඔහු මුලින් ප්‍රතිසංස්කරණ අවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම සඳහා පත් කරන ලද අනු කමිටුවක ලේකම්වරයා ලෙසත්, පසුව සමාගම් නීති උපදේශන කොමිෂන් සභාවේ පර්යේෂණ සම්බන්ධීකාරක ලෙස ලොව පුරා සමාගම් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති ලෝක බැංකු උපදේශකයෙකු සමඟත් කටයුතු කළේය. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේ ඔහුගේ සැලකිය යුතු දායකත්වය අගයමින් ඔහු 1998 අගෝස්තු මාසයේදී සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර 2008 අගෝස්තු දක්වා ඔහු දිගටම එහි සේවය කළේය.

2002 සිවිල් ගුවන්සේවා අධිකාරී පනත සහ 2010 සිවිල් ගුවන්සේවා පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහ ඊට පෙර පැවති පෞරාණික නීති තන්ත්‍රය වෙනුවට හඳුන්වා දුන් නවීන සංකල්ප ප්‍රවර්ධනය කිරීමට ඔහු ක්‍රියාකාරීව සහභාගී වී ඇත.

ඔහු 2005 මැයි මාසයේදී නැවත පුද්ගලික නීතිඥ මණ්ඩලයට පැමිණියේය.

ඔහු 1997 වර්ෂයේ සිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ වාණිජ නීති පරීක්ෂකවරයෙකු ලෙස සේවය කරන අතර ශ්‍රී ලංකා නීති අධ්‍යාපන කවුන්සිලයේ උසස් නීති අධ්‍යයන ආයතනයේ ආයතනික නීතිය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ද වේ.

ඔහු සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව, සිවිල් ගුවන්සේවා අධිකාරිය, නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ නීති උපදේශකවරයෙකු ලෙස කටයුතු කළේය.

අධ්‍යක්ෂක මණ්ඩලය

2004 සිට 2015 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේ හිමිකාරිත්වය දරන හෝටල් සංවර්ධකයන්ගේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර, සීමාසහිත මිල්කෝ සමාගමේ, ශ්‍රී ලංකා ලිබියාවේ කෘෂිකාර්මික හා පශු සම්පත් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු සහ සීමාසහිත ලංකා සතොස සමාගමේ අධ්‍යක්ෂ සහ ආරම්භක සභාපතිවරයා ද විය.

ගුවන්සේවා නීතිය, රාජ්‍ය නීති සංස්ථාපිත සහ වාණිජ නීතිය යන ක්ෂේත්‍රවල කීර්තිමත් නීතීඥවරයකු ලෙස ඔහු නීති වෘත්තියට කළ දායකත්වය අගයමින් 2012 වසරේ ජනාධිපති නීතිඥවරයා ලෙස පත් කරන ලදී.

ඔහු නැවතත් 2019 දෙසැම්බර් මාසයේදී සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

ඔහු මෑතකදී සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කර ඇත.

සරල චින්තක කරුණාරත්න මහතා
CAASL හි සාමාජික

කොළඹ 7 රාජකීය විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇති ඔහු 1992 වසරේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වූ අතර 1996 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු ලෙස ලියාපදිංචි විය.

1996 වසරේ සිට ඔහු මිනුවන්ගොඩ අධිකරණ බල ප්‍රදේශයේ කීර්තිමත් අපරාධ නීතීඥවරයෙකු ලෙස කටයුතු කරයි. ඔහු 2017 වසරේ සිට ගම්පහ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නීතිඥ සංගමයේ තේරී පත් වූ පළමු සභාපතිවරයා වේ. එමෙන්ම ඔහු මිනුවන්ගෙ ාඩ නීතීඥ සංගමයේ සභාපතිවරයා ලෙසද කිහිප වරක් කටයුතු කර තිබේ.

තවද, ඔහු මිනුවන්ගොඩ අධිකරණ බල ප්‍රදේශයේ වැඩබලන මහේස්ත්‍රාත්වරයෙකු සහ වැඩබලන දිසා විනිසුරුවරයෙකි.

ඩබ්.එම්.එස්. චමින්ද වෙලේගම මහතා
CAASL හි සාමාජික

වෙලේගම මහතා ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ 1989 අභ්‍යාසලාභී සහකාර අධිකාරීවරයෙකු ලෙස තම වෘත්තීය දිවිය ආරම්භ කළ අතර තලවාකැලේ තේ පර්යේෂණ මණ්ඩලයේ සහ ලුණුවිල පොල් පර්යේෂණ මණ්ඩලය යටතේ පුහුණුව ලබා ඇත. ඔහු වසර 32ක කාලයක් වැවිලි කර්මාන්ත රාජ්‍යයේ සහ පෞද්ගලික අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සේවය කර ඇත. ඔහු 2011-2015 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර දැනට Dereniyagala plantions pvt ltd හි සභාපතිවරයා ලෙසත්, Cimbalanka Holdings Pvt Ltd හි ඒකාබද්ධ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසත්, බනිජ තෙල් නිෂ්පාදන වෙළඳාමේ නියැලී සිටින අතර, මැලේසියාවේ Hyrax හි රටේ අධ්‍යක්ෂවරයා ලෙසත්, මෝටර් රථ, නෞකා සහ ලිහිසි තෙල් නිෂ්පාදන සමාගමක් වන DN Bhd සමාගම සහ British Ceylon සහයෝගිතාවේ සභාපතිවරයා ලෙසත් කටයුතු කරයි. ජපානයේ විදේශීය තාක්ෂණික ශිෂ්‍යත්ව සංගමය (AOTS) යටතේ PIPF වැඩසටහනේ පුහුණුව සාර්ථකව නිම කරන ලද ඔහු 2003 දී ඉන්දියානු කළමනාකරණ සහ තාක්ෂණ ආයතනයේ මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව සම්පූර්ණ කරන ලදී.

අවන්ති සේනාරත්න මහත්මිය
අමාත්‍යාංශ නිරීක්ෂිකා
අධ්‍යක්ෂිකා (ගුවන්සේවා)
ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අවන්ති සේනාරත්න මහත්මිය ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂිකා (ගුවන්සේවා) තනතුර හොබවයි.

ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරිනියක වන අතර වසර 17 ක පළපුරුද්දක් සහිත ඇය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ප්‍රධාන තනතුරු රාශියක් දරමින් අප දිවයින වෙනුවෙන් කැපී පෙනෙන සේවාවක් ඉටු කර තිබේ.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති අතර මැලේසියාවේ University Sains වෙතින් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් සම්පූර්ණ කළාය. ඊට අමතරව, ඇය ජාතික අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ඇත.

අවන්ති මහත්මිය 2018 වසරේ සිට බොහෝ වැදගත් සංවර්ධන වැඩසටහන් මගින් සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට සිය වටිනා අත්දැකීම් සහ දැනුම ලබා දී ඇත. රාජ්‍ය නියෝජිත කණ්ඩායමේ සාමාජිකාවක් වශයෙන් ඇය ප්‍රධාන සිවිල් ගුවන්සේවා සම්මන්ත්‍රණ කිහිපයකට සහභාගී වී ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

ආකල්පය

අපට ඉහළින් ඇති ගුවන් අවකාශය දිවයිනේ සහ ජාතියේ මතු පරම්පරාවේ ප්‍රගමනය සහ සෞභාග්‍යය උදෙසා කළමනාකරණය කළ යුතු සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අතිමහත් විභවයක් සහිත පොදු වස්තුවකි.

අරමුණු

- නිරුපද්‍රතතා සහ සුරක්ෂිතතා
- ප්‍රතිඵල ඉලක්ක සාධනය කර ගැනීම හෝ ඉක්මවා යාම
- අවශ්‍ය සම්පත් ලබාගැනීම වෘත්තීයභාවයට සහ නිපුණත්වයට පත්වීම
- පෘථුල විශ්වාසය සහ පිළිගැනීම දිනාගැනීම එහි සාධකයන් පවත්වාගෙන යාම හෝ වර්ධනය කර ගැනීම
- භාරගන්නා සෑම කාර්යකදීම ඉහළ මට්ටමේ ඵලදායීතාවක් අත්කර ගැනීම
- ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමග විශිෂ්ඨ අනුකූලතා මට්ටමක් පවත්වා ගැනීම සහ
- සිවිල් ගුවන්සේවා සැලසුම් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා ශක්තිමත් සුහසාධකයකු බවට පත්වීම.

උපාය මාර්ග

- අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමග අනුගත වෙමින් ව්‍යවස්ථාපිත කාර්යයන් වඩාත් හොඳින් සහ යථායෝග්‍ය ලෙස ක්‍රියාත්මක කිරීම සහ සමාජ වගකීම් ඉටු කිරීම.
- සැලකිය යුතු ගුවන්සේවා ගැටළු සඳහා විසඳුම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම
- විශේෂිත වූ පිළිවෙත් වෙනස් කිරීමේ නව ප්‍රවේශ හඳුන්වාදීම
- ගුවන්සේවා කර්මාන්තය සමග සහයෝගයෙන් සහ හවුලේ කටයුතු කිරීම
- විනිවිදභාවයෙන් සහ සංගත භාවයෙන් යුක්තව කටයුතු කිරීම සහ ඵලදායි අභ්‍යන්තර සහ බාහිර සංදේශනයක් පැවැත්වීම
- සියළුම ලිපිලේඛණ, ද්‍රව්‍ය සහ අභ්‍යන්තර කාර්යපටිපාටිවල ප්‍රබලතරභාවය සහ යථායෝග්‍යතාව පවත්වාගෙන යාම

සාරධර්ම

අධිකාරිය සහ එහි කාර්ය මණ්ඩලය

- ගුවන්සේවා නිරුපද්‍රතතාවට ඉහළින්ම ප්‍රමුඛත්වය සහ වැදගත්කම ලබා දෙමින් නිරුපද්‍රතතා පිළිවෙත් කෙරෙහි අනුග්‍රහය දක්වනු ඇත
- සේවාලාභීන්ට සපයනු ලබන සේවාවන්හි දී විශිෂ්ටයන් වනු ඇත
- භාරගන්නා සියළුම කාර්යන්හි දී 'කළ හැකිය' යන ආකල්පයෙන් කටයුතු කරනු ඇත
- විශ්වාසවන්ත, යථාර්තවාදී සහ යථායෝග්‍ය පුද්ගලයින් බවට පත්වීම අරමුණු කරනු ඇත
- අඛණ්ඩ වර්ධනය සොයා යාමේදී වෙනස් වීමට කැමැත්තක් හා හැකියාවක් ඇති කර ගනු ඇත
- සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා එක්ව වැඩ කරනු ඇත
- විවෘතව, අවංකව හා විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කරනු ඇත
- සෑම කටයුත්තකදීම කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ ක්‍රමවත්බව ප්‍රවර්ධනය කරනු ඇත
- සගයින්ට ගරු කිරීමෙන් සහ ඔවුන් විශ්වාස කිරීමෙන් කණ්ඩායමක් ලෙස කටයුතු කරනු ඇත
- සියළුදෙනාගේ දායකත්වය අගය කරනු ඇත
- සමාජ වගකීම් හා බැඳීම් හඳුනාගනු ඇත
- කරනු ලබන කාර්යන්ගෙන් සතුට ලබනු ඇත
- වෘත්තීමය ප්‍රවේශය පිළිබඳ ආඩම්බර වනු ඇත
- රාජකාරී පරිසරයත් ගෘහ ජීවිත පරිසරයත් තුළනය කර ගනු ඇත

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ආසන්න ඉලක්ක

- වාණිජ ගුවන්සේවා අංශයෙහි මාරක අනතුරු වැළැක්වීම
- ගුවන්යානා පැහැර ගැනීම් සහ සිවිල් ගුවන්සේවා කාර්යයන්හි නීතිවිරෝධී ලෙස මැදිහත්වීම් වැළැක්වීම
- පොදු ගුවන්සේවා අනතුරු වැළැක්වීම
- ගුවන්තොටුපල තුළ භූමිය මත සිදුවන මාරක අනතුරු වැළැක්වීම
- ඉංජිනේරු/නඩත්තු වැඩපල තුළ සිදුවන අනතුරු අඩු කිරීම
- ගුවන්සේවා සිදුවීම් අවම කිරීම
- 'නියමිත වේලාවට' පිටත්වීම්වල ප්‍රමාදයන් අවම කිරීමට සහාය වීම
- ගුවන් ගමන් වල සේවාවේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම දිරිමත් කිරීම
- ආරක්ෂක අවශ්‍යතා ගැන සැලකිලිමත් වන අතරම, ගුවන් තොටුපලවල තදබදය අවම කිරීමට සහ මගී පිරිසැකසුම් කඩිනම් කිරීම
- ගුවන් ප්‍රවාහනයේ මෙහෙයුම් පිරිවැය අවම කිරීම සහ අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා උපකාර කිරීම
- පරිසරයට ගුවන් ගමන් වල අහිතකර බලපෑම් අවම කිරීමට උපකාර කිරීම
- සිවිල් ගුවන් සේවයේ විභව ප්‍රතිලාභ පිළිබඳව පාසල් දරුවන් දැනුවත් කිරීම, සහ
- මීළඟ පරම්පරාව උදෙසා ගුවන් සේවා වෘත්තිකයන් හැඩගැන්වීම

අපේක්ෂිත ප්‍රතිඵල

- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළව රාජ්‍යය මත පැවරී ඇති ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ ඉතා ඉහළ මට්ටමක් වාර්තා කරමින් එකී ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් නිරතුරුව ක්‍රියත්මක කිරීම සහ බලාත්මක කිරීම
- සම්බාධක/සීමාකිරීම් රහිත ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා පද්ධතිය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වීම සහ රාජ්‍යයේ ගුවන්සේවා පද්ධතියට එරෙහිව ICAO විසින් බරපතල නිරුපද්‍රතතා ප්‍රතිදාන මතුකිරීම් වැළැක්වීම
- සිවිල් ගුවන්සේවාවෙහි නිරුපද්‍රතතාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව සහ ක්‍රමවත්භාවය වර්ධනය වීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් ප්‍රවාහන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඇතිවීම
- පාරිභෝගික තෘප්තිය වැඩි වීම
- අධිකාරියේ මූල්‍ය කාර්ය සාධනය වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

ප්‍රතිදානය

ප්‍රතිදාන වර්ගය	ප්‍රතිදානය
ප්‍රතිපත්තිමය උපදෙස්	• රජයට සහ වෙනත් සංවිධානවලට උපදෙස් දීම
	• ව්‍යවස්ථා සංශෝධන
	• රීති විකාශනය
	• ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය සහ පළ කිරීම
	• ගුවන්සේවා ප්‍රතිපත්ති විකාශනය කිරීම
	• කාර්යපටිපාටි සංග්‍රහ විකාශනය
	• ගුවන්සේවා යටිතල පහසුකම් පිළිබඳ මහා සැලැස්ම සකස් කිරීම
නිරුපද්‍රතතා තක්සේරුව සහ සහතික කිරීම	• පහත දෑ වල අවදානම් කළමනාකරණය
	• ගුවන්තොටුපල/ගුවන් පිටිය අංශයෙහි නිරුපද්‍රතතාව
	• ගුවන් ප්‍රවාහන අංශයෙහි නිරුපද්‍රතතාව පොදුවේ ගුවන්සේවා අංශයෙහි නිරුපද්‍රතතාව
	• පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිරුපද්‍රතතාව
	• පියාසර පුහුණු නිරුපද්‍රතතාව
	• ගුවන්යානා නඩත්තු නිරුපද්‍රතතාව
	• ගුවන්සේවා අංශයේ නිරුපද්‍රතතා අවදානම
නිරුපද්‍රතතාව විශ්ලේෂණය, තොරතුරු සහ ප්‍රවර්ධනය	• නිරුපද්‍රතතාව විමර්ශනය
	• නිරුපද්‍රතතාව විශ්ලේෂණය
	• නිරුපද්‍රතතා තොරතුරු, අධ්‍යාපනය සහ ප්‍රවර්ධනය
	• ගුවන්යානා අනතුරු සිදුවීම් විමර්ශනය සහ නිරුපද්‍රතතා නිර්දේශ ක්‍රියාත්මක කිරීම
බලය පැවරීම	• ගුවන් ප්‍රවාහන සමාගම් උපලේඛණ අනුමත කිරීම
	• ගුවන් ගමන් ගාස්තු අනුමත කිරීම
	• සංචාරක නියෝජිතයින් සහතික කිරීම
	• ගුවන්යානා ලියාපදිංචි කිරීම
	• ගුවන්යානා අමතර කොටස් ආනයනය සඳහා බලය පැවරීම
	• උස ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බලය පැවරීම
	• පොදු වෙළඳ නියෝජිතයින් සඳහා බලය පැවරීම
	• ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් නම් කිරීම
සුරක්ෂිතතා තක්සේරුව	• සිවිල් ගුවන්සේවා අංශයෙහි සුරක්ෂිතතා අවදානම්
බලාත්මක කිරීම	• නියාමන කඩකිරීම් කෙරෙහි දක්වන ප්‍රතිචාර
	• මහජන සෞඛ්‍යය සහ සනීපාරක්ෂක අවශ්‍යතා බලාත්මක කිරීම
රජයට සහාය දැක්වීම	• ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් අපගමන බදු අයකර ගැනීම

නියාමන විෂය ක්ෂේත්‍රය

2020 වර්ෂය අවසානය වන විට සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියාමන විෂය ක්ෂේත්‍රය පහත සඳහන් පරිදි වේ.

නියාමන ක්ෂේත්‍රය	2020	2019	වෙනස (%)
ගුවන් තොටුපල			
දේශීය භූමි ගුවන් තොටුපල	**11**	11	0
දේශීය ජලාශ ගගන යාත්‍රාංගන	**11**	11	0
ජාත්‍යන්තර ගුවන් තොටුපල	**3**	3	0
ගුවන් ප්‍රවාහන සමාගම්			
අභ්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවාවන්හි නිරත වන දේශීය ගුවන් ප්‍රවාහන සමාගම්	**7**	10	-30
ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවාවන්හි නිරත වන දේශීය ගුවන් ප්‍රවාහන සමාගම්	**2**	2	0
ජාත්‍යන්තර විදේශ ගුවන් ප්‍රවාහන සමාගම්	**39**	43	-9
පුහුණු සංවිධාන			
පියාසර පාසල්	**8**	8	0
වර්ග ප්‍රමාණන පුහුණු සංවිධාන	**3**	3	0
ඉංජිනේරු/නඩත්තු පාසල්	**4**	4	0
සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථාන	**1**	1	0
ගුවන් සංතරණය			
ගුවන් සංතරණ සේවා සැපයුම්කරුවන්	**1**	1	0
ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතාව			
විශාල ගුවන්යානා (උපරිම ඉගුලුම් බර කි.ග්‍රෑ. 5,700 සහ ඊට වැඩි)	**29**	29	0
කුඩා ගුවන්යානා (උපරිම ඉගුලුම් බර කි.ග්‍රෑ. 5,700 ට අඩු)			
සැහැල්ලු ගුවන්යානා	**42**	42	0
අති සැහැල්ලු ගුවන්යානා	**2**	2	0
හෙලිකොප්ටර්	**9**	9	0
උණු වා බැලූන	**6**	6	0
කෘත්‍රිම පුහුණු උපක්‍රමික/පියාසර පුහුණු උපක්‍රමික			
දේශීය පූර්ණ පියාසර අනුකාරක – A 320/A 330/ Integrated Panel Trainer	**3**	3	0
ගුවන් ගමන් පාලන අනුකාරක	**1**	1	0

නියාමන විෂය ක්ෂේත්‍රය

නියාමන ක්ෂේත්‍රය	2020	2019	වෙනස (%)
පුද්ගල බලපත්‍ර			
ආධුනික ගුවන් නියමු බලපත්‍රධාරීන්	**114**	260	-56
පෞද්ගලික ගුවන් නියමු බලපත්‍රධාරීන්	**87**	146	-40
වාණිජ ගුවන් නියමු බලපත්‍රධාරීන්	**176**	321	-45
ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍රධාරීන්	**295**	400	-26
ගුවන් ගමන් පාලක බලපත්‍රධාරීන්	**49**	68	-28
ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රධාරීන්	**1**	2	-50
ගුවන්යානා නඩත්තු බලපත්‍රධාරීන්	**144**	392	-63
පියාසර පිටත්කරන්නා/පියාසර මෙහෙයුම් නිලධාරී බලපත්‍රධාරීන් ගගන නාවික ස්ථාන මෙහෙයුම් බලපත්‍රධාරීන්	**0**	3	-100
මැදිරි පිරිස් සාමාජික සහතික දරන්නන්	**96**	245	-61
පියාසර උපදේශකවරුන්	**1**	1	0
සහකාර පියාසර උපදේශකවරුන්	**3**	9	-67
භූමි උපදේශක බලපත්‍රධාරීන්	**6**	17	-65
පියාසර පරීක්ෂකවරුන්	**6**	6	0
නම්කරන ලද පිරික්සුම් නියමුවන්	**20**	21	-5
සිවිල් ගුවන්සේවා වෛද්‍ය පරීක්ෂකවරුන්/වෛද්‍ය තක්සේරුකරුවන්	**6**	6	0
සහතික කරන ලද ගුවන්සේවා නිවාරකයින්	**452**	806	-56
සහතික කරන ලද ගුවන්සේවා සුරක්ෂිතතා උපදේශකවරුන්	**13**	7	-71
සහතික කරන ලද ගුවන්සේවා සුරක්ෂිතතා කළමනාකරුවන්	**2**	22	-41
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්			
ගෝලීය බෙදාහැරීමේ සේවා සැපයුම්කරුවන්	**4**	4	0
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රධාරීන්	**348**	539	-35
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - ඒ කාණ්ඩය	**329**	448	-27
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - බී කාණ්ඩය	**19**	91	-79
පොදු වෙළඳ නියෝජිතයන්	**24**	24	0

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

අධිකාරියෙහි කාර්යභාරය

අධිකාරියෙහි ප්‍රධාන කාර්යයභාරයට අයත් කාර්යයන් අතර පහත සඳහන් දෑ ප්‍රමුඛත්වයක් ගනී.

- රටේ සිවිල් ගුවන්සේවා අංශය සැලසුම් කිරීමේ දී, ගරු අමාත්‍යතුමන්ගේ සහ රාජ්‍ය අංශයේ හවුල්කරුවන්ගේ අදහස් පිළිබිඹු වන බවට සහතිකවීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම.
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක පිළිබිඹුවීම සහ CAASL හි අරමුණු ඉටුකර ගැනීමට සම්බන්ධ සංවිධානයේ කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ අදාළ වන පරිදි සිවිල් ගුවන්සේවා අංශයෙහි රජයේ අරමුණු පිළිබිඹු වන පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ඒකාබද්ධ සැලැස්ම යාවත්කාලීන කිරීම
- නිල බලයෙන් CAASL හි ප්‍රධාන විධායක නිලධාරිවරයා ද වන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිශ්චිත අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වගකීම පවරා දීම.
- CAASL හි කාර්යයන් සහ රාජකාරී ඉටු කළ හැකිවන පරිදි සුදුසුකම් සහ නිපුණතා සහිත සේවකයින් සේවයට බඳවා ගැනීම සහ ඔවුන්ගේ චේතන ඇතුළු සේවා කොන්දේසි නිශ්චය කිරීම
- CAASL හි ඒකාබද්ධ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ඇති සැලසුම් සහ එම කාර්යයේ ප්‍රමිතිය පිළිබඳ ගරු අමාත්‍යතුමන්ට වගවීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී පනත යටතේ එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයින් පත් කළේය.

සභාපති ලෙස උපුල් ධර්මදාස මහතා සහ උප සභාපති ලෙස අමිත විජයසූරිය මහතා පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලනය

සිවිල් ගුවන්සේවාවට අදාළ ප්‍රතිපත්ති පිළිබඳ කරුණුවල දී පුළුල් පරාසයක අදහස් සහ මත උපයෝගී කර ගැනීමට හැකි වන පරිදි අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සැදුම් ලබන්නේ ව්‍යාපාරික, පරිපාලන, නෛතික, මූල්‍ය සහ ගුවන්සේවා කර්මාන්ත ක්ෂේත්‍රවල විවිධ නිපුණතා සහ අත්දැකීම් සහිත සාමාජිකයින්ගෙනි.

අධිකාරියට පත්කරනු ලැබීමෙන් පසු එම සාමාජිකයින් සියළුදෙනා ගුවන්සේවා අධිකාරියෙහි පරම යහපත උදෙසා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අධිකාරිය විසින් ගනු ලබන සියළු තීරණ පිළ යුතු බවත් තනි සාමාජිකයින්ට අධිකාරියෙන් බාහිර වී හුදෙකලා පාලන කාර්යභාරයක් නොමැති බවත් සියළුම සාමාජිකයින් පිළිගත යුතුය.

ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි පිහිටුවීම හරහා CAASL හි අරමුණු ඉටුකර ගැනීම පිණිස ප්‍රධාන විධායක නිලධාරිවරයාට බලතල සහ කාර්යයන් පවරා දෙමින් අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරියා මෙහෙයවනු ලබයි. අධිකාරියෙහි ඉදිරි සැලසුම් එහි තුන් අවුරුදු ඒකාබද්ධ සැලැස්මේ ඇතුළත් කර ඇති අතර සෑම වසරකම ආරම්භයේ අධිකාරිය විසින් අනුමත කරනු ලබන එහි වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන, පුහුණු වැඩසටහන, ප්‍රසම්පාදන වැඩසටහන, වැඩසටහන් අයවැය සහ විගණන වැඩසටහන හරහා ඵලදායී ලෙස අධීක්ෂණය කරනු ලැබේ. දැනට නිශ්චිත විධිවිධාන යොදා නැති සියළුම කරුණු සම්බන්ධව අධිකාරිය විසි අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයන් මගින් ප්‍රධාන විධායක නිලධාරිවරයාට නියෝග නිකුත් කරනු ලබන අතර එවැනි නියෝග අනුව කටයුතු කිරීම ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ වගකීම වන්නේය.

අධිකාරියෙහි විධායක බලතල

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී පනතේ විධිවිධාන අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂවරයා පත් කරනු ලබන අතර ඔහු ව්‍යවස්ථානුකූලව සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා ද විය යුතුය.

ඔහු අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන සේවා නියමයන් සහ කොන්දේසිවලට යටත් විය යුතු අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී පනත යටතේ හෝ වෙනත් කිසියම් අදාළ නීතියක් යටතේ හෝ ඔහුට පැවරෙන රාජකාරී සහ කාර්යයන් ඉටු කළ යුතුය. අධිකාරියේ කාර්යයන් සම්බන්ධ සාමාන්‍ය පරිපාලනය ද ඔහුට ම පැවරේ. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරෙන ව්‍යවස්ථාපිත කාර්යයයන් ඉටුකිරීමේ දී ඔහුට අනුමත කරන ලද කාර්යපටිපාටි සහ නිර්ණායකයන් ඇතුළත් CAASL හි සම්පත් භාවිත කළ හැකිය.

අධිකාරියෙහි කමිටු

නිශ්චිත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය විසින් කාර්ය මණ්ඩල කමිටුව සහ විගණන කළමනාකරණ කමිටුව වශයෙන් හඳුන්වනු ලබන ස්ථාවර කමිටු දෙක (02) ක් පිහිටුවනු ලැබ ඇත. අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම් වශයෙන් ලබන ප්‍රගතිය පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීමටත්, ඒ මගින් නියමිත ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් අවශ්‍ය බලතල එකිනෙක කමිටුව වෙත පවරා දෙනු ලැබ ඇත. මෙම කමිටු කිසිවකට පවරා දී ඇති බලතල හා කාර්යයන් පිළිබඳ තැකීමකින් තොරව අවශ්‍යයි අදහස් කරන ඕනෑම අවස්ථාවක අවශ්‍යයයි අදහස් කරන කිසියම් කරුණක් සම්බන්ධව හෝ එවැනි කරුණු සියල්ල සම්බන්ධව හෝ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලතල නොකඩවා ක්‍රියාත්මක කළ හැකිවේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

කාර්ය මණ්ඩල කමිටුව

කාර්ය මණ්ඩල කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.

- සංවිධාන ව්‍යුහයක් සම්මත කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි සහ අවශ්‍ය ආකාරයට එය සංශෝධනය කිරීම.
- සේවක සංඛ්‍යාව සහ වැටුප නිශ්චය කිරීම,
- තෝරා ගැනීම, බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම, තනතුරෙන් පහළ දැමීම, විශ්‍රාම ගැන්වීම/ සේවය අවසන් කිරීම ආදියට අදාළ සේවකයින් පිළිබඳ කටයුතු
- අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හි බඳවාගැනීමේ පටිපාටි විකාශනය කිරීම හෝ සංශෝධනය කිරීම
- CAASL හි සඳහා කාර්ය මණ්ඩල රීති සහ පරිපාලන කාර්යපටිපාටි විකාශනය කිරීම
- CAASL සඳහා කාර්යාල පටිපාටි විකාශනය කිරීම
- සේවකයින් පිළිබඳ විනයානුකූල කටයුතු
- CAASL සේවකයින් සඳහා විනය කාර්යපටිපාටි විකාශනය කිරීම
- අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හි CAASL හි ඒකාබද්ධ සැලැස්ම සංශෝධනය කිරීම හෝ යාවත්කාලීන කිරීම.
- CAASL හි වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන සහ පුහුණු ප්‍රතිපත්ති කාර්යපටිපාටි සහ වැඩසටහන් අධීක්ෂණය කිරීම
- සේවකයින්ගේ විදේශ පුහුණුව සඳහා අනුමැතිය දීම සහ CAASL හි සේවකයින්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
- චංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සඳහා සහ/හෝ එවැනි දේපළ සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම
- සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවේ සේවකයින් වෙනුවෙන් පූර්ව විශ්‍රාම ගැන්වීම හෝ සේවයෙන් වෙන්වීම සඳහා වන්දි ගෙවීමේ යෝජනා ක්‍රම විකාශනය කිරීම
- CAASL හි සේවකයින් සඳහා සමාජ සහ සුභසාධන යෝජනා ක්‍රම විකාශනය කිරීම

CAASL කාර්යමණ්ඩල කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය

(1) උපුල් ධර්මදාස මහතා (සභාපති)

(2) කපිතාන් තේමිය අබේවික්‍රම (සාමාජික)

(3) නිහාල් ජයවර්ධන මහතා. PC (සාමාජික)

විගණන සහ කළමනාකරණ කමිටුව

විගණන සහ කකරණ කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.

- අභ්‍යන්තර විගණන වීකකයේ වගකීම නිශ්චය කිරීම සහ වාර්ෂික සැලැස්ම සමාලෝචනය කිරීම
- සමස්ත සංවිධානයේ සියළුම කාර්යයන් සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීම සහ ඇගයීම
- පිරිවැය ඵලදායිතාව සහතික කිරීමටත්, නාස්තිකාර වියදම් වැළැක්වීමටත් සමාන්තර කලාන්තරයන් හි දී කාර්යසාධනය සමාලෝචනය කිරීම
- බාහිර ගණන් පරීක්ෂකවරුන් සමග සම්බන්ධකම් පැවැත්වීම සහ විගණකාධිපතිගේ කළමනාකරණ ලිපි සම්බන්ධව පසු විපරම් කටයුතු සිදුකිරීම
- ව්‍යවස්ථා, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛ සමග අනුකූලතාව පවත්වා ගන්නා බව නිශ්චය කිරීම
- ගිණුම්කරණ ප්‍රමිති සමග අනුකූලතාවය පවත්වන බවට සහතික වීම සඳහා මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම
- නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා සහ කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම
- රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම
- වාර්ෂික වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම පිළිබඳ වාර්තාවක් සකස් කිරීම
- අධිකාරිය විසින් එසේ කරන ලෙස ඉල්ලා සිටි විට සියලුම විගණන කටයුතු සම්බන්ධව අධිකාරියට වාර්තා කිරීම

විගණන කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය

(1) අයන්ති ද සිල්වා මෙනවිය (සභාපති)

(2) චමින්ද වෙලේගම මහතා (සාමාජික)

(3) අමිත විජයසූරිය මහතා (සාමාජික) 2020 පෙබරවාරි 20 දක්වා

(4) අවන්ති සේනාරත්න මෙනවිය (සාමාජික) 2020 සැප්තැම්බර් 14 සිට

NGAP ශ්‍රී ලංකා වැඩසටහන - ජාතික කමිටුව

- මීළඟ පරම්පරාවේ ගුවන්සේවා වෘත්තිකයින් (NGAP) පිළිබඳ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ සංකල්පය

නුදුරු අනාගතයේ දී නිපුණතා සහිත ගුවන්සේවා වෘත්තිකයින්ගේ හිඟයක් ඇති විය හැකි බව ජාත්‍යන්තර ගුවන්සේවා ප්‍රජාව විසින් හඳුනාගනු ලැබ ඇත. මෙම බරපතල ගැටළුවට විසඳුම් සෙවීම සඳහා අනාගත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන පද්ධතිය මෙහෙයවීම, කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් සහ නිපුණතා සහිත ගුවන්සේවා වෘත්තිකයින් වැඩි වැඩියෙන් සූදානම් කෙරෙන බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය මීළඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයින් වැඩසටහන් ආරම්භ කරන ලදී.

NGAP ශ්‍රී ලංකා වැඩසටහනේ මෙහෙවර, ඉදිරි දැක්ම සහ අරමුණු ඉටුකර ගැනීමටත් එහි ප්‍රධාන ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීමටත් සහාය වීම ඉහත කී ජාත්‍යන්තර කමිටුවේ වගකීම වේ.

ජාතික කමිටුව - NGAP ශ්‍රී ලංකා වැඩසටහන

NGAP ශ්‍රී ලංකා වැඩසටහනෙහි ජාතික කමිටුව පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

(1) කපිතාන් තේමිය අබේවික්‍රම (සභාපති)

(2) P.A. ජයකාන්ත මහතා, (උප සභාපති)

(3) ගිම්හාන් දබරේරා මහතා, (ලේකම් සහ NGAP ජාතික සම්බන්ධීකාරක)

(4) එන්. නවජීවන් මහතා, (සහකාර ලේකම්)

(5) රෙහාන් වන්නියප්පා මහතා, (උපදේශක)

(6) K.M.M.N. දසනායක මහතා, (ගුවන්සේවා අධ්‍යයන සංවර්ධන කමිටු ප්‍රධානී)

(7) ප්‍රභාත් කුලරත්න මහතා, (ගුවන්සේවා දැනුවත් කිරීමේ කමිටුවේ ප්‍රධානී)

සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙනුවෙන්

(8) දේවින්ද අබයගුණවර්ධන මහතා

(9) තිවංක වීරසිංහ මහතා

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම වෙනුවෙන්

(10) නුවන් හෙට්ටිආරච්චි මහතා

(11) රවිත විතාරණගේ මහතා

සිවිල් ගුවන්සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව (CADEC)

සිවිල් ගුවන්සේවා කාර්යයන් සම්බන්ධව පොදු ජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම අරමුණු කර ගත් විශේෂ වැඩසටහන් සැලසුම් කිරීම, විකාශනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා 2010 අගෝස්තු මාසයේ දී සිවිල් ගුවන්සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව පිහිටුවන ලදී. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී මෙම කමිටුවේ ප්‍රධානත්වය දරන අතර ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ (ඒකාබද්ධ) ඔහුට සහාය වෙයි. අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන් හි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද CAASL සේවක පිරිස අතරින් පත් කර ගත් සාමාජිකයින්ගෙන් මෙම කමිටුව සැදුම් ලබයි.

හවුල්කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම

විශේෂයෙන් සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යතුමන්ගේ අපේක්ෂාවන් පිළිබඳව දැනුවත්ව සිටීම සඳහා හවුල්කරුවන් සමග සමීප සහ අන්තර් සම්බන්ධතා පවත්වාගෙන යාමේ වගකීම අධිකාරිය විසින් පිළිගනු ලබයි.

අධිකාරියේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීම

අධිකාරියෙහි සහ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ කාර්යභාරය පැහැදිලිව වෙන්කර තිබීම සිවිල් ගුවන්සේවා අධිකාරිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන වැදගත්ම සාධකය වේ.

අධිකාරියෙහි සහ ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කරමින් අනතුරුව අරමුණු වෙත ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය කෙරේ. අධිකාරිය තවදුරටත් එහි ප්‍රවර්තන ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හෝ චර්යාවන් තුළ නිශ්චිත විධිවිධාන නොපවතින කරුණු සම්බන්ධව මගපෙන්වීමද ලබා දෙයි.

මෙකී ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය මත පැවරී ඇත.

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත අනුව හෝ ඒ යටතේ පනවා ඇති රෙගුලාසි අනුව හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් අනුව හෝ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් මත විශේෂයෙන් පැවරී ඇති නිශ්චිත නියාමන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ වගකීමක් අධිකාරිය වෙත පැවරී නැත. අධිකාරිය ඉන් ඉවත්ව කටයුතු කරයි.

කෙසේ වුවද, මෙම නියාමන වගකීම් සහ රාජ්‍යය මත පැවරී ඇති වගකීම් ඉටු කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍යවන කාර්ය මණ්ඩලය, උපකරණ, පහසුකම් සහ සේවා ඇතුළත්, එහෙත් ඊට සීමා නොවන සියලුම සම්පත් ලබාදීමට අධිකාරිය කටයුතු කරනු ඇත.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට/CAASL හි ප්‍රධාන විධායක නිලධාරිවරයාට ලුහුඬින් සහ පූර්ණ වශයෙන් අධිකාරී බලය සහ වගකීම පවරා දී ඇති බවට සහතික වීමෙන් අධිකාරිය එහි කාර්යභාරය පැහැදිලිව ප්‍රදර්ශනය කරයි.

වගවිය යුතු බව

අධිකාරියේ ප්‍රතිපත්ති, උපායමාර්ගික උපදෙස් සහ එහි ආයතනික සැලැස්මේ නියම කර ඇති අපේක්ෂාවන්ට අනුකූලව එහි ක්‍රමෝපායික අරමුණු කරා යන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ කටයුතු කළමනාකරණය, මෙහෙයවීම, ගිණුම්කරණය සහ අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා අධිකාරිය සහ එහි කමිටු නිතර රැස්වීම් පවත්වයි.

බැඳියා පිළිගැටුම්

අධිකාරිය බැඳියා ලේඛනයක් පවත්වාගෙන යන අතර, බැඳියා ප්‍රකාශ කිරීමට ඇති බැඳීම් පිළිබඳව අධිකාරියේ සාමාජිකයන් දැනුවත්ව සිටින බව සහතික කරයි. මණ්ඩල සාමාජිකයින් සහ අධිකාරියේ සියලුම සේවකයින් සඳහා බැඳියා පිළිගැටුම් ලේඛනයක් පවත්වාගෙන යාම මඟින් මෙම ප්‍රවේශය පිළිබිඹු වේ.

තත්ත්ව සහ අභ්‍යන්තර විගණනය

අධිකාරියේ කාර්යයන් සහ රාජකාරී අතරින් බොහෝමයක් පවරා දෙනු ලැබ ඇති අතර ඵලදායී සංවිධාන පාලන සහ අධීක්ෂණ ක්‍රම පවත්වාගෙන යාමේ අවසාන වගකීම අධිකාරිය මත ම රඳා පවතියි.

අභ්‍යන්තර පාලන ක්‍රම අතරට අධිකාරියේ නිශ්චිත අරමුණු ඉටුකර ගැනීම සඳහා පිහිටුවා ඇති ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටිද ඇතුළත් වේ. අධිකාරිය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය මෙම වාර්තාවේ ඇතුළත් වී ඇති වගකීම් ප්‍රකාශය අත්සන් කිරීම මඟින් ඔවුනොවුන්ගේ වගකීම් පිළිගෙන ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

සිවිල් ගුවන්සේවා අධිකාරියේ එකිනෙක අංශවල අභ්‍යන්තර පාලන ක්‍රම සවිස්තරව නිරීක්ෂණය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ වගකීම දරන අභ්‍යන්තර විගණන අංශයක් අධිකාරිය සතුව ඇත. CAASL විසින් ඉටු කරනු ලබන සියලුම රාජකාරි සහ කාර්යයන් හි තත්ත්වය පවත්වාගෙන යාමේත් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරි හරහා අධිකාරිය වෙත වාර්තා කරනු ලබන මූල්‍ය සහ වෙනත් තොරතුරු වල විශ්වසනීයභාවය පිළිබඳ සහතික වීමේ වගකීම ද පැවරී ඇත්තේ අභ්‍යන්තර විගණන අංශයටය.

අභ්‍යන්තර විගණන අංශය කළමනාකරණයෙහි බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කරන අතර ඔවුන්ගේ සොයා ගැනීම් සම්මත මාර්ග ඔස්සේ ඍජුවම සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි වෙතත් විගණන සහ කළමනාකරණ කමිටුව වෙතත් වාර්තා කරනු ලැබේ.

ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූලවීම

තම සංවිධානය සියළුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සිය වගකීම වන බව අධිකාරිය පිළිගනියි. විශේෂයෙන්ම තමන්ට අදාළ වන ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන් පිළිබඳ කාර්ය මණ්ඩලයේ සියල්ලන් මනා අවබෝධයකින් සිටින බව සහතික කර ගැනීම සඳහා එවැනි අනුකූලතාව පිළිබඳ ගැටළු ක්‍රමානුකූලව හඳුනාගැනීම පිණිස උචිත වැඩපිළිවෙලක් විකාශනය කර ක්‍රියාත්මක කිරීමේ වගකීම අධිකාරිය විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙත පවරනු ලැබ ඇත.

රාජ්‍ය සංවිධාන විසින් අධිකාරිය වෙත නිකුත් කරනු ලබන පොදු චක්‍රලේඛ හෝ නිශ්චිත චක්‍රලේඛ හෝ/සහ නියෝග අධිකාරියෙහි කටයුතුවලට අදාළ කර ගන්නේ එකිනෙක වෙන වෙනම ගෙන සලකා බලන පදනම මත බව අධිකාරිය තීරණය කර ඇති හෙයින් එවැනි එකිනෙක චක්‍රලේඛ වෙන වෙනම පරීක්ෂා කර ඒවායේ අන්තර්ගතය අධිකාරියේ නීත්‍යානුකූල බලතල, කාර්යයන් සහ රාජකාරි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඇති කරනු ලබන බලපෑම් පරීක්ෂා කර බලා එවැනි චක්‍රලේඛ අදාළ කරගත යුතු ප්‍රමාණය සහ ආකාරය සම්බන්ධව අධිකාරිය විසින් තීරණය කරනු ලබන තුරු රජයේ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ එම මොහොතේම CAASL හි කළමනාකරණයට අදාළ කර නොගනු ඇත.

රජයේ චක්‍රලේඛ CAASL හි ක්‍රියාකාරිත්වය කෙරෙහි අදාළ කර ගනු ලබන ප්‍රමාණය පිළිබඳ යාවත්කාලීන කරන ලද අනුකූලතා ලැයිස්තුවක් පවත්වාගන යාම ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන ශාඛාවේ වගකීම වන්නේය.

ආචාර ධර්ම

ආචාර ධර්ම රීති සංග්‍රහයේ විකාශනය කර හඳුන්වා දී ඇති අතර අධිකාරිය එහි කාර්යය මණ්ඩලය සෑමකල්හිම උසස් මට්ටමේ සදාචාර සම්පන්න හැසිරීම් පවත්වාගෙන යන්නේද යන්නත් "යහපත් සංස්ථා පාලනයට" අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ ද යන්නත් නිරතුරුව නිරීක්ෂණය කරයි. සම්මත ආචාර රීති සමග අනුකූලතාව පවත්වා ගැනීම අධීක්ෂණය කරනුයේ සේවකයින්ට එරෙහිව ලැබෙන පැමිණිලි සහ විනය පරීක්ෂණ ආදියෙහි උපනතීන් පිළිබඳ විමිසිලිමත් වීම, අභ්‍යන්තර විගණන චාර්තා හෝ ආචාර රීති සංග්‍රහයේ ඇතුළත් ප්‍රතිපත්ති කඩ කිරීම් පිළිබඳ පැමිණිලි පරීක්ෂා කිරීම ආදී ක්‍රමෝපායන් මගිනි.

යහපත් සංස්ථා පුරවැසිභාවය යනුවෙන් අදහස් කරනුයේ එහි සේවක මණ්ඩලය ඇතුළු අධිකාරිය තම සංවිධානයෙනුත් එය නිරත වී සිටින කර්මාන්තයෙනුත් බැහැර වූ තවත් ප්‍රජාවන් ගණනාවක සාමාජිකයකු වන බව පිළිගනිමින් එකී සියලු ප්‍රජාවන්ට අයත් සියලුම සාමාජිකයින්ගේ පිළිගත් අයිතිවාසිකම්, වගකීම් සහ සමාජ චාරිත්‍ර සමග පාරදෘශ්‍ය සහ යථායෝග්‍ය ආකාරයට වගකීමෙන් යුක්තව කටයුතු කිරීමට කැපවීම මගිනි.

සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය

සංවිධාන ව්‍යුහය - අධිකාරියේ කළමනාකරණ කාර්ය මණ්ඩලය පහත දැක්වේ. සංක්ෂිප්ත යෙදුම් මෙම වාර්තාවේ ආරම්භයේ දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය



ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ
සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය



Legends
SCAI – Senior Civil Aviation Inspector
Mgr. – Manager
CAI – Civil Aviation Inspector
AM – Assistant Manager

Rev 03 – 09/05/2019

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ
සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය

	පාඨය	කේතය	තනතුර
1.			සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්
2.	ADG 01	OS1-HM22-ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
3.	DDG 01	OS2-HM21-DDG-1	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගගන නාවික සේවා නියාමන)
4.	DDG 02	OS2-HM21-DDG2	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පියාසර නිරුපද්‍රතතා නියාමන)
5.	DDG 03	OS2-HM21-DDG3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කළමනාකරණ)
6.	DDG 04	OS2-HM2-1-DDG4	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන්සේවා සුරක්ෂිතතා නියාමන)
7.	D 01	OS3-HM11-D2	අධ්‍යක්ෂ (ගගන යාත්‍රාංගන සහ පහසුකම්)
8.	D 02	OS3-HM11-D3	අධ්‍යක්ෂ (ගුවන් සංතරණ සේවා)
9.	D 03	OS3-HM11-D10	අධ්‍යක්ෂ (පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර)
10.	D 04	OS3-HM11-D5	අධ්‍යක්ෂ (ගුවන්යානා මොහෙයුම්)
11.	D 05	OS3-HM11-D6	අධ්‍යක්ෂ (ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව)
12.	D 06	OS3-HM11-D8	අධ්‍යක්ෂ (මානව සම්පත් සහ දේපළ කළමනාකරණ)
13.	D 07	OS3-HM11-D9	අධ්‍යක්ෂ (මූල්‍ය සහ ආදායම් කළමනාකරණ)
14.	D 08	OS3-HM11-D1	අධ්‍යක්ෂ (ගුවන්සේවා සුරක්ෂිතතා)
15.	D 09	OS3-HM11-D7	අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන)
16.	D 10	OS3-HM11-D4	අධ්‍යක්ෂ (පරිසර පර්යේෂණ සහ ව්‍යාපෘති)
17.	D 11	OS3-HM11-D11	අධ්‍යක්ෂ (තත්ත්ව සහ අභ්‍යන්තර විගණන)
18.	SCAI 01	OS4-MM11-AD-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන)
19.	SCAI 02	OS4-MM11-AD-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන ප්‍රමිති)
20.	SCAI 03	OS4-MM11-AN-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - මෙහෙයුම්)
21.	SCAI 04	OS4-MM11-AN-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවා)
22.	SCAI 05	OS4-MM11-AN-5	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික කාලගුණ විද්‍යා)
23.	SCAI 06	OS4-MM11-AN-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - තාක්ෂණික)
24.	SCAI 07	OS4-MM11-AN-4	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය සහ ප්‍රමිති සහ ක්‍රියාපටිපාටි)
25.	SCAI 08	OS4-MM11-PL-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර, විභාග සහ ප්‍රමිති)
26.	SCAI 09	OS4-MM11-PL-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්සේවා වෛද්‍ය විද්‍යා)
27.	SCAI 10	OS4-MM11-PL-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර කාර්ය මණ්ඩලය)
28.	SCAI 11	OS4-MM11-PL-4	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර නොවන කාර්ය මණ්ඩලය)
29.	SCAI 12	OS4-MM11-OP-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
30.	SCAI 13	OS4-MM11-OP-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
31.	SCAI 14	OS4-MM11-OP-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා මැදිරි නිරුපද්‍රතතා)
32.	SCAI 15	OS4-MM11-AW-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතා ප්‍රමිති)
33.	SCAI 16	OS4-MM11-AW-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (නඩත්තු සහ අළුත්වැඩියා සංවිධාන)
34.	SCAI 17	OS4-MM11-AW-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් මෙහෙයුම්කරු සහතික කිරීම සහ සෝදිසි)
35.	Mgr 18	OS4-MM11-HR-1	කළමනාකරු (මානව සම්පත් කළමනාකරණ)

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ
සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය

	පාඨය	කේතය	තනතුර
36.	Mgr 19	OS4-MM11-HR-2	කළමනාකරු (ඒකාබද්ධ කටයුතු සහ දේපළ කළමනාකරණ)
37.	Mgr 20	OS4-MM11-HR-3	කළමනාකරු (කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධනය)
38.	Mgr 21	OS4-MM11-FM-1	කළමනාකරු (අයවැය සහ වැඩසටහන්)
39.	Mgr 22	OS4-MM11-HR-5	කළමනාකරු (ලේඛන සහ වෙබ් කළමනාකරණය)
40.	SCAI 23	OS4-MM11-FM-2	කළමනාකරු (මූල්‍ය මෙහෙයුම්)
41.	SCAI 24	OS4-MM11-AS-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් තොටුපල සුරක්ෂිතතා)
42.	Mgr 25	OS4-MM11-AS-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ප්‍රවාහන සමාගම් සුරක්ෂිතතා)
43.	Mgr 26	OS4-MM11-AT-1	කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් අයිතිවාසිකම්)
44.	Mgr 27	OS4-MM11-SP-1	කළමනාකරු (පර්යේෂණ සහ සංවර්ධන සැලසුම්කරණය)
45.	Mgr 28	OS4-MM11-HR-4	කළමනාකරු (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය)
46.	Mgr 29	OS4-MM11-DM-2	කළමනාකරු (නෛතික කටයුතු සහ බල ගැන්වීම්)
47.	Mgr 30	OS4-MM11-IA-1	කළමනාකරු (අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සමීක්ෂණ)
48.	Mgr 31	OS4-MM11-DM-1	කළමනාකරු (ගුවන්සේවා නිරුපද්‍රතතා අධීක්ෂණ)
49.	Mgr 32	OS4-MM 1-1-DM-2	සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධායක සහකාර
50.	CAI 01	OS5-MA5-3-AD-1 -1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
51.	CAI 02	OS5-MA5-3-AD-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
52.	CAI 03	OS5-MA5-3-AD-1-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
53.	CAI 04	OS5-MA5-3-AD-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන ප්‍රමිති)
54.	CAI 05	OS5-MA5-3-AN-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - මෙහෙයුම්)
55.	CAI 06	OS5-MA5-3-AN-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවා)
56.	CAI 07	OS5-MA5-3-AN-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවා)
57.	CAI 08	OS5-MA5-3-AN-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - තාක්ෂණික)
58.	CAI 09	OS5-MA5-3-AN-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය සහ ප්‍රමිති සහ ක්‍රියාපටිපාටි)
59.	CAI 10	OS5-MA5-3-PL-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර විභාග)
60.	CAI 11	OS5-MA5-3-PL-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර ප්‍රමිති)
61.	CAI 12	OS5-MA5-3-PL-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර කාර්ය මණ්ඩලය) සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්
62.	CAI 13	OS5-MA5-3-PL-5	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර නොවන කාර්ය මණ්ඩලය)
63.	CAI 14	OS5-MA5-3-PL-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පියාසර පුහුණු)
64.	CAI 15	OS5-MA5-3-OP-1-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
65.	CAI 16	OS5-MA5-3-OP-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
66.	CAI 17	OS5-MA5-3-OP-1-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
67.	CAI 18	OS5-MA5-3-OP-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
68.	CAI 19	OS5-MA5-3-OP-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
69.	CAI 20	OS5-MA5-3-OP-2-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ
සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය

	පාඨය	කේතය	තනතුර
70.	CAI 21	OS5-MA5-3-OP-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා මැදිරි නිරූපද්‍රතා)
71.	CAI 22	OS5-MA5-3-AW-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - නිර්මාණ සහ නිෂ්පාදනය)
72.	CAI 23	OS5-MA5-3-AW-1-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන්යානා බඳ)
73.	CAI 24	OS5-MA5-3-AW-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - බලෝත්පාදක)
74.	CAI 25	OS5-MA5-3-AW-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන් තාක්ෂණික ඉලෙක්ට්‍රොනික ශිල්ප ක්‍රම)
75.	CAI 26	OS5-MA5-3-AW-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන්යානා බඳ)
76.	CAI 27	OS5-MA5-3-AW-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - බලෝත්පාදක)
77.	AM 28	OS5-MA53-HR-1	සහකාර කළමනාකරු (මානව සම්පත් කළමනාකරණ)
78.	AM 29	OS5-MA53-HR-2	සහකාර කළමනාකරු (ඒකාබද්ධ කටයුතු සහ දේපළ කළමනාකරණ)
79.	AM 30	OS5-MA53-HR-3	සහකාර කළමනාකරු (පුහුණු)
80.	AM 31	OS5-MA53-HR-5	සහකාර කළමනාකරු (ලේඛන සහ වෙබ් කළමනාකරණය)
81.	AM 32	OS5-MA53-FM-1	සහකාර කළමනාකරු (අයවැය සහ වැඩසටහන්)
82.	AM 33	OS5-MA53-FM-1	සහකාර කළමනාකරු (මූල්‍ය මෙහෙයුම්)
83.	AM 34	OS5-MA53-AT-1	සහකාර කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් අයිතිවාසිකම්)
84.	AM 35	OS5-MA53-AT-3	සහකාර කළමනාකරු (ගුවන් ප්‍රවාහන සේවා)
85.	CAI 36	OS5- MA53-AS-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්තොටුපල සුරක්ෂිතතාව)
86.	CAI 37	OS5-MA53-AS-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ප්‍රවාහන සමාගම් සුරක්ෂිතතා)
87.	CAI 38	OS5-MA53-AS-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ප්‍රවාහන සමාගම් සුරක්ෂිතතා)
88.	CAI 39	OS5-MA53-AS-3 - 1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (සුරක්ෂිතතා ප්‍රමිති)
89.	CAI 40	OS5-MA53-AS-3 -2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (සුරක්ෂිතතා ප්‍රමිති)
90.	AM 41	OS5-MA53-SP-2	සහකාර කළමනාකරු (සැලසුම්කරණ)
91.	AM 42	OS5-MA53-SP-3	සහකාර කළමනාකරු (සංඛ්‍යාලේඛන සහ පුරෝකථන)
92.	AM 43	OS6-JM11-SP-4	සහකාර කළමනාකරු (සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන)
93.	AM 44	OS5- MA53-SP-1	සහකාර කළමනාකරු (විශේෂ වැඩසටහන්)
94.	AM 45	OS5-MA53-HR-4	සහකාර කළමනාකරු (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය)
95.	AM 46	OS5-MA53-DM-2	සහකාර කළමනාකරු (නෛතික කටයුතු සහ බල ගැන්වීම්)
96.	AM 47	OS5-MA53-AT-2	සහකාර කළමනාකරු (අන්තර්ජාතික සම්බන්ධතා)
97.	AM 48	OS5-MA53-IA-1	සහකාර කළමනාකරු (අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සමීක්ෂණ)
98.	AM 49	OS5-MA53-DM-1	සහකාර කළමනාකරු (ගුවන්සේවා නිරූපද්‍රතා අධීක්ෂණ)
99.	JM 50	OS6-JM 1-1-DM-1	සභාපතිවරයාගේ පුද්ගලික සහකාර සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
100.	JM 51	OS6-JM11-DM-3-1	සම්බන්ධීකරණ නිලධාරී
101.	JM 52	OS6-JM11-DM-3-2	සම්බන්ධීකරණ නිලධාරී
102.	JM 53	OS6-JM11-DM-3-3	සම්බන්ධීකරණ නිලධාරී
103.	JM 54	OS6-JM11-DM-3-4	සම්බන්ධීකරණ නිලධාරී

පාලනය සහ කළමනාකරණය

CAASL රැස්වීම්

සමාලෝචිත කාලසීමාව තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) අධිකාරී රැස්වීම් අටක් (08) පවත්වා ඇති අතර CAASL සහ CAASL මඟින් නියාමනය කරනු ලබන සිවිල් ගුවන්සේවා කර්මාන්තය යන දෙඅංශයේම ප්‍රගතිය සහ යහපැවැත්ම උදෙසා යෝජනා සම්මතකර ගන්නා ලදී. සමාලෝචිත කාල සීමාව තුළ CAASL හි කාර්යමණ්ඩල කමිටුව තෙවතාවක් (03) රැස් වූ අතර CAASL හි විගණන කමිටුව සිවි වතාවක් (04) රැස් විය.

ගුවන්සේවා නිරුපද්‍රතතා අධීක්ෂණ ඒකකය

ICAO ඇමුණුම 13 සහ ඇමුණුම 19 හි අඩංගු ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව ගුවන්යානා අනතුරු සහ සිද්ධි විමර්ශන හා රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන (SSP) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය වගකීම් සහතික කිරීම සහ නියාමනය කිරීම සඳහාත්, මිනිසුන් රහිත ගුවන්යානාවල රට තුළ මෙහෙයුම් පිළිබඳවත් ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණ ඒකකය වගකිව යුතුය.

ඒකකයේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ ICAO ඇමුණුම 13 යටතේ ගුවන්යානා අනතුරු සහ සිද්ධි විමර්ශන පරිපාලන කටයුතු සිදු කිරීම සහ ICAO ඇමුණුම 19 යටතේ රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ ආරක්ෂක ඉලක්ක සපුරා ගැනීම ය. මීට අමතරව, මිනිසුන් රහිත ගුවන්යානා මෙහෙයුම් සම්බන්ධ කටයුතු සඳහා ඒකකය වගකිව යුතුය.

නියාමන සංවර්ධනය

- ක්‍රියාත්මක කිරීමේ සම්මතය - SLCAIS -053, නියමු රහිත ගුවන්යානා පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලවන පරිදි සියලුම පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් වැඩිදියුණු කරන ලද අතර එහි පරිවර්තනය සිදු වෙමින් පවතී. මිනිසුන් රහිත ගුවන්යානා මෙහෙයුම් සඳහා ස්වයංක්‍රීය පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.
- ආරක්ෂිත කළමනාකරණය පිළිබඳ ICAO ඇමුණුම 19 ට අනුකූලව SMS රාමුව මත ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය නිකුත් කරන ලදී.
- ගුවන්යානා අනතුරු හෝ බරපතල සිදුවීම් අනුකූලතා පිළිබඳ ගුවන්යානා තොරතුරු වක්‍රලේඛය ගුවන් තොටුපොළ ක්‍රියාකරුවන්ගේ, ගුවන්යානා ක්‍රියාකරුවන්ගේ සහ ගුවන් සංතරණ සේවා සපයන්නන්ගේ අවශ්‍යතා යාවත්කාලීන කර ශ්‍රී ලංකාවේ ගගනගාමී තොරතුරු ප්‍රකාශනයේ ප්‍රකාශයට පත් කරන ලදී.
- සමාලෝචන වර්ෂය තුළ මිනිසුන් රහිත ගුවන්යානා මෙහෙයුම් සහ ලියාපදිංචිය පිළිබඳ කාර්යාල ක්‍රියා පටිපාටි දෙකක් නිකුත් කරන ලදී.

සහතික කිරීම්

2020 වර්ෂය තුළ ඩ්‍රෝන තුන්සිය අසූපහක් (385) ලියාපදිංචි කර ඇති අතර ඩ්‍රෝන එකසිය හැට හතක් (167) CAASL විසින් භෞතිකව පරීක්ෂාවට ලක් කරන ලදී. තවද, 2020 දී මිනිසුන් රහිත ගුවන්යානා (UAV) සඳහා හාරසිය හැත්තෑ තුනක (473) අනුමත කිරීම් නිකුත් කර ඇති අතර විශේෂයෙන් සාදන ලද ඩ්‍රෝන හයක් (06) පරීක්ෂා කර ලියාපදිංචි කරන ලදී.

2020 වසර තුළ UAV අනුමත කිරීම්



මීට අමතරව, UAV එකලස් කිරීම සඳහා අනුමත කිරීම් දෙකක් (02) SLCAIS 053 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියට අනුකූලව සිදු කර ඇත. UAV මෙහෙයුම් සඳහා එක් අඩවියක් පරීක්ෂා කර අනුමත කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ ආදර්ශ පියාසර මෙහෙයුම් සඳහා අනුමැතීන් දහතුනක් (13) ලබා දී ඇත.

ගුවන් ගමන් වාර

2020 දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානා සහ විදේශවල ලියාපදිංචි ගුවන්යානා ශ්‍රී ලංකා භූමිය තුළ සිය මෙහෙයුම් සිදු කරන ලද ගුවන් ගමන් වාර එකසිය විසි එකක් (121) වාර්තා වී ඇත. මෙයින් එකසිය හතක් (107) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානාවල වූ අතර ඉතිරි 14 ශ්‍රී ලංකා භූමිය තුළ සිදු වූ විදේශීය ලියාපදිංචි ගුවන්යානාවල වේ.

මුළු ගුවන් වාර අතරින්, පක්ෂි ගැටීම් තිස්පහක් (35) වාර්තා වී ඇති අතර, එය එක් කාණ්ඩයක් තුළ වාර්තා වූ වැඩිම සිදුවීම් ගණනයි. වාර්තා වූ පක්ෂි ගැටීම් අතරින් විස් එකක් (21) ක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදීත්, තුනක් (03) කොළඹ රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදීත්, දෙකක් (02) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදීත් සිදු විය.

වර්ෂය තුළ පද්ධති/සංරචක අසමත්වීම් හෝ අක්‍රියවීම් ආශ්‍රිත සිදුවීම් විසිපහක් (25) වාර්තා වී ඇති අතර ඉන් විසි දෙකක් (22) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති ගුවන්යානා වේ.

ගුවන් ගමන් කළමනාකරණය/ සන්නිවේදනය හා සම්බන්ධ සිදුවීම් දහ නවයක් (19) අතරින් බහුතරයක්ම වාර්තා වී ඇත්තේ ගුවන් ගමන් සේවා (ATS) ඒකක සමඟ සම්බන්ධ නොවීම නිසා වන අතර, ඉන් වැඩිම සංඛ්‍යාව මුම්බායි පියසර තොරතුරු කලාපය (FIR) තුළ සම්බන්ධතා පැවැත්වීමට නොහැකි වීම් හේතුවෙන් සිදු වී ඇත.

පාලනය සහ කළමනාකරණය

විමර්ශන

- 2020 ජුනි 06 වන දින සිංගප්පූරුවේ චැංගි ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට අඩි 8000ක් පමණ උසින් 4R-ANC ලියාපදිංචි අංකය සහිත ශ්‍රී ලංකන් ගුවන් සේවයේ UL 1423, A320 ගුවන් යානයේ හයිඩ්‍රොලික් RSVR කහ මට්ටමේ අනතුරු ඇඟවීම පිළිබඳ සිද්ධිය විමර්ශනය කර අවසන් වාර්තාව ආරක්ෂිත නිර්දේශ සමග නිකුත් කරන ලදී.
- Lakwin Aviation පුද්ගලික සමාගමේ 4R-LWR ලියාපදිංචි අංකය ඇති Cessna 152 ගුවන් යානය, 2020 ජුලි 26 වන දින පානදුර වෙරළ හරහා පහතින් පියාසර කිරීමේ සිදුවීම විමර්ශනය කර අවසන් වාර්තාව ආරක්ෂිත නිර්දේශ සහිතව නිකුත් කරන ලදී.
- 2020 අගෝස්තු 24 වන දින සයිප්‍රසයට පැමිණීමට පෙර තුර්කි ගුවන් සීමාවට ඉහළින් පියාසර කරන ATS ගුවන් ගමන් සැලැස්ම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ෆ්‍රෙන්ක්ෆර්ට් ගුවන් තොටුපළේදී ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් යානයේ UL 1506 පිටත්වීම ප්‍රමාද වීමේ සිද්ධියක් විමර්ශනය කර, එය නැවත සිදුවීම වැළැක්වීමට ආරක්ෂක නිර්දේශ නිකුත් කරන ලදී.
- අනෙකුත් සියලුම වාර්තා වූ අනිවාර්ය සිදුවීම් CAASL හි අදාළ අංශ මගින් සමාලෝචනය කරන ලදී. අදාළ ගුවන් මෙහෙයුම්කරුවන්ට සහ අනෙකුත් සංවිධානවලට ආරක්ෂිත නිර්දේශ බෙදා හැරීම සහ අනෙකුත් තාක්ෂණික අංශ මගින් සිදු කරන ලද විමර්ශන මත පදනම්ව පසු විපරම් කටයුතු සිදු කරන ලදී.
- ක්‍රියාකරුවන් විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ විද්‍යුත් තැපෑලෙන් පිළිගනු ලැබූ අතර ඉදිරිපත් කරන ලද ලේඛන මත සිදු කරන ලද ඇගයීම් මත පදනම්ව අලුත් කිරීම් සහ නිකුත් කිරීම් ලබා දෙන ලදී.
- ගුවන් නියමුවන්ගේ අයදුම්පත් සඳහා ආරක්ෂක නිෂ්කාශන මාර්ගගතව පිළිගෙන රේඩිය අමාත්‍යාංශය වෙත බෙදා හරින ලදී.

පුද්ගල හා ගුවන්සේවා පුහුණු සංවිධාන සහතික කිරීම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂක ඌණ පූරණය	නියමු බලපත්‍ර	699
	පියාසැරි උපදේශක ශ්‍රේණිගත කිරීම් (AFI සහ FI)	3
	බිම් උපදේශක බලපත්‍රය	35
	විදේශ බලපත්‍ර වලංගු කිරීමේ සහතිකය	17
	ගුවන් ගමනාගමන පාලක	199
	ගුවන් මෙහෙයුම් නිලධාරී	0
	ගුවන්යානා නඩත්තු බලපත්‍ර	197
	කැබින් කාර්ය මණ්ඩල සහතික	148
	පියාසර පරීක්ෂණ පරීක්ෂක අවසර	19
	බැලූන බලපත්‍ර	0
	වෛද්‍ය පරීක්ෂණ	917
	වෛද්‍ය තක්සේරුකරුගේ සම්මුඛ සාකච්ඡා	52
	විභාග	2,008
ගුවන්සේවා පුහුණු සංවිධාන සහතික කිරීම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂක ඌණ පූරණය	අනුමත පුහුණුව පිළිබඳ අඛණ්ඩ නිරීක්ෂණ ආයතන	
	ආසියානු ගුවන්සේවා මධ්‍යස්ථානය	1
	Sky Line Aviation	1
	Open Skies	1
	Fits Air Flight Academy	3
	ශ්‍රී ලංකා TRTO	2
	Fairways Aviation Academy	1
	ATC පුහුණු මධ්‍යස්ථානය	2
	ගුවන් මෙහෙයුම් නිලධාරී පුහුණු පාසල	1
	Fly Southern (Pvt) Ltd	1
	Lakwin Aviation (Pvt) Ltd	1
	Sakurai Aviation Academy	2
	Red Bird Aviation (Pvt) Ltd	1
	බලපත්‍ර නිරීක්ෂණ	36
	නම් කරන ලද රෝහල් පරීක්ෂාව පිළිබඳ අඛණ්ඩ නිරීක්ෂණ	1

පියාසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව

පියාසර කාර්ය මණ්ඩල බලපත්‍ර (PPL/ATPL) සඳහා විභාග පැවැත්වීම	පැවැත්වූ PPL විභාග ගණන	305
	පැවැත්වූ ATPL විභාග ගණන	428
ගුවන්යානා නඩත්තු සේවකයින් සඳහා විභාග පැවැත්වීම	පැවැත්වූ AML විභාග ගණන	1,105
ගුවන් මෙහෙයුම් නිලධාරීන් සඳහා විභාග පැවැත්වීම	පැවැත්වූ FOO විභාග ගණන	28
RT සහ ELPC සඳහා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම	PPL/CPL සඳහා RT ගණන	40
	ELPC ගණන	91
මාලදිවයිනේ අයදුම්කරු සඳහා PPL/CPL/ATPL විභාගය පැවැත්වීම	පැවැත්වූ විභාග ගණන	1
රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම	අනුමත කළ ආරක්ෂක කළමනාකරුවන් සංඛ්‍යාව	8
	SMS අත්පොත් අනුමත කළ පුහුණු පාසල් සංඛ්‍යාව	8

ගුවන්යානා මෙහෙයුම් අංශය

මෙහෙයුම්කරුවන්ගේ සවලදායි නිරුපද්‍රතතා අධීක්ෂණය සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් සම්මත කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් (SARP) ට අනුකූලව දේශීය රෙගුලාසි, රීති, නියෝග සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගුවන් ගමන් නිරුපද්‍රතතා නියාමන අංශය යටතේ පැවති පියසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව මූලික වශයෙන් වගකිව යුතුය. ගුවන්සේවා ක්‍රියාත්මක කිරීම සඳහා අයදුම්කරුවන්ගේ මුල් සහතික කිරීම් හා නැවත සහතික කිරීම් ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි. අන්තරායකර භාණ්ඩ අවසරපත් නිකුත් කිරීම සහ භූමිය හැසිරවීමේ බලපත්‍ර නිකුත් කිරීම ද ගුවන්යානා මෙහෙයුම් අංශයේ විෂයපථය යටතට ඇතුළත් කර ඇත.

නියාමන සංවර්ධනය

මෙහෙයුම් අංශය විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 78 වැනි වගන්තිය යටතේ අන්තරායකාරී භාණ්ඩ සඳහා රෙගුලාසි සකස් කරන ලද අතර එම ලේඛනය ඇගයීම සඳහා නීති කොටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

කොවිඩ්-19 වසංගතය පෙර නොවූ විරූ ලෙස ගුවන්සේවා කර්මාන්තයට බාධා ඇති කළ බැවින් ගුවන්යානා මෙහෙයුම් අංශය විසින් 2020 වසර තුළදී අනුගමනය කළ යුතු පූර්වාරක්ෂාවන් සහ ගුවන්සේවා කර්මාන්තයට අනුකූල වීම සඳහා සාමාන්‍ය විධාන දෙකක් (02) ප්‍රකාශයට පත් කරන ලදී.

(1) මූලික විධානය 09 - කොවිඩ්-19 වසංගතයට අදාළව කාර්ය මණ්ඩල සාමාජිකයින් කළමනාකරණය කිරීම පිළිබඳ ගුවන් සමාගම් සඳහා මාර්ගෝපදේශ.

(2) මූලික විධානය 10 - කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සියලුම ගුවන් තොටුපල සඳහා ගුවන් තොටුපල ක්‍රියාකාරිත්වය පිළිබඳ මාර්ගෝපදේශ.

ගුවන් මෙහෙයුම්කරු සහතික

ගුවන් ක්‍රියාකරු සහතික සඳහා වන මූලික අයදුම්පත් හතක් ගුවන්යානා මෙහෙයුම් අංශය වෙත ලැබී ඇති අතර ඒවා දැනට එම අංශයේ සමාලෝචනය යටතේ පවතී. පහත සඳහන් ආයතනවලින් සමාලෝචනය සඳහා අයදුම්පත් ලැබී ඇත.

- ඕපන් ස්කයිස් - සීමාසහිත ෆ්ලයි ලන්කන් ඒෂියා සමාගම
- සීමාසහිත රෙඩ් බර්ඩ් ඒවියේෂන් සමාගම
- සීමාසහිත ලක්වින් ඒවියේෂන් සමාගම
- ස්පාර්ක් වියාර්
- සීමාසහිත ඕරා වියාර්ලයින්ස් සමාගම
- ෆ්ලයිමී වියාර්ලයින්ස්

සීමාසහිත හෙලිටුවර්ස් සමාගමේ අවලංගු වූ ගුවන් ක්‍රියාකරු සහතිකය නැවත සක්‍රිය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටියි.

2020 වර්ෂය සඳහා පහත සඳහන් ගුවන්සේවා නවය (09) සඳහා මෙහෙයුම් අංශය මඟින් ගුවන් මෙහෙයුම්කරු සහතික අලුත් කරන ලදී.

- සීමාසහිත ශ්‍රී ලංකන් වියාර් ලයින්ස් ගුවන් සමාගම
- ෆිට්ස් ඒවියේෂන් (පුද්) සමාගම
- සීමාසහිත දයා ඒවියේෂන් (පුද්) සමාගම
- සීමාසහිත සෙනොක් ඒවියේෂන් (පුද්) සමාගම
- සැෆ්රෝන් ඒවියේෂන් (පුද්) සමාගම – IWS ඒවියේෂන් (පුද්) සමාගම
- සකුරායි ඒවියේෂන් ලිමිටඩ්
- එෆ්-එයාර්වේස් ලිමිටඩ්

පියාසර නිරුපදුතතා නියාමන ශාඛාව

විදේශීය ගුවන් මෙහෙයුම්කරුවන්

මෙහෙයුම් අංශය මගින් නිකුත් කරන ලද විදේශ ගුවන් මෙහෙයුම් සහතික විසි නවයක් (29) ශ්‍රී ලංකාව වෙත දැනට සේවා සපයන ගුවන් සමාගම් වෙත අලුත් කරන ලද අතර, 2020 වර්ෂය තුළ ආරම්භක විදේශ ගුවන් මෙහෙයුම් සහතික හයක් (06) ද නිකුත් කරන ලදී. නව විදේශ ගුවන් මෙහෙයුම්කරුවන් වන්නේ;

- කසකස්ථානයේ ස්කැට් එයාර්
- ඉන්දියාවේ ෆ්ලයිබිග්
- ඉතියෝපියන් එයාර්ලයින්ස්
- මාල දිවයිනේ මෝල්ඩිවියන් එයාර්ලයින්ස්
- ඉතාලියේ නියෝස් S.P.A
- වීරෝෆ්ලොට්

අන්තරායකාරී භාණ්ඩ ප්‍රවාහනය

ගුවන්යානා මෙහෙයුම් අංශය 2020 වර්ෂය සඳහා අන්තරායකාරී භාණ්ඩ බලපත්‍ර දහ හතක් (17) අලුත් කරන ලදී.

නම් කරන ලද පරීක්ෂණ නියමු අධීක්ෂණ සහ නියමු ප්‍රවීණතා පරීක්ෂණ අනුමත කිරීම්

පියාසැරි කාර්ය මණ්ඩල සාමාජිකයින් විසි (20) දෙනා සඳහා නියම කරන ලද පරීක්ෂණ නියමු අනුමැතිය 2020 වසර සඳහා අලුත් කරන ලදී. මෙහෙයුම් අංශය විසින් නියමු ප්‍රවීණතා පරීක්ෂණ (PPC) හතරක් සිදු කරන ලද අතර 2020 දී PPC අසූ එකක් (81) සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

නම් කරන ලද පියසර මෙහෙයුම් පරීක්ෂකවරුන්

FOI හි හිඟය හේතුවෙන් නියාමන කාර්යයන් සහ නිරීක්ෂණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය විටකදී හෝ වී වෙනුවෙන් යම් නියාමන රාජකාරී සහ කාර්යයන් ඉටුකිරීමට අධිකාරිය විසින් පවරන ලද බලතල සහිත නම් කරන ලද දක්ෂ ගුවන් මෙහෙයුම් පරීක්ෂකවරුන් සේවයේ යොදවා ඇත. එවැනි නම් කරන ලද ගුවන් මෙහෙයුම් පරීක්ෂකවරුන් අට (08) දෙනෙකුගෙන් යුත් අධිකාරී පැවරුම් ලේඛන 2020 දී අලුත් කරන ලදී.

සෝදිසි කිරීම

ඵලදායී ආරක්ෂක අධීක්ෂණ පද්ධතියක් සහතික කිරීම සඳහා අනුමත නිරීක්ෂණ සැලැස්මට අනුව CAASL නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා දේශීය සහ විදේශීය ගුවන් මෙහෙයුම්කරුවන් මත අඛණ්ඩ නිරීක්ෂණ සිදු කරනු ලැබේ. සමස්ත ගුවන්සේවා කර්මාන්තයටම ව්‍යසනකාරී බලපෑම් ඇති කළ කොවිඩ්-19 වසංගතයේ බලපෑම් හේතුවෙන්, 2020 සඳහා අනුමත නිරීක්ෂණ කටයුතුවලින් දළ වශයෙන් 44%ක් පමණක් ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශයට හැකි විය.

නිරීක්ෂණ ක්‍රියාකාරකම් අතරට රැම්ප් පරීක්ෂාව, පුහුණු නිරීක්ෂණ, අන්තරායකර භාණ්ඩ ක්‍රියාකරුවන්, අන්තරායකර භාණ්ඩ මෙහෙයුම්කරුවන්, අන්තරායකර භාණ්ඩ තොග, අතරමග පරීක්ෂාව, පියාසර රාජකාරී කාලසීමාව, පියාසර පාසල, සිමියුලේටර් පරීක්ෂාව, ආරක්ෂිත කළමනාකරණ පද්ධති, නියමු පිරික්සුම්, පාදක සංතරණ සහ භූමිය හැසිරවීම් පරීක්ෂාව, කාර්ය සාධන ප්‍රවීණතා පරීක්ෂාව යනාදිය ඇතුළත් විය. ඊට අමතරව මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ යාපනය ගුවන්තොටුපල පරීක්ෂා කිරීම 2020 අභියෝග මධ්‍යයේ සිදු කරන ලදී.

ගුවන්යානා ලියාපදිංචි කිරීම් සහ ගුවන් යෝග්‍යතා අංශය

අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා නිර්දේශිත පරිචයන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්යානා ලියාපදිංචි කිරීම සඳහා වන නීතිරීති හා ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහ ගුවන් යෝග්‍යතා අංශයට පැවරී ඇත. නඩත්තු පුහුණු සංවිධාන, අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන සහ ගුවන්යානා නඩත්තු සංවිධාන සඳහා අනුමැතිය ලබා දීම සහ ඒවායේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම ඊට ඇතුළත් ය.

මෙම අංශය මගින් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති සියලුම ගුවන්යානාවල ගුවන් යෝග්‍යතාව හා සම්බන්ධ කාර්යයන් ඉටු කරන අතර ශ්‍රී ලංකාව වෙත ක්‍රියාත්මක වන සියලුම ලියාපදිංචි සිවිල් ගුවන්යානා සෝදිසි කිරීම ද මෙම අංශය මගින් සිදු කෙරේ.

2020 දෙසැම්බර් මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්යානා ලියාපදිංචි කිරීමේ ලේඛනයේ මුළු ලියාපදිංචි ගුවන්යානා සංඛ්‍යාව 84 ක් වූ අතර මෙයට විශාල ගුවන්යානා 25 ක් ද (MTOW> 5700KGS), සැහැල්ලු ගුවන්යානා 43 ක් ද, හෙලිකොප්ටර් 07 ක් ද, බැලූන් 07 ක් ද අති සැහැල්ලු (Ultralight) 02 ක් ද ඇතුළත් වේ.

නියාමන සංවර්ධනය

2020 වර්ෂයේදී, ගුවන්යානාවල ගුවන් යෝග්‍යතාවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතා පිළිබඳ ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම, IS-M සංශෝධනය කරන ලද අතර නව සංශෝධන සහිතව නිකුතුව-02 ප්‍රකාශයට පත් කරන ලදී.

ඇමුණුම 16 වෙළුම III සඳහා ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම - ගුවන්යානා කාබන් ඩයොක්සයිඩ් විමෝචන IS -21 සංශෝධන සමග ඇමුණුම 16 වෙළුම I, II සහ III ප්‍රකාශයට පත් කරන ලදී.

පියාසර නිරුපදුතතා නියාමන ශාඛාව

සහතික කිරීමේ ක්‍රියාකාරකම්

(1) ගුවන්යානාවල ගුවන් යෝග්‍යතාවය

2020 වර්ෂයේ දෙසැම්බර් අවසානය වනවිට, ගුවන් යෝග්‍යතා පිළිබඳ මූලික සහතිකයක් (01) නිකුත් කරන ලද අතර ගුවන් යෝග්‍යතා සහතික හැට අටක් (68) අලුත් කරන ලදී.

(2) අනුමත නඩත්තු සංවිධාන (AMO)

වාර්ෂික විගණනය පැවැත්වීමෙන් අනතුරුව, නඩත්තු සංවිධාන (දේශීය) සහතික 13 ක් අලුත් කරන ලද අතර විදේශීය අනුමත නඩත්තු සංවිධාන (FAMO) සහතික 58 ක් අලුත් කරන ලදී. RMA, BIA, MRIA සහ JAF හි ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සඳහා විශේෂ අනුමත නඩත්තු සංවිධාන (AMO) අනුමත කිරීම් 04 ක් ලබා දී ඇත.

(3) ගුවන්යානා ලියාපදිංචි කිරීම

2020 දෙසැම්බර් මස අවසානය දක්වා නව ගුවන්යානා අටක් ලියාපදිංචි කර ඇති අතර 68 ක් අලුත් කරන ලදී. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන්යානා ඇණියේ ගුවන්යානා 05 ක ලියාපදිංචිය අවලංගු කර ඇති අතර ගුවන් යෝග්‍යතාව පිළිබඳ චික් නිර්යාත සහතික 04 ක් නිකුත් කරන ලදී.

(4) නඩත්තු පුහුණු සංවිධාන (MTO)

AMTO සහතික පහක් (05) අලුත් කරන ලද අතර නියමිත පරිදි වාර්ෂික විගණන 02 ක් පවත්වන ලදී.

(5) අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන (CAMO)

2019 වර්ෂයේදී සිදු කරන ලද ද්වි-වාර්ෂික විගණනය මත පදනම්ව CAMO සහතික තුනක් (03) අලුත් කරන ලදී.

සෝදිසි ක්‍රියාකාරකම්

නිරුපදුතතා අධීක්ෂණය

වර්ෂය තුළ සමස්ත බෑවුම් පරීක්ෂණ 20 ක් සිදු කරන ලද අතර, වසංගත තත්ත්වය මගින් ඉදිරිපත් කරන ලද සීමාවන් සහ අභියෝග හේතුවෙන් සමාලෝචනයට නියමිතව තිබූ නිරීක්ෂණ කටයුතුවල ඉතිරි කොටස 2021 වසර දක්වා ඉදිරියට ගෙන යාමට සිදු විය. කර්මාන්තයෙන් සිදු වූ වාර්තා පනස් පහක් (55) ලැබුණු අතර එහි ආරක්ෂිත අධීක්ෂණ වැඩසටහනේ කොටසක් ලෙස විශ්ලේෂණය කරන ලදී.

ගුවන්යානා ලියාපදිංචියෙන් ඉවත් කිරීම

4R-ASB), A 320(4R-ABR), A 330(4R-ALJ), R66 (4R-MAL), සහ Cessna 172(4R-ASA දෙකක් ලියාපදිංචිය ඉවත් කර සිවිල් ගුවන්යානා ලේඛනයෙන් ඉවත් කරන ලදී.

වෙනත් කාර්යයන්

විසා නිකුත් කිරීම සඳහා නිර්දේශ

ගුවන් යෝග්‍යතා කණ්ඩායම සමඟ ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය (ATER) විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අවසන් වූ පසු දේශීය කර්මාන්තයේ නියැලී සිටින විදේශීය ජාතිකයින් සඳහා ගොඩබෑමේ අනුමත කිරීම් සහ පදිංචි විසා බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කරන ලදී. ඉල්ලීම් මත ගුවන්යානා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ආනයනය/අපනයනය කිරීම සඳහා බොහෝ ක්‍රියාකරුවන් සහ නඩත්තු පහසුකම් සඳහා අමතර කොටස් අනුමත කිරීම් නිකුත් කරන ලදී.

අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි නිරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව මෙම වැඩමුළු හැකියාවන් අනුමත කිරීම් ද ලබා දෙන ලදී.

“සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්”



ගුවන්සේවා ආරක්ෂණ නියාමන ශාඛාව

ගුවන්සේවා ආරක්ෂණ අංශය

2015 වර්ෂයේදී ගුවන්සේවා ආරක්ෂණ අධ්‍යක්ෂවරයා පත්කිරීමත් සමඟ ගුවන්සේවා ආරක්ෂණ ශාඛාව හුදකලා වකක් ලෙස පිහිටුවන ලද අතර අද වන විට එය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන්සේවා ආරක්ෂණ රෙගුලාසි) ලෙස පී.ඒ. ජයකාන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ගුවන්සේවා ආරක්ෂණ රෙගුලාසි යන අංශය මාතෘකාවක් ලෙස ක්‍රියාත්මක වේ.

ගුවන්සේවා ආරක්ෂාවෙහි පරමාර්ථය වන්නේ සිවිල් ගුවන්සේවා භූමි ප්‍රදේශය තුළ සහ ඊට ඉහළින් ඇති ගුවන් සීමාව තුළ ඇති තර්ජන මට්ටම සහ ස්වභාවය නිරන්තරයෙන් සමාලෝචනය කිරීම, සහ අදාළ ජාතික බලධාරීන් විසින් සිදු කරන ලද ආරක්ෂක අවදානම් තක්සේරුවක් මත පදනම්ව ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂක වැඩසටහනේ (NCASP) අදාළ අංගයන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමයි.

ගුවන්සේවා ආරක්ෂක අංශයට පැවරී ඇති වගකීම් රැසක් අතර පහත දෑ අඩංගු වේ.

(a) 1944 ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතියේ ඇමුණුම 17 හි විධිවිධානවලට අදාළ නියාමන රාමුව යාවත්කාලීන කිරීම.

(b) ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂක වැඩසටහන (ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම)

(c) උපදේශකවරුන්, ආරක්ෂක උපකරණ සහ ආරක්ෂක වැඩසටහන් ඇතුළුව ගුවන්සේවා ආරක්ෂක පිරිස් සඳහා සහතික කිරීම සහ අනුමැතිය

(d) මාර්ගෝපදේශ ද්‍රව්‍ය සංවර්ධනය

(e) රාජ්‍ය අධීක්ෂණ උපලේඛනයට සහාය වන පරිදි ගුවන්සේවා ආරක්ෂක නිරීක්ෂණ කටයුතු සිදු කිරීම

(f) CAASL මූලස්ථාන ගොඩනැගිල්ලේ ඒකාබද්ධ ආරක්ෂක පද්ධතිය කළමනාකරණය කිරීම

(a) 1944 ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතියට ඇමුණුම 17 හි විධිවිධානවලට අදාළ නියාමන රාමුව යාවත්කාලීන කිරීම.

ගුවන් ආරක්ෂක සේවා සපයන්නන්ගේ බලපත්‍ර රෙගුලාසි සිවිල් ගගන නාවික සේවා සපයන්නන්ගේ බලපත්‍ර රෙගුලාසි සමඟ ඒකාබද්ධ කිරීම සඳහා සකස් කරන ලද අතර එය බලාත්මක කිරීමේ ක්‍රියාවලියේ පවතී.

2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරී පනත සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත ගුවන්සේවා ආරක්ෂාව සම්බන්ධයෙන් සමාලෝචනය කරන ලද අතර පසු විපරම් කටයුතු සඳහා නීති අංශය වෙත දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ඉදිරිපත් කරන ලද නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

(b) ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂක වැඩසටහන (ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම)

ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන ඇමුණුම 17 හි 17 වැනි සංශෝධන විධිවිධාන ඇතුළත් කරමින් සමාලෝචනය කර 3 වන සංස්කරණය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ජාතික සිවිල් ගුවන්සේවා හදිසි සැලැස්ම සකස් කර අදාල ගුවන්සේවා ආරක්ෂක නිලධාරීන් අතර බෙදා හරින ලදී.

පහත ප්‍රමිති ලේඛන ද වර්ෂය තුළ සමාලෝචනය කර ඇත.

- ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා තත්ත්ව පාලන වැඩසටහන (NCASQCP)
- ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණු වැඩසටහන (NCASTP)
- ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා පරීක්ෂක සහතිකකරණ වැඩසටහන (NCASSCP)

ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා කමිටුව

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් වසර තුළ කැඳවනු ලැබුවේ එක් NCASC රැස්වීමක් පමණි. NCASC අවම වශයෙන් වසරකට දෙවරක්වත් සපුරාලීම ජාත්‍යන්තර අවශ්‍යතාවයකි.

ජාත්‍යන්තර අවශ්‍යතාවයක් සපුරාලන සිවිල් ගුවන්සේවා තර්ජන තක්සේරු කමිටුවක් පිහිටුවීම

ජාත්‍යන්තර අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා ජනවාරි මාසයේදී ජාතික බුද්ධි ප්‍රධානියා (CNI) විසින් තර්ජන තක්සේරු කිරීමේ කමිටුවක් සකස් කිරීමට NCASC විසින් තීරණයක් ගන්නා ලදී. මෙම කමිටුව බුද්ධි අංශ (යුද්ධ හමුදාව, ගුවන් හමුදාව සහ පොලිසිය), ගුවන් තොටුපල ක්‍රියාකරු සහ CAASL හි නියෝජිතයන්ගෙන් සමන්විත වේ. ලේකම් ධූරය CAASL විසින් හොබවනු ලැබේ. කමිටුවේ කාර්ය සාධනය සිදු වෙමින් පවතී.

බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග

අදාළ AVSEC නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවීම නිසා ගුවන්යානා ක්‍රියාකරුවන්, ගුවන් තොටුපල ක්‍රියාකරුවන් සහ ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නන්ට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. නිවැරදි කිරීමේ ක්‍රියාවන් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා පසු විපරම් කටයුතු සිදු කෙරේ.

(c) උපදේශකවරුන්, ආරක්ෂක උපකරණ, ආරක්ෂක වැඩසටහන් සහ සංවිධාන ඇතුළුව ගුවන්සේවා ආරක්ෂක පිරිස් සඳහා සහතික කිරීම සහ අනුමැතිය

ගුවන්සේවා ආරක්ෂක පිරිස්

ගුවන්සේවා සහතික කිරීම / නැවත සහතික කිරීම, ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නා සහ ජාතික ගුවන් සේවය වන "ශ්‍රී ලංකන්" විසින් සේවයේ යොදවා ඇති ආරක්ෂක නිලධාරීන් 2020 වසර පුරාවටම කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වැඩි දුරකට අබාධිත සේවයේ යොදවා ඇත. විස්තර පහත පරිදි වේ.

- ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන් සහතික කිරීම් / නැවත සහතික කිරීම් - 02
- ගුවන් ආරක්ෂක උපදේශකවරුන් සහතික කිරීම් / නැවත සහතික කිරීම් - 13
- ගුවන්සේවා ආරක්ෂක පරීක්ෂකවරුන් සහතික කිරීම් / නැවත සහතික කිරීම් - 452

සටහන: මීට අමතරව, ජාතික ගුවන්සේවා සේවකයින් සඳහා අනිවාර්ය පුහුණුවක් පවත්වා ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් ද සකස් කරන ලදී.

ආරක්ෂක පිරික්සුම් උපකරණ

ආරක්ෂිත පිරික්සුම් උපකරණ 08 ක් සහතික කිරීම/නැවත සහතික කිරීම සිදු කරන ලදී.

ආරක්ෂක වැඩසටහන්

විදේශ ගුවන්සේවා සහ ජාතික ගුවන්සේවා වල ආරක්ෂක වැඩසටහන් 38 ක් සමාලෝචනය කර පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා මෙහෙයුම් අංශය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ගුවන් ආරක්ෂක නියාමන අංශය

ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නා

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධාන, ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ගුවන්සේවා ආරක්ෂක රෙගුලාසි යනාදියේ මඟපෙන්වීම යටතේ පසුගිය වසර දෙක තුළ පරීක්ෂක කාර්යාලය විසින් පවත්වන ලද සහතික කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීම මත Airport & Aviation Services (Sri Lanka) Limited (AASL) වෙත ගුවන්සේවා ආරක්ෂක සේවා සැපයුම් බලපත්‍රය පිරිනමන ලදී.

BIA හි ගගන යාත්‍රාංගණ සහතිකය

BIA ගගන යාත්‍රාංගණ සහතික පරීක්ෂක කාර්යාලය ඇමුණුම 17-ගුවන්සේවා ආරක්ෂාව විධිවිධාන අනුව ඔවුන්ගේ කාර්යය සම්පූර්ණ කර ඇත.

(d) මාර්ගෝපදේශ සංවර්ධනය

පහත ලැයිස්තුගත කර ඇති මාර්ගෝපදේශ ද්‍රව්‍ය සමාලෝචනය කර ඇත.

- SLCAP 1000 - ගුවන්සේවා ආරක්ෂක කර්මාන්ත මාර්ගෝපදේශ අත්පොත
- SLCAP 1100 - ගුවන්යානා ක්‍රියාකරුගේ ආරක්ෂණ වැඩසටහන් ප්‍රමිතිය
- SLCAP 1200 - ගුවන් ආරක්ෂක පරීක්ෂක අත්පොත
- SLCAP 1300 - ගුවන්සේවා ආරක්ෂක කාර්යාල ක්‍රියාපටිපාටි අත්පොත

(e) රාජ්‍ය අධීක්ෂණ උපලේඛනයට සහාය වන පරිදි ගුවන්සේවා ආරක්ෂක නිරීක්ෂණ කටයුතු සිදු කිරීම

COVID 19 වසංගත තත්ත්වය මධ්‍යයේ, අනුමත කාලසටහනට අනුව නිරීක්ෂණ කටයුතු වැඩි වශයෙන් සිදු කරන ලද අතර, වසර තුළ Avsec පිරික්සුම් 40 ක් සහ Avsec පරීක්ෂණ 03 ක් සම්පූර්ණ කරන ලදී.

විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන - ශ්‍රී ලංකාවේ අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USAP-CMA) විගණනය

ජූලි මස USAP CMA-Audit Sri Lanka කාලසටහන සඳහා පරීක්ෂක කාර්යාලය සූදානම් වූ අතර, 2020 මාර්තු 20 වැනි සිකුරාදා, නියමිත ප්‍රධාන විගණකවරයා වෙත අවශ්‍ය ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, ලොව පුරා පැතිර යන කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විගණන වැඩසටහන දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදුවිය.

තර්ජන මට්ටම සමාලෝචනය

ජාතික අධිකාරීන් විසින් විස්තීර්ණ තර්ජන තක්සේරුවක් සිදු කර අවදානම් තක්සේරුව සිදු කිරීමෙන් පසු සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට DGCA වෙත යෝජනා කර ඇති අතර ඒ අනුව DGCA විසින් 2020 ජූලි 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් තර්ජන මට්ටම 2 සකස් කර ඇත.

(f) CAASL මූලස්ථාන පරිශ්‍රයේ ඒකාබද්ධ ආරක්ෂක පද්ධතිය කළමනාකරණය කිරීම

මූලස්ථාන පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති ඒකාබද්ධ ආරක්ෂක පද්ධති (භෞතික ආරක්ෂණ සේවා, ඉලෙක්ට්‍රොනික ප්‍රවේශ පාලන පද්ධතිය සහ CCTV පද්ධතිය) කළමනාකරණය කිරීම මෙම අංශය විසින් අඛණ්ඩව පරිපාලනය කරන ලද අතර, එහි කාර්ය මණ්ඩලයට, ගනුදෙනුකරුවන්ට, අමුත්තන්ට ආරක්ෂිත පරිසරයක් සහතික කර, CAASL ට අයත් දේපළ ද ආරක්ෂා කර ඇත.

"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"



ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව

ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය

ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය යනු සිවිල් ගුවන්සේවා අධිකාරියේ ආයතනික කළමනාකරණ අංශයට අයත් වන අංශයක් වන අතර එය ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමේ වගකීම දරයි.

COVID-19 වසංගතය හේතුවෙන් එහි සැලසුම් කර ඇති බොහෝ වැඩ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අංශයට අභියෝග එල්ල විය. එසේම කර්මාන්තයට පහසුකම් සැලසීමට සහ ලොව පුරා අතරමං වූ මගීන් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමට ගුවන් ගමන් අනුමැතියට අදාළ නව ක්‍රියාකාරකම් මෙම අංශයට ලබා දෙන ලදී.

ජාත්‍යන්තරව පවතින තත්ත්වය

ජාත්‍යන්තර ගුවන් සමාගම් මෙහෙයුම්

වසර ආරම්භයේදී ශ්‍රී ලංකන් ගුවන් සමාගම් ඇතුළුව නියමිත ගුවන් සමාගම් 34 ක් ශ්‍රී ලංකාවට/ ලංකාවේ සිට සිය මෙහෙයුම් දිගටම කරගෙන ගියේය. Legacy Carriers ගුවන් මෙහෙයුම්කරුවන්ගේ ප්‍රධාන කොටස වන අතර ලෝකයේ ප්‍රධාන ගමනාන්ත වෙත/එමෙන්ම මගී සංචරණයට දායක වූ අත්‍යවශ්‍ය නොවන සේවාවන් ඉවත් කරන ගුවන් සමාගම් ("No-Frills" Carriers) ද විය. ලොව ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම් වන එමිරේට්ස් එයාර්ලයින්ස්, කොරියන් එයාර්, කැතේ පැසිෆික් එයාර්ලයින්ස්, එයාර් චයිනා, එතිහාඩ් එයාර්වේස්, ටර්කිෂ් එයාර්ලයින්ස්, සිංගප්පූරු එයාර්ලයින්ස් සහ කටාර් එයාර්වේස් යන සමාගම් 2020 වසරේදී ශ්‍රී ලංකාව වෙත සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

කෙසේ වෙතත්, මාර්තු මස මැදදී රජය විසින් පණවන ලද ගුවන් තොටුපල මගී සීමාවන් හේතුවෙන් සියලුම ගුවන් සමාගම්වලටම පාහේ ශ්‍රී ලංකාව වෙත සිය මෙහෙයුම් නවතා දැමීමට සිදු විය. ලෝක ව්‍යාප්ත සීමාවන් හේතුවෙන් ජාත්‍යන්තර ගුවන් සමාගම් කිහිපයක් ඉතා අඩු පරිමාණයෙන් සිය මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදී. කටාර් එයාර්වේස්, එමිරේට්ස්, ටර්කිෂ් එයාර්ලයින්ස්, චයිනා ඊස්ටර්න් එයාර්ලයින්ස් සහ එතිහාඩ් යන ගුවන් සමාගම් කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් මගී සීමාවන් පනවා තිබූ අතර එම කාල සීමාව තුළ සිය මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදී.

විදේශ රටවල අතරමං වූ ශ්‍රී ලාංකික මගීන් ගෙන්වා ගැනීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවය සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර, එමිරේට්ස්, කටාර් එයාර්වේස්, කුවේට් එයාර්වේස් සහ එතිහාඩ් එයාර්වේස් ද එවැනි ගුවන් ගමන් ක්‍රියාත්මක කළහ. සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව, ගුවන්සේවා බලධාරීන් පැමිණෙන මගීන් සංඛ්‍යාව සීමා කළ අතර සිවිල් ගුවන්සේවා අධිකාරිය සාධාරණ ලෙස ශ්‍රී ලංකාවට ක්‍රියාත්මක වන ගුවන් සමාගම් අතර මගී සංඛ්‍යා වෙන් කරනු ලැබීය.

භාණ්ඩ මෙහෙයුම්වල වර්ධනය

වසංගතය හේතුවෙන් ලොව පුරා මගී මෙහෙයුම් අඩු වූ නමුත් කොවිඩ්-19 පැතිර යාමේදී පවා භාණ්ඩ ප්‍රවාහනය වැඩි විය. ශ්‍රී ලංකාව වෙත ක්‍රියාත්මක වූ බොහෝ ගුවන්සේවාවන් ටික කලකට පසු මගී ගුවන්යානා භාවිතා කරමින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ අවශ්‍ය නියාමන අනුමැතිය සහිතව මැදිරි තුළ භාණ්ඩ ප්‍රවාහනය කරමින් නැවත මෙහෙයුම් ආරම්භ කරන ලදී. ලොට් පොලිෂ්, තායි එයාර් ඒෂියා, ෆ්ලයි ඩුබායි, එයාර් ඇරැබියා, ටර්කිෂ් එයාර්ලයින්ස් යනු එවැනි ක්‍රියාකරුවන් සඳහා උදාහරණ වේ. මැදිරි තුළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගුවන් සමාගම්වලට අනුමැතිය දුන්නේ CAASL හි මෙහෙයුම් අංශයෙනි.

ඉතියෝපියානු ගුවන්සේවාවක් වන ඉතියෝපියානු ගුවන් සේවය සහ පකිස්ථාන ගුවන් සේවයක් වන එයාර් ෆෝල්කන් නව ක්‍රියාකරුවන් ලෙස ශ්‍රී ලංකාවට භාණ්ඩ ගුවන් ගමන් ක්‍රියාත්මක කළේය.

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ජොහැන්නස්බර්ග් (දකුණු අප්‍රිකාව) සහ යන්ගොන් (මියන්මාරය) වැනි නව ගමනාන්ත වෙත භාණ්ඩ ප්‍රවාහනය ආරම්භ කළේය. ඉන්දියාව, ඔස්ට්‍රේලියාව, චීනය සහ තවත් බොහෝ ගමනාන්ත වෙත භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකා ගුවන්සේවා භාණ්ඩ මෙහෙයුම් කටයුතුවල සිය ස්ථානය තහවුරු කර ගත්තේය.

නාවික හුවමාරු මෙහෙයුම්

ලොව පුරා යාත්‍රාවල සේවය කරන නාවිකයින්ගේ සේවා වාරය අවසන් වූ පසු සාමාන්‍ය මගී ගුවන් ගමන් භාවිතා කරමින් සේවකයන් හුවමාරු කර ගැණුනි. පූර්ව කොවිඩ් තත්ත්වය යටතේ ක්‍රියාවලිය සුමටව හසුරුවන ලදී. කොවිඩ් වසංගත තත්ත්වය තුළ ගුවන් ගමන් නොමැති වීම හේතුවෙන් හුවමාරු ක්‍රියාවලිය සංකීර්ණ විය. දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල සහ වරායන් භාවිතා කරමින් මෙවැනි මෙහෙයුම්/හුවමාරු සඳහා අනුමැතිය ලබාදීමට CAASL කටයුතු කළේය. ස්පයිස් ජෙට් මත්තල දක්වා ක්‍රියාත්මක වෙමින් ගාල්ල වරාය හරහා නාවිකයින් හුවමාරු කර ගනිමින් මෙහෙයුම ආරම්භ කළේය. මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් තවත් ගුවන් සමාගම් කිහිපයක් විසින් නාවික හුවමාරු සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර වසර අවසානයේදී ඉන්ඩිගෝ සහ මෝල්ඩිවියන් එයාර්ලයින්ස් ද මෙහෙයුම් දිගටම කරගෙන ගියහ. මෙය නව ව්‍යාපාරික අවස්ථාවක් විවෘත කිරීමක් විය.

නව මෙහෙයුම්කරුවන් සහ අත්හිටුවීම්

අඩු මගී ඉල්ලුම සහ විවිධ රටවල හුදෙකලා කිරීම් හේතුවෙන් බොහෝ ගුවන් සමාගම් ශ්‍රී ලංකාව වෙත සිය මෙහෙයුම් නවතා දැමූහ. කෙසේ වෙතත්, ඉතියෝපියානු ගුවන්සේවා ශ්‍රී ලංකාවට භාණ්ඩ ප්‍රවාහනය සහ වරලත් මගී සේවා ආරම්භ කළේය. කුවේටය පදනම් කරගත් අඩු වියදම් ගුවන් සේවයක් වන ජසීරා එයාර්වේස් ශ්‍රී ලංකාව වෙත මෙහෙයුම් ආරම්භ කිරීමට කැමැත්ත පළ කළේය. වසර අවසානයේදී බලපත්‍ර ලබා දීම සඳහා ලේඛනගත කිරීම ආරම්භ කිරීමට ඔවුන්ට හැකි විය.

ජාත්‍යන්තර කුලී ගුවන්යානා, ආවස්ථික හා ව්‍යාපාරික පෙට් මෙහෙයුම්කරුවන්

අසුර් එයාර් (රුසියාව), ස්කයිඅප් (යුක්රේනය), රෝයල් ෆ්ලයිට්ස් (මොස්කව්), SCAT (කසකස්තානය), අයිෆ්ලයි (රුසියාව) යන කුලී ගුවන්යානා මෙහෙයුම්කරුවන් පස් දෙනෙකු 2020 IATA ශීත සෘතු කාලය තුළ ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. මෙම කුලී ගුවන්යානා මෙහෙයුම්කරුවන් හෝටල්, නවාතැන්, ප්‍රවාහන හා වෙනත් විනෝද චාරිකා සඳහා ගිවිසුම්ගත සංචාරකයින් සර්වග්‍රාහී පදනමින් ප්‍රවාහනය කිරීම හේතුවෙන් ශීත සෘතුවේ දී සාමාන්‍ය ගුවන්ගමන් මාලාවක් ක්‍රියාත්මක කරන මෙවැනි කුලී ගුවන්යානා මෙහෙයුම්කරුවන් අප දිවයිනේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

ආසන වෙන්කිරීම් සම්බන්ධීකරණය

2019-20 ශීත සෘතුවේ අවසාන කොටස සාමාන්‍ය ආසන වෙන් කිරීම යටතේ මුලින් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක විය. 2020 මාර්තු මාසයේදී මගී ගුවන් ගමන් සීමා කිරීමෙන් පසුව, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති සියලුම ස්ථාන අවලංගු කරන ලද අතර දුෂ්කර කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාව වෙත ක්‍රියාත්මක වන සියලුම ගුවන්සේවා සපයන්නන්ට සහාය වීම සඳහා විශේෂ ආසන වෙන් කිරීමේ යාන්ත්‍රණයක් භාවිතා කරන ලදී.

ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව

ක්‍රියාත්මක කරන ලද සෞඛ්‍ය ක්‍රමවේදයන් හේතුවෙන් මගීන් හැසිරවීමේ සීමාවක් පැවති අතර කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රැගෙන යන මගීන් සංඛ්‍යාව අනුව ගුවන් ගමන් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් පැන නැඟී ඇත. උපරිම මගී හැසිරවීමක් පවත්වා ගනිමින් ගුවන් ගමන් පැවැත්වීමට සමීප අධීක්ෂණයක් කර, ආසන වෙන් කිරීමේ විශේෂ ක්‍රියාවලියක් ආරම්භ කෙරිණි.

එසේම, ගුවන් සමාගම්වලට 2021 ගිම්හානය සහ 2021/22 ශීත සෘතුව දක්වා ආසන වෙන් කිරීම් ලිහිල් කිරීමේ යාන්ත්‍රණයක් පවත්වාගෙන යාමට අවසර දෙන ලදී.

වසර තුළ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, සැෆ්රන් එයාර් සහ ෆිට්ස් එයාර් යන ගුවන්සේවා බලපත්‍ර අලුත් කරන ලදී. නව ගුවන් බලපත්‍ර නිකුත් කර නැත. අලුත් කරන ලද වරලත් ගුවන්සේවාවවි වූයේ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ෆිට්ස් එයාර්, රිවී ස්කයිලාර්ක්, දයා ඒවියේශන්, මිලේනියම් එයාර්, සෙනොක් එයාර්, සකුරායි, ෆ්ලයි සඳර්න්, සිනමන් එයාර් සහ එෆ්-එයාර්වේස් ය. දයා ඒවියේශන් වසර තුළ සිය පුද්ගලික මෙහෙයුම් බලපත්‍රය අලුත් කරන ලදී.

ගුවන්සේවා වෙන්කිරීම් සහ ගාස්තු ගණනය කිරීම

ඉහත පාඨමාලාවේ 14 වන කණ්ඩායම වසර තුළදී අවසන් කරන ලදී. මෙම පාඨමාලාව ගුවන් තොටුපල වෙත සංචාරයකින් සහ සහභාගිවන්නන් සැබෑ ලෝක අභියෝගවලට නිරාවරණය කිරීම සඳහා සංචාරක නියෝජිතායතනයකින් සමන්විත වේ. මෙම පාඨමාලාව ආරම්භයේ සිට මේ දක්වා සිසුන් 147 දෙනෙකු උපාධි ලබා ඇත. අපගේ බොහෝ සිසුන් පිළිගත් ගුවන්සේවා සහ සංචාරක ආයතනවලට සම්බන්ධ වී ඇත. ඔවුන්ගෙන් ඇතැමෙක් ඔවුන්ගේම සංචාරක ආයතන ආරම්භ කර ඇත. පනවන ලද ප්‍රදේශ හුදෙකලා කිරීම් සහ සංචරණ සීමා හේතුවෙන් පසුකාලීන පාඨමාලාව නොපැවැත්විණි.

භාණ්ඩ ප්‍රවාහන නියෝජිතයින්ට බලපත්‍ර ලබාදීමේ රෙගුලාසි

CAASL හි නියාමන රාමුවට ගෙන ඒම සඳහා භාණ්ඩ ප්‍රවාහන නියෝජිතයින්ට බලපත්‍ර ලබා දීම සඳහා වර්ෂය තුළ රෙගුලාසි කෙටුම්පත් කර, ප්‍රසිද්ධ කරන ලදී. එය 2021 දී අවසන් කර ක්‍රියාත්මක කෙරේ.

සංචාරක නියෝජිතයින්

ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ (මගී) බලපත්‍රය (සංචාරක නියෝජිත බලපත්‍රය) නියාමනය කිරීම 1992 අංක 55 දරන ගුවන් සංතරණ පනතේ සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධාන බලපත්‍රලාභීන්ට මගීන්, භාණ්ඩ ප්‍රවාහනය සහ තැපැල් ගුවනින් ප්‍රවාහනය කිරීමට අවසර ලබා දෙයි. ශ්‍රී ලංකාව තුළ ව්‍යවැනි ව්‍යාපාර පවත්වාගෙන යාමට ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ (මගී) බලපත්‍රය අනිවාර්ය අවශ්‍යතාවයකි. නියෝජිතායතනයේ ප්‍රකාශිත ප්‍රාග්ධන හෝ ප්‍රාග්ධන දායකත්වය මත පදනම්ව A කාණ්ඩය සහ B කාණ්ඩය ලෙස බලපත්‍ර කාණ්ඩ දෙකක් ඇති අතර බලපත්‍රය වාර්ෂිකව අලුත් කළ හැකිය.

සමාලෝචිත වර්ෂය තුළ නියෝජිතයින් සඳහා නව බලපත්‍ර 23ක් නිකුත් කරන ලද අතර එම 23 දෙනාම A කාණ්ඩයේ වේ. A කාණ්ඩයේ බලපත්‍රලාභීන් 306 දෙනෙකු තම බලපත්‍රය අලුත් කර ගත් අතර B කාණ්ඩයේ බලපත්‍රලාභීන් 19 දෙනෙකු බලපත්‍රය අලුත් කර ඇත. කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් බොහෝ නියෝජිතයින් තම ව්‍යාපාරය අවසන් කර ඇත. B කාණ්ඩයේ හිමිකරුවන් කිහිප දෙනෙකු ඔවුන්ගේ බලපත්‍රය A කාණ්ඩයට උසස් කර ඇත.

වසංගතය හේතුවෙන් සංචාරක ආයතනවල සැලසුම්ගත පරීක්ෂණ සිදු වූයේ වසරේ මුල් මාස 3 තුළ පමණි. වසංගතය ආරම්භ වන තෙක් සංචාරක ආයතන 46ක් පරීක්ෂාවට ලක් කරන ලදී. CAASL විසින් ප්‍රදේශ හුදෙකලා කිරීමේ කාල පරිච්ඡේදය තුළ ඔවුන්ගේ බලපත්‍ර ප්‍රමාදයන් සඳහා නියෝජිතයින් සඳහා වන දඩ මුදල් සඳහා විශේෂ නිදහස් කිරීම් ලබා දෙන ලදී.

මාසය	ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ බලපත්‍රය							
	මූලික ගැටලුව				අලුත් කිරීම			
	කාණ්ඩය A		කාණ්ඩය B		කාණ්ඩය A		කාණ්ඩය B	
	2019	2020	2019	2020	2019	2020	2019	2020
ජනවාරි	1	8	0	0	40	61	7	6
පෙබරවාරි	4	12	2	0	19	32	3	9
මාර්තු	2	3	5	0	42	19	4	1
අප්‍රේල්	3	0	1	0	19	0	3	0
මැයි	4	0	3	0	35	3	5	1
ජූනි	3	0	1	0	33	56	3	2
ජූලි	4	0	3	0	38	34	5	0
අගෝස්තු	2	0	2	0	25	21	11	0
සැප්තැම්බර්	4	0	3	0	29	32	8	0
ඔක්තෝම්බර්	4	0	1	0	48	6	5	0
නොවැම්බර්	1	0	2	0	44	19	2	0
දෙසැම්බර්	6	0	3	0	38	23	9	0
සමස්ත	38	23	26	0	410	306	65	19

වගුව 01 - 2019 සහ 2020 ගුවන් ප්‍රවාහන සේවා සපයන්නන්ගේ බලපත්‍ර නිකුත් කිරීම්

ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව

ශ්‍රී ලංකාවේ සේවය කරන/ඉගෙනුම ලබන විදේශිකයන් සහ සිසුන් සඳහා වීසා නිර්දේශ

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුව සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ (DGCA) නියෝගවලට අනුව, දේශීය ගුවන්සේවා ආයතනයක සේවය කරන සියලුම විදේශිකයින්ට ශ්‍රී ලංකාව වෙනුවෙන් රැකියා බලපත්‍රය/නේවාසික වීසා ලබා ගැනීම සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් නිර්දේශ ලබා ගත යුතුය. CAASL මගින් ගුවන්සේවා කර්මාන්තය වෙනුවෙන් එවැනි ඉල්ලීම් වෙනුවෙන් නිර්දේශ රේඛීය අමාත්‍යාංශය හරහා නිකුත් කරයි. DGCA හි නියෝගයක් අනුව 2019 ජූනි මාසයේදී නව ක්‍රියා පටිපාටියක් හඳුන්වා දෙන ලද අතර එමඟින් සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහභාගී විය යුතුය.

කොවිඩ්-19 පැතිරීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පටිපාටිය පැවැත්විය නොහැකි විය. රට තුළ පවතින කොවිඩ්-19 තත්ත්වය සහ සංචරණ සීමා හේතුවෙන්, ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් වීසා දීර්ඝ කිරීම් ලබා දෙන ලදී.

මෙම අංශය විසින් විදේශීය තාක්ෂණික හා තාක්ෂණික නොවන විදේශීය කාර්ය මණ්ඩලය ඇතුළුව කර්මාන්තයට වීසා නිර්දේශ 41 ක් නිකුත් කර ඇති අතර විදේශීය සිසුන් සඳහා වීසා නිර්දේශ 99 ක් නිකුත් කර ඇත.

සංචාරක නියෝජිතයින්ට සහ ගුවන් ප්‍රවාහන සමාගම්වලට එරෙහිව පාරිභෝගික පැමිණිලි

අදාළ වර්ෂය තුළ එවැනි පැමිණිලි 52ක් මගීන්ගෙන් ලැබුණු අතර වසර අවසානයේදී 20ක් විසඳා අවසන් කිරීමට එම අංශය සමත් විය. ඉතිරි පැමිණිලි විමර්ශනය කරමින් පවතින අතර ධනාත්මක ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 හේතුවෙන් ගමනාගමනයට බාධා ඇති බැවින් පාරිභෝගිකයින් ගුවන් සමාගමෙන් මුදල් ආපසු ඉල්ලා තිබේ.

එවැනි පැමිණිලිවලින් වැඩි ප්‍රමාණයක් ගුවන් ටිකට්පත් ගාස්තු ආපසු ගෙවීම සම්බන්ධ වීවා වන අතර ලැබුණු පැමිණිලි වර්ගීකරණය පහත රූප සටහන පෙන්වයි.

2020 මගී පැමිණිලි



රූප සටහන 1 - 2020 වසරේ මගී පැමිණිලි

භූමි ආධාරක සේවා අවසරපත්‍ර - (ස්ථාවර පදනමේ මෙහෙයුම්කරු අවසරපත්‍ර)

අදාළ වර්ෂය තුළ භූමි ආධාරක සේවා බලපත්‍ර 7ක් අලුත් කරන ලද අතර තවත් 3ක් නව බලපත්‍ර ලබා ගන්නා ලදී. අනාගතයේදී සියලුම ව්‍යාපාරික පෙට්/පෞද්ගලික පෙට් ක්‍රියාකරුවන් සහ තාවකාලික වරලත් ක්‍රියාකරුවන් CAASL අනුමත භූමි ආධාරක සේවා සපයන්නන්ගේ සහාය ඇතිව ඔවුන්ගේ ගුවන් ගමන් ක්‍රියාත්මක කළ යුතු වනු ඇත.

කර්මාන්ත මෙහෙයුම් සඳහා සහාය වීමට කළ කොවිඩ්-19 ආශ්‍රිත ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ (AT/ER) සහ කළමනාකරු (ASTR) මෙම දුෂ්කර කාලවලදී කර්මාන්තය ජීවමානව තබා ගැනීමට සහාය වීම සඳහා අධිකාරියේ කොවිඩ්-19 ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරිව නිරත විය.

ආපසු ගෙන්වා ගැනීම සඳහා මගී අනුමැතිය

පැමිණෙන මගීන් සඳහා කොවිඩ්-19 සීමා කිරීම් හේතුවෙන් ජාතික කොවිඩ්-19 කාර්ය සාධක බලකාය විසින් අනුමත කිරීමේ ක්‍රියාවලියක් පිහිටුවන ලදී. අනුමත කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවට පැමිණෙන ඕනෑම මගියෙකු සඳහා අනුමැතිය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබා දෙන පළමු අනුමැතියෙන් සහ CAASL වෙනුවෙන් අධ්‍යක්ෂ (AT/ER) විසින් ලබා දෙන 2 වන අනුමැතියෙන් සමන්විත විය. ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන්වල පැමිණි මගීන් ද ඇතුළුව මගීන්ට රට තුළට පැමිණීමට පහසුකම් සැලසීම සඳහා වසර තුළ එවැනි අනුමත කිරීම් 20,000 ක් පමණ සකස් කරන ලදී.

සිදු කරන ලද මෙහෙයුම් වලින් බහුතරයක් අතරමං වූ ශ්‍රී ලාංකිකයන් ගෙන්වා ගැනීම සඳහා වූ ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් විය. ඒ හා සමානව ගුවන් සමාගම්වල නිත්‍ය ගුවන් ගමන්වල නිරන්තර කාලසටහන්ගත වෙනස්කම් සහ තාවකාලික මෙහෙයුම් සිදු විය. මෙම දුෂ්කර කාලය තුළ ඔවුන්ගේ මෙහෙයුම් සක්‍රීය කිරීම සඳහා ගුවන් සමාගම් වෙත එවැනි අනුමැතීන් 1,061 ක් ලබා දෙන ලදී.

මානව සම්පත් හා දේපළ කළමනාකරණ අංශය

මානව සම්පත් හා දේපළ කළමනාකරණ අංශය (HRPM) මගින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAASL) රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් සේවයේ නියුක්ත වන බව සහතික කරයි. තවද, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) තුළ ඔවුන්ගේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට හා වැඩිදියුණු කර ගැනීමට තනි පුද්ගලයන්ට සහ සේවක කණ්ඩායමට පහසුකම් සැලසීමට සහ ඔවුන් ඒ සඳහා පෙළඹවීමට මෙම අංශය මගින් අවස්ථා නිර්මාණය කරයි. නිලධාරීන් පරිපාලනය කිරීම සහ අධිකාරියට පවරා ඇති දේපළ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ද මෙම අංශය වගකිව යුතු වේ.

සමාලෝචිත වර්ෂය තුළ, කාර්ය මණ්ඩල රීති සහ පරිපාලන ක්‍රියාපටිපාටි සංග්‍රහයේ (SLCAP 5000) මාර්ගෝපදේශ වශයෙන් දක්වා ඇති අවශ්‍යතාවලට අදාළ වන අරමුණු, ක්‍රියාපටිපාටි, සුදුසුකම්, සීමාවන් සහ නිදහස් කිරීම් (ඇත්නම්) ඒ පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන මානව සම්පත් ප්‍රතිපත්ති චකතුවක් සමග ක්‍රියාත්මක වන මානව සම්පත් හා දේපළ කළමනාකරණ අංශය (HRPM) අධිකාරියට එහි ක්‍රමෝපායික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අඛණ්ඩව සහාය ලබා දෙයි. අධිකාරිය සිය ප්‍රමුඛතා ඉටු කිරීම සඳහා නියම කර ඇති

ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව

අභිමතාර්ථ, අරමුණු සහ අපේක්ෂා සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය සෑමවිටම ස්ථිරසාර අදහස් ප්‍රකාශ කිරීමේ බලයක් පවත්වා ගෙන යයි.

සංවිධානාත්මක ප්‍රතිසංස්කරණ හා මණ්ඩලිකරණය

මූලික වශයෙන් දක්ෂ හා විශ්වසනීය ගුවන්සේවා නිරුපද්‍රවතා නියාමකයෙකු වීමේ අරමුණ මත පදනම්ව, CAASL හි ඉහළින්ම විකාශනය වූ සහ අනුල්ලංඝනීය බඳවාගැනීමේ පටිපාටිය මගින් සියළුම සේවකයින් අපේක්ෂිත ප්‍රතිඵල සහ සහජ හැකියාවන් ප්‍රශස්තීකරණය සඳහා ක්‍රියාත්මක කරනු ලබන ක්‍රම සහ පද්ධති පිළිබඳ පැහැදිලි අදහසක් සහිතව CAASL වෙත ප්‍රවේශ වන බව සහතික කරයි.

අධිකාරියේ කාර්යයන් මෙහෙයවීම සඳහා කුසලතා පූර්ණ, දක්ෂ ශ්‍රම බලකායක් සැපයීම සඳහා මානව සම්පත් හා දේපළ කළමනාකරණ (HRPM) අංශය විසින් සමාරම්භක පියවර ගෙන ඇත. එබැවින්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, CAASL හි අබණ්ඩව මෙහෙයුම් කටයුතු සිදු කිරීම සහතික කිරීම සඳහා වඩාත් සුදුසු අපේක්ෂකයන් බඳවා ගැනීම මගින් පුරප්පාඩු වූ තනතුරු පිරවීම සඳහා මානව සම්පත් හා දේපළ කළමනාකරණ (HRPM) අංශය, දැවැන්ත ප්‍රයත්නයක් දරන ලදී. කෙසේ වෙතත්, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුර වෙනස් කිරීම හැර 2020 වර්ෂයේදී නව බඳවා ගැනීම් සිදු නොවීය. 2020 දෙසැම්බර් 31 වන විට කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව එකසිය හැත්තෑ හය දෙනෙකු (176) බවට පත් විය. වර්තමාන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ධූරාවලි ඉණිමඟේ ඉහළට නැඟීමට වේදිකාවක් නිර්මාණය කරමින්, 2019 වර්ෂයේ දී ඊළඟ මට්ටම සඳහා උසස්වීම් එකක් (01) ලබා දෙන ලදී.

අනුයුක්ත කර ඇති කාර්යමණ්ඩල සාමාජික කාණ්ඩ



රූපය 01 - 2020.12.31 දින වන විට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසාන වන විට රූප සටහන 01 හි දක්වා ඇති පරිදි, CAASL කාර්ය මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී හැර ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ නිලධාරීන් එක් (1) අයෙකුගෙන් ද, ජ්‍යෙෂ්ඨ කළමණාකාර කාණ්ඩයේ නවයක් (9) සහ කළමනාකාර කාණ්ඩයේ විසිහතර දෙනෙකුගෙන් (24) සමන්විත වේ. වත්මන් සංඛ්‍යාලේඛනවලට අනුව, බලාත්මක/මෙහෙයුම්/ව්‍යාප්ති කාණ්ඩයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හතළිස් හතරක් (44) සේවයේ යොදවා ඇති අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් හය (6) දෙනෙක් කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇත. තවද, කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකු (5) කළමනාකරණ සහකාර - තාක්ෂණික සහ පනස් එක් (51) කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන ලෙස සේවයේ යොදවා ඇත. ප්‍රාථමික මට්ටමේ පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු අය යටතේ, එක් එක් කාණ්ඩය සඳහා පිළිවෙලින් කාර්ය මණ්ඩල සාමාජිකයින් දහඅට (18) සහ දහහත් (17) දෙනෙක් බැගින් සේවයේ යොදවා ඇත.

කෙසේ වෙතත්, 2019 සැප්තැම්බර් මාසයේ සිට මැතිවරණ ප්‍රකාශය සහ රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හේතුවෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සීමා කරන ලද අතර, රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව 2020 සැප්තැම්බර් මාසයේදී බඳවා ගැනීමේ ක්‍රියාවලිය සීමා කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ CAASL විසින් 0.57% ක පිරිවැටුම් අනුපාතයක් වාර්තා කර ඇත.

කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩල සුභසාධන පහසුකම්



රූපය 02

කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සංඛ්‍යාව ඉහළ යාම නොසලකා හරිමින්, අධිකාරිය මූලික වශයෙන් අවධානයක් යොමු කරන සේවකයින්ගේ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන, 01 වන රූපයේ දක්වා ඇති, පුළුල් පරාසයක වූ සුබසාධන පහසුකම් අබණ්ඩව සැපයීමට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) මගින් කටයුතු කරන ලදී.

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සේවකයින්ට සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින් සඳහා නිරන්තරයෙන් ම ප්‍රතිලාභ ලබා ගත හැකි වූ සුභසාධන පහසුකම බවට පත්ව තිබුණි. වසර තුළ 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා කාලය සඳහා රුපියල් හාරලක්ෂ තුන්ලක්ෂ හැත්තෑ පන්දහස් හත්සිය අසූපහක් (රු. 4,375,785.00) ක බාහිර රෝගී ප්‍රතිලාභ යටතේ සමස්ත හිමිකම් ඉල්ලීම් එක් දහස් අසූ

ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව

හතරක් (1084) ඉදිරිපත් කර ඇත. එම කාලසීමාව තුළ සේවකයින් සඳහා එක් මිලියන පන්ලක්ෂ අනූ එක් දහස් හත්සිය හැත්තෑ හතරක (රු. 1,591,774.00) වටිනාකමක් ඇති වෛද්‍ය රක්ෂණ ගෘහස්ථ හිමිකම් ඉල්ලීම් දාහතක් (17) ද ප්‍රදානය කර ඇත.

හදිසි අනතුරු රක්ෂණාවරණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග අළුත් කරන ලද අතර පරීක්ෂකවරුන්ට ඔවුන්ගේ සෞඛ්‍ය, නිරුපද්‍රවතාව සහ සුරක්ෂිතතාවට හානිකර තත්ත්වයන්ට මුහුණදීමට ඇති අවදානම ආවරණය කිරීම සඳහා විශේෂ ආවරණයක් ලබා දෙන ලදී.

රූප සටහන 03 හි දක්වා ඇති පරිදි, මෙම අධිකාරිය විසින් පිහිටුවන ලද කාර්ය මණ්ඩල ණය වැඩසටහන මඟින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට විශාල මූල්‍ය ආධාරයක් ලබා දී තිබේ.



රූප සටහන 03 - ණය ආකෘතිය

CAASL කාර්ය මණ්ඩලයට ණය ප්‍රදානය කිරීමට ද පහසුකම් සලසන ලද අතර 2020 වර්ෂය තුළ සේවක සේවිකාවන් තිස් අටක් (38) සඳහා ආපදා ණය වශයෙන් රුපියල් දහතුන් මිලියන හතළිස් හතර දහස් හැට තුනක මුදලක් (රුපියල් 13,044,063.00) ප්‍රදානය කරන ලදී. මීට අමතරව සේවකයින් නව දෙනෙකු සඳහා මෝටර් රථ මිලදී ගැනීම සඳහා රුපියල් තිස් එක්කෝටි හාරලක්ෂ තිස් දහස් හාරසියයක (රු. 31,430,400.00) මුදලක් ණය වශයෙන් ලබා දෙන ලදී. සේවකයින් පස් දෙනෙකු (5) සඳහා මෝටර් බයිසිකල් ණය වශයෙන් රුපියල් මිලියන තුන්ලක්ෂ හැට හය දහස් හත්සියයක (රු. 1,366,700.00) මුදලක් ලබා දෙන ලදී. මීට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ රුපියල් එක්ලක්ෂ හතළිස් දහසක් (රු. 140,000.00) ලබා දෙමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් හය දෙනෙකුට (6) පාපැදි මිලදී ගැනීමට අධිකාරිය සහාය ලබා දී ඇත.

ඊට අනුරූපීව අධිකාරියේ සහාය ඇතිව කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා දේපල ණය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කෙරේ. 2020 වර්ෂයේදී, දේපළ ණය යෝජනා ක්‍රමය හරහා කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු (2) දෙනෙකුට ප්‍රතිලාභ ලබා දී ඇති අතර ඔවුන්ට රුපියල් මිලියන පන් ලක්ෂ තුන්ලක්ෂ පනස් දෙදහස් පන්සිය හතළිස් දෙකක් (රු. 5,352,542.00) ප්‍රදානය කරන ලදී.

කාර්ය මණ්ඩල සාමාජිකයින් හතළිස් එක් (41) දෙනෙකු සඳහා වර්ෂය තුළ රුපියල් හයලක්ෂ පහළොස් දහසක (රු. 615,000.00) උත්සව අත්තිකාරම් නිකුත් කර ඇත. මීට අමතරව, COVID 19 කාල සීමාව තුළ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. රුපියල් හැට නවලක්ෂ පනස් දහසක් (රු. 6,950,000.00) ප්‍රදානය කරමින් කාර්ය මණ්ඩලයේ එකසිය තිස් නව (139) දෙනෙකුට මෙම විශේෂ ණය මුදලින් පහසුකම් සැලසිණි.

සුබසාධන පහසුකම් තන්ත්‍රය වැඩි දියුණු කරමින් 2020 වර්ෂයේදී කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා දුම්රිය වරෙන්තු එකක් (01) නිකුත් කර ඇත.

පුහුණුවීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සහ රැස්වීම්

අධිකාරියේ අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය නිපුණතා සහ දැනුම සේවකයින් විසින් වර්ධනය කර ගන්නා බව සහතික කිරීම සඳහා CAASL මඟින් මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම සහ එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පෙළ ගැසී සිටින සඵලදායී ශ්‍රම බලකායක් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. පුහුණු ආයෝජන තුළ දේශීය හා විදේශීය පුහුණුව, සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් සමන්විත විය. තවද, අධිකාරිය මෙන්ම දිවයින ද නියෝජනය කිරීම සඳහා විවිධ රැස්වීම්, සම්මන්ත්‍රණ සහ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා CAASL කාර්ය මණ්ඩල සාමාජිකයින් සහභාගී කරවන ලදී.

විදේශ රටවල දී පිරිස් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දීම සම්බන්ධ සීමා තිබියදීත්, දේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් තුන්ලක්ෂ තිස් දෙදහස් හැටක් (රු. 332,060.00) හා ජාත්‍යන්තරව පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් හයලක්ෂ විසිදෙදහස් අටසිය අනූ දෙකයි ශත දොළහක් (රු. 622,892.12) වියදම් කර ඇත. අන්තර්ජාල පුහුණු සඳහා අධිකාරිය විසින් රුපියල් මිලියන හත්ලක්ෂ තිස් හයදහස් එකසිය හැට අටක් (රු. 1,736,168.25) වැය කරන ලදී. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් එකසිය තිස් නව දෙනෙකුට (139) පුහුණුව සඳහා පහසුකම් සපයන ලදී.

ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව

2020 වසරේ පුහුණු සැසි



05 වන රූපය

එසේම, ජාත්‍යන්තර වශයෙන් පවත්වනු ලබන විවිධ රැස්වීම්, පරීක්ෂණ සහ සම්මන්ත්‍රණ සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් හය (6) දෙනෙකු සහභාගී වී ඇති අතර CAASL රුපියල් පන්ලක්ෂ හතළිස් හතර දහස් දෙසිය හැට නවයක් සහ ශත අසූ තුනක් (රු. 544,269.83) වී වෙනුවෙන් වැය කර ඇත.

කාර්ය මණ්ඩලයේ පොදු පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඇති අතර අධ්‍යක්ෂ සහ ඊට වැඩි කාර්ය මණ්ඩල කාණ්ඩය සඳහා "Train the trainer" යන මාතෘකාව යටතේ එක් ලක්ෂ අනූදහසක් (රු. 190,000.00) වැය කර විශේෂ පුහුණුවක් ලබා දී ඇත. අභ්‍යන්තර පුහුණුකරුවන් විසින් අධිකාරියේ කාර්යාල සහායකයින් දාහතක් (17) දෙනෙකුගේ කුසලතා නංවාලීම සඳහා පවත්වන ලද "කාර්යාල සහායකයින් සඳහා ප්‍රායෝගික පුහුණු සැසිය" වැඩසටහන සඳහා පහසුකම් සපයන ලදී.

තාක්ෂණික පුස්තකාලය

තාක්ෂණික පුස්තකාලය දැනුම සොයන අයගේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක වන අතර ගුවන්සේවා රෙගුලාසි යාවත්කාලීන කිරීම් ඇතුළුව ගෝලීය ගුවන්සේවා කර්මාන්තය පිළිබඳ ප්‍රවර්තන හා සවිස්තරාත්මක තොරතුරු එමගින් ඉදිරිපත් කෙරේ.

සමාලෝචිත වර්ෂය පුරාවට බාහිර පරිශීලකයින් තිස් දෙනෙකු (30) තාක්ෂණික පහසුකම් භාවිතා කර ඇති අතර 2020 වසර සඳහා පුස්තකාලයට නව ප්‍රකාශන මිලදී ගැනීම සඳහා රුපියල් එක්ලක්ෂ තිස් එක් දහස් අටසිය දහහතරක මුදලක් (රු. 131, 814.40) වැය කර ඇත. ඊට අමතරව, කාර්ය මණ්ඩලය අතර යාවත්කාලීන බෙදා හැරීම වැඩි දියුණු කිරීමේ අරමුණින් ප්‍රධාන වශයෙන් කාර්මික පුස්තකාලය මඟින් ආංශික පුස්තකාල නඩත්තුව අබණ්ඩවකරන ලදී. ICAO ලේඛන සහ ප්‍රකාශන 442ක් විමසා, වසර තුළ තිස් හතක් (37) සහ සමස්තයක් ලෙස චකසිය දෙකක් (102) යාවත්කාලීන කර ඇති අතර, රාජ්‍ය ලිපි හාරසිය දහසයක් (416) අදාළ අංශ/ශාඛා අතර බෙදා හැර ඇත.

CAASL නිල වෙබ් අඩවිය

CAASL නිල වෙබ් අඩවිය සාමාන්‍ය ජනතාවට තොරතුරු බෙදාහැරීමේ අත්‍යවශ්‍ය ප්‍රභවයකි. නවීකරණය කිරීම තුළත් වන පරිදි CAASL වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලද අතර පරිශීලකයින් දෙලක්ෂ හතළිස් හතර දහස් තුන්සිය විසි දෙදෙනෙක් (244,322) මෙම වෙබ් අඩවිය නරඹා ඇති අතර වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරන ලද සිවිල් ගුවන්සේවාව සම්බන්ධ තොරතුරු පිළිබඳව මහජනතාව අතර පවතින උනන්දුව මෙමගින් දැක්වේ.

දේපළ කළමනාකරණ ක්‍රියාකාරකම්

HRPM අංශයේ ආයතනික කටයුතු සහ දේපළ කළමනාකරණය, පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම තුළින් අධිකාරියේ ප්‍රධාන අරමුණට අබණ්ඩව දායක වේ. තවද, පහසුකම් සැපයීම තුළින් අබණ්ඩව වැඩ කිරීමේ ක්‍රියාවලිය පවත්වා ගැනීම සඳහා මෙම අංශය අනෙකුත් අංශවලට විවිධාංගීකරණය කරන ලද සේවා සපයයි.

2017/12/12 දිනැති අංක 2050/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, ඒ ආශ්‍රිත දේපළ, මඩකලපුව ගුවන්තොටුපල, රත්මලාන ගුවන්තොටුපල ඇතුළුව CAASL වෙත පවරා ඇති හඳුනාගත් දේපළ ලියාපදිංචි කිරීම CAASL විසින් ආරම්භ කර ඇත. HRPM අංශය CAASL නමින් පවරා ඇති ඉඩම් ලියාපදිංචි කිරීමට අදාළ රාජකාරී සඳහා සහභාගී වී ඇත.

ඒකාබද්ධ කළමනාකරණ ශාඛාව

මූල්‍ය හා ආදායම් කළමනාකරණ අංශය

වැඩසටහන් අයවැය

මෙහෙයවීම සහ කළමනාකරණය, ගුවන් අවකාශ හා ගුවන්සේවා සුරක්ෂිතතා නියාමනය, පියාසැරි නිරුපද්‍රවතා නියාමනය සහ සංස්ථාපිත කටයුතු සහ ආර්ථික නියාමනය යන ප්‍රධාන වැඩසටහන් හතරක් යටතේ ඊළඟ වර්ෂයේ වියදම් නියම කරනු ලබන 2020 වර්ෂය සඳහා වැඩසටහන් අයවැය පිළියෙළ කෙරේ. සංශෝධිත ඇස්තමේන්තුගත පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලට සාපේක්ෂව රුපියල් මිලියන 963 ක් ලෙස ගණනය කරන ලද පුරෝකථන සංශෝධිත ආදායම මිලියන 937 කි. පසුගිය වසරේ ඇස්තමේන්තුගත වියදමට සාපේක්ෂව ඇස්තමේන්තුගත වියදම 57% ක අඩුවීමක් පෙන්නුම් කර ඇති අතර පෙර වසරේ ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව පුරෝකථන ආදායම 63% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAASL) ආදායම සහ වියදම්

CAASL ආදායම පෙර වසරේ සැබෑ ආදායම රුපියල් මිලියන 2,504 සිට රුපියල් මිලියන 985 දක්වා හා සසඳන විට 61% ක අඩුවීමක් පෙන්නුම් කරයි. විදේශීය විකුණුම් අධිභාරයෙන් සහ අපගමන බද්දේ සේවා ගාස්තුවලින් ලැබෙන ආදායමේ සැලකිය යුතු වැඩිවීමක් දැකිය හැකි විය.

පසුගිය වර්ෂයේ තථ්‍ය වියදමට (Actual expenditure) සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තථ්‍ය වියදම් (Actual expenditure) 8% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

කළමනාකරණ තොරතුර

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

ආදායම - 2019ට සාපේක්ෂව 2020



මූළු ආදායම - 2019ට සාපේක්ෂව 2020



විදේශීය විකුණුම් අධිභාරයෙන් ලද ආදායම 2019ට සාපේක්ෂව 2020



ප්‍රාග්ධන වියදම් - 2019ට සාපේක්ෂව 2020



පුනරාවර්තන වියදම් - 2019ට සාපේක්ෂව 2020



අයවැය හා සත්‍ය වියදම් - 2020



ප්‍රධාන කාර්ය සාධන දර්ශක

CAASL කාර්ය සාධන සාරාංශය

නිරුපද්‍රතා සහ සුරක්ෂිතතා අධීක්ෂණ රාජකාරී සහ කාර්යයන (නිකුත් කරන ලද රෙගුලාසි/නිවේදන/රීති සංඛ්‍යාව)	2020	2019
ගුවන්යානා මෙහෙයුම්	2	3
ගුවන්යානා ලියාපදිංචි කිරීම හා ගුවන් යෝග්‍යතාව	2	0
ගගන යාත්‍රාංගන	1	0
ගුවන් සංතරණ සේවා	7	13
ගුවන්සේවා සුරක්ෂිතතාව	4	4

සංවිධාන/පුද්ගලයන් මුල්වර සහතික කිරීම	2020	2019
ගුවන් ප්‍රවාහන සමාගම් (විදේශීය)	3	8
නඩත්තු සංවිධාන	11	4
ගුවන් නියමුවන්	106	246
ගුවන් ගමන් පාලකවරුන්	0	2
ගුවන්යානා නඩත්තු බලපත්‍රධාරීන්	18	73
පියාසර මෙහෙයුම් නිලධාරීන් (පියාසර පිටත් කරන්නන්)	0	2
පියාසර උපදේශකවරුන්	1	1
සහකාර පියාසර උපදේශකවරුන්	3	7
භූමි උපදේශකවරුන්	0	9
මැදිරි පිරිස් සාමාජිකයින්	0	76
පියාසැරි පාසල් බලපත්	2	0

සහතික කරන ලද සංවිධාන/පුද්ගලයින් සෝදිසි කිරීම	2020	2019
රැම්ප් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා	20	185
රැම්ප් පරීක්ෂණ - මෙහෙයුම්	7	61
ගගන යාත්‍රාංගන පරීක්ෂණ	40	42
ගුවන් ගමන් සේවා පරීක්ෂණ	32	36
ගුවන්යානා නඩත්තු සංවිධාන පරීක්ෂණ	2	15
පියාසැරි පුහුණු පාසල් පරීක්ෂණ	14	24
ගුවන්සේවා සුරක්ෂිතතා සෝදිසි කාර්යයන් පැවැත්වීම (පරීක්ෂණ, විගණන, සමීක්ෂණ, විභාග)	55	65
අනුකාරක පරීක්ෂණ	3	3
අතරමැදි පරීක්ෂණ	2	9
අන්තරායකාරී ද්‍රව්‍ය පරීක්ෂණ	10	17
ස්ථාන පහසුකම් පරීක්ෂණ - මෙහෙයුම්	0	2
ගගන නාවික තොරතුරු සේවා පරීක්ෂණ	10	15
ප්‍රධාන මූලස්ථාන පරීක්ෂණ/උපදේශක නිරීක්ෂණ	8	12
නම්කරන ලද පිරික්සුම් නියමු (DCP) අධීක්ෂණය	26	20

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

සම්පූර්ණ කරන ලද විගණන	2020	2019
ගුවන්සේවා සුරක්ෂිතතාව	0	2

CAASL හි ප්‍රධාන කාර්ය සාධන දර්ශක

මෙහෙයුම් සහ කළමනාකරණ අංශය	2020	2019
අධිකාරියේ රැස්වීම්	8	9
විගණන කමිටු රැස්වීම්	6	3
මාණ්ඩලික කමිටු රැස්වීම්	3	3
කර්මාන්ත උපදේශක රැස්වීම්	79	92
බාහිර, සංවිධානය/පුද්ගලිකයින් සඳහා පත් කිරීම	184	203
ලැබුණු ලිපි ගණන	6,226	6,616

නීති කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකය (LA&E)	2020	2019
නිකුත් කරන ලද/සමාලෝචිත/නීති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කරන ලද රෙගුලාසි	0	7
ගිවිසුම් / අවබෝධතා ගිවිසුම්	17	17
සහභාගී වී ඇති නීතිපති දෙපාර්තමේන්තුවේ/නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ උපදේශන සංඛ්‍යාව	13	19
නීතිමය කටයුතු සම්බන්ධයෙන් CAASL/DGCA වෙත නීති උපදෙස් ලබා දීම්	59	22
උසාවියේ පෙනී සිටීම්	26	22
සකස් කර ඇති නීතිමය ලියකියවිලි	4	11

ගුවන්සේවා සුරක්ෂිතතා අංශය (AVSEC)	2020	2019
ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන (NCASP) සහ අතිරේක ලේඛන - සමාලෝචන/සංශෝධන	5	17
දේශීය ගුවන් ප්‍රවාහන සමාගම්/ගුවන්තොටුපල මෙහෙයුම්කරු (ගුවන්සේවා ආරක්ෂක වැඩසටහන) - ඇගයීම්/සමාලෝචන	15	3
විදේශීය ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම්කරු (ගුවන්සේවා ආරක්ෂක වැඩසටහන) - ඇගයීම්/සමාලෝචන	27	41
ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණු වැඩසටහන/විෂය නිර්දේශ - ඇගයීම්/සමාලෝචන	1	5
ගුවන්සේවා සුරක්ෂිතතා සෝදිසි කාර්යයන් සිදු කිරීම (පරීක්ෂණ) (Inspection), විගණන, සමීක්ෂණ, පරීක්ෂණ (Tests)	55	65
ගුවන්සේවා සුරක්ෂිතතා කළමනාකරුවන් සහතික කිරීම සහ යළි සහතික කිරීම	2	22
ගුවන්සේවා සුරක්ෂිතතා උපදේශකවරුන් සහතික කිරීම සහ යළි සහතික කිරීම	13	7
ගුවන්සේවා සුරක්ෂිතතා සැසිකරුවන් සහතික කිරීම සහ යළි සහතික කිරීම	452	806
ගුවන්යානා තුළ අවි ආයුධ රැගෙනයාමට අනුමැතිය	62	200
ගුවන් තොටුපොළ පිවිසුම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ	37	145
ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණු පාඨමාලා/දේශන/ඉදිරිපත් කිරීම්	1	4
රජයේ සහ අනෙකුත් ආයතන සඳහා විශේෂඥ සේවා සැපයීම	2	4

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

පරිසරය, පරීක්ෂණ සහ ව්‍යාපෘති (ER&P)	2020	2019
ජාත්‍යන්තර ගුවන්සේවා සංඛ්‍යාන වාර්තා	314	389
දේශීය ගුවන්සේවා සංඛ්‍යාන වාර්තා	43	96
ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංඛ්‍යාන වාර්තා	28	26
අභ්‍යන්තර ගුවන් තොටුපල සංඛ්‍යාන වාර්තා	17	24
යවන ලද ICAO වාර්තා කිරීමේ ආකෘති	26	60
CAASL වැඩ කාර්යසාධන සංඛ්‍යාලේඛන වාර්තා	181	192
රජයේ ආයතනවලට/පොදු මහජනයාට සහ CAASL වෙනත් අංශවලට සංඛ්‍යාලේඛන සැපයීම	15	27
නිකුත් කරන ලද ලංසු/යෝජනා (Bids/RFP) සඳහා ඉල්ලීම්	28	3
පිරිනමන ලද කොන්ත්‍රාත්තු	42	2
සකස් කරන ලද CAASL අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා	2	4
CAASL වැඩමුළු/කාර්යයන්/සිදුවීම්/විශේෂ දින සඳහා පරිපාලන සහාය	4	5
රැස්වීම්/පුහුණු කිරීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු (ගුවන්සේවා) සංවිධානය කිරීම සඳහා පරිපාලනමය සහාය	2	6
NGAP ශ්‍රී ලංකා කමිටු රැස්වීම්	9	14
ගුවන්සර සඟරාව ප්‍රකාශයට පත් කිරීම	1	3
පවත්වන ලද CADEC වැඩසටහන	2	3
පාසල් සිසුන් සඳහා වැඩමුළු	1	4
විශේෂ ක්‍රියාකාරකම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	2	3
මාධ්‍ය ලිපි	47	30
රූපවාහිනී වැඩසටහන	12	35
වෙනත් ප්‍රකාශන/වාර්තා	23	33

ගුවන් සංචරණ සේවා අංශය (ANS)	2020	2019
සිදු කරන ලද ATS පරීක්ෂණ	32	36
සිදු කරන ලද AIS පරීක්ෂණ	10	15
සිදු කරන ලද SAR පරීක්ෂණ	4	4
සිදු කරන ලද CNS පරීක්ෂණ	30	28
සිදු කරන ලද MET පරීක්ෂණ	0	5
සිදු කරන ලද සිතියම් සහ ප්‍රස්ථාර පරීක්ෂණ	3	4
සිදු කරන ලද PANS-OPS පරීක්ෂණ	1	2
NOTAM නිකුත් කිරීම සඳහා අනුමැතියන්	442	364
නිකුත් කරන ලද AIP අතිරේක	8	11
AIP සංශෝධනය	0	3
අනුමත කරන ලද ගුවන් වැඩ සංඛ්‍යාව	24	99
නිකුත් කරන ලද AIC සංඛ්‍යාව	5	3
නිකුත් කරන ලද ගොඩබෑමේ පැහැයුම්	451	1,170
නිකුත් කරන ලද ඉහළින් පියාසර කිරීම් පැහැයුම්	859	1,283
උපලේඛනගත නොකළ ගුවන් ගමන් අනුමත කිරීම් සංඛ්‍යාව	1,317	1,684
පිටත් කර යවන ලද AFTN	600	1,486
ලැබුණු AFTN	2,225	4,004
ගොඩබෑමේ හා ගාල් කිරීමේ ගාස්තුවලින් නිදහස් සංඛ්‍යාව	4	6
රාජ්‍ය තාන්ත්‍රික පියාසර (ගොඩබෑම) සඳහා විරුද්ධත්වයක් නොමැති බවට සටහන් සංඛ්‍යාව	68	168
රාජ්‍ය තාන්ත්‍රික පියාසර (ඉහළින් පියාසර කිරීම්) සඳහා විරුද්ධත්වයක් නොමැති බවට සටහන් සංඛ්‍යාව	53	77

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

ගගන යාත්‍රාංගන සහ පහසුකම් අංශය	2020	2019
කුළුණු අනුමත කිරීම් සංඛ්‍යාව	46	189
ඉහළ උසකින් යුත් ව්‍යුහයන් තැනීම සඳහා අනුමත කිරීම්	96	194
භූමි ගුවන් තොටුපල සඳහා අනුමැතිය	0	1
සිදු කරන ලද ගගන යාත්‍රාංගන සෝදිසි කටයුතු	40	42

පුහුණු සංවිධාන සහ පිරිස් බලපත්‍ර අංශය	2020	2019
ආධුනික ගුවන් නියමු බලපත්‍ර (SPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	114	260
පෞද්ගලික ගුවන් නියමු බලපත්‍ර (PPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	87	146
වාණිජ ගුවන් නියමු බලපත්‍ර (CPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	176	321
ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍ර (ATPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	295	400
ගුවන් ගමන් පාලක බලපත්‍ර (ATC) (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	49	68
ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	1	2
ගුවන්යානා නඩත්තු බලපත්‍රය (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	144	432
ගුවන්යානා නඩත්තු බලපත්‍රය - වර්ග ප්‍රමාණන (නිකුත් කිරීම්)	50	113
ගුවන්යානා නඩත්තු බලපත්‍රය - ප්‍රවර්ග (නිකුත් කිරීම්)	2	10
මැදිරි සේවක පිරිස් සහතික නිකුත් කිරීම (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	96	245
පියාසර මෙහෙයුම් නිලධාරී බලපත්‍ර (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	0	3
වාණිජ ගුවන් නියමු බලපත්‍ර (CPL) සහ ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍ර (ATPL) ගුවන්යානා වර්ග ප්‍රමාණන නිකුත් කිරීම්	62	105
සහකාර ගුවන් උපදේශක (AFI) සහ පියාසැරි උපදේශක (FI) ප්‍රමාණන - (නිකුත් කිරීම් + අලුත් කිරීම්)	4	10
පියාසර පාසල් බලපත්‍ර (නිකුත් කිරීම් + අළුත් කිරීම්)	8	13
භූමි උපදේශක බලපත්‍ර (නිකුත් කිරීම් + අළුත් කිරීම්)	6	17
භූමි උපදේශක අනුමත කිරීම් (නිකුත් කිරීම් + අළුත් කිරීම්)	28	20
ගුවන් ගමන් පාලක ප්‍රමාණන (නිකුත් කිරීම් + අළුත් කිරීම්)	140	155
NIB පැහැදුම් නිකුත් කිරීම	100	96
වෛද්‍ය පරීක්ෂණ	1,894	2,686
PPL විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	291	727
පියාසර මෙහෙයුම් නිලධාරී විභාගය	0	1
AML විභාගය (විභාග සංඛ්‍යාව)	1	2
AML විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	1,105	2,069
ATPL (A) විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	21	91
ATPL – A භාර දුන් පත්‍රිකා සංඛ්‍යාව	416	1,178
ATPL (H) විභාගය	1	1
ATPL (H) විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	3	7
ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂාව (ELPC)	85	180
ගුවන්විදුලි දුරකථන ප්‍රායෝගික පරීක්ෂණය	40	104
සහකාර පියාසර උපදේශක විභාගය (න්‍යාය සහ සම්මුඛ පරීක්ෂණය)	4	16

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

ගුවන්යානා මෙහෙයුම් අංශය	2020	2019
විශේෂ මෙහෙයුම්	52	4
විදේශ ගුවන් මෙහෙයුම්කරු සහතික - මුල් වර	3	8
විදේශ ගුවන් මෙහෙයුම්කරු සහතික - අලුත් කිරීම	30	34
අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර - මුල් වර	3	0
අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර - අලුත් කිරීම	12	17
DCP - මුල් වර	3	3
DCP – අලුත් කිරීම	24	14
ජාත්‍යන්තර ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය - අලුත් කිරීම	2	2
සිමියුලේටර් (Simulator) අලුත් කිරීම	3	3
පිරික්සුම් සඳහා බලය පැවරීම	81	114
ක්‍රියාත්මක කරන ලද සෝදිසි කාර්යයන්	40	127

ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා අංශය	2020	2019
රෙම්ප් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා	20	185
ගුවන්යානා නඩත්තු සංවිධාන පරීක්ෂණ	2	15
පවත්වන ලද සෝදිසි කාර්යයන් (රෙම්ප්, විගණන)	68	254
ගුවන්යානා ගුවන් යෝග්‍යතා සහතික - මුල් වර	1	7
ගුවන්යානා ගුවන් යෝග්‍යතා සහතිකය - අළුත් කිරීම	48	56
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතික - මුල් වර	2	6
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතික - අලුත් කිරීම	68	76
ගුවන්සේවා සිදුවීම් විසඳීම	55	174

ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය (AT&ER)	2020	2019
දේශීය පියාසර උපලේඛන අනුමැති	42	25
ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන් සඳහා පවත්වන ලද ඇගයීම් රැස්වීම්	49	89
ජාත්‍යන්තර පියාසර උපලේඛන අනුමැතියන්	833	322
තාක්ෂණික නොවන විශේෂඥ කාර්ය මණ්ඩලය සඳහා වීසා නිර්දේශ	41	87
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා කුලී මෙහෙයුම් බලපත්‍ර	5	8
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර	2	2
කුලී බලපත්‍ර - ජාත්‍යන්තර මෙහෙයුම්	0	2
කුලී බලපත්‍ර - දේශීය නිත්‍ය මෙහෙයුම්	0	4
ගුවන් ප්‍රවාහන සැපයුම්කරු බලපත්‍ර	317	483
පෞද්ගලික මෙහෙයුම් බලපත්‍ර	0	1
වසර අවසානයේ නිදහස් ආකාශ ගුවන් සේවා ගිවිසුම්	19	19

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

මානව සම්පත් හා දේපළ කළමනාකරණ අංශය	2020	2019
කාර්ය මණ්ඩල බඳවා ගැනීම්	4	13
මුළු කාර්ය මණ්ඩලය (ස්ථිර සේවක සංඛ්‍යාවෙන්)	175	181
පහසුකම් සපයන ලද විදේශ පුහුණු/සම්මන්ත්‍රණ/වැඩමුළු	2	20
පහසුකම් සපයන ලද විදේශ රැස්වීම්/සම්මන්ත්‍රණ/ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ	2	22
පහසුකම් සපයන ලද විදේශ පරීක්ෂණ	2	15
පහසුකම් සපයන ලද දේශීය පුහුණු/සම්මන්ත්‍රණ/වැඩමුළු	25	34
පහසුකම් සපයන ලද දේශීය අභ්‍යන්තර පුහුණු වැඩසටහන් (අධිශික්ෂණය ඇතුළුව)	3	7
සකස් කරන ලද කාර්යසාධන ඇගයීම්	121	158
පහසුකම් සපයන ලද කාර්යමණ්ඩල ණය (රු. මිලියන)	199	74
ප්‍රවේශ වූ සහ බෙදා හැරී ICAO ලේඛන	424	970

ආදායම් හා මූල්‍ය කළමනාකරණ අංශය	2020	2019
එකතු කළ මුළු ආදායම (රු. මිලියන)	964	2504
වැය කරන ලද මුළු වියදම (රු. මිලියන)	493	631
ගෙවන ලද මුළු කාර්ය මණ්ඩල වියදම් (රු. මිලියන)	336	333

තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය	2020	2019
පැවැත්වූ විගණනයන් ගණන	84	122
එක් කරගත් සොයාගැනීම්	87	171

ගුවන්සේවා සුරක්ෂිතභාවය නිරීක්ෂණය	2020	2019
වාර්තා වූ සිදුවීම් (බරපතල / සුළු)	6	10
වාර්තා වූ සිදුවීම්	121	315
මගීන්ට හෝ කාර්ය මණ්ඩලයට බරපතල හානි	0	1
මගීන්ට හෝ කාර්ය මණ්ඩලයට සුළු හානි	2	3
ඉදිරිපත් කළ නව රෙගුලාසි	3	1
ඉදිරිපත් කළ නව මාර්ගෝපදේශන ලේඛන	5	0
සංශෝධනය කළ දැනට පවත්නා මාර්ගෝපදේශන ලේඛන	5	6
ඉදිරිපත් කළ නව IS	1	1
සංශෝධනය කළ දැනට පවත්නා IS	6	5
ලියාපදිංචි කළ ඩ්‍රෝන - දේශීය අයිතිකරුවන්	383	138
ලියාපදිංචි කළ ඩ්‍රෝන - විදේශීය අයිතිකරුවන්	2	156
අනතුරු/සිදුවීම් සම්බන්ධයෙන් බලපත්‍ර හිමිකරුවන් වෙතින් පරීක්ෂා කර බැලීම	42	58

තොරතුරු තාක්ෂණය	2020	2019
පැමිණිලි සංඛ්‍යාව - උපකාරක කවුළු සහාය	2,656	3,904
විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව - උපකාරක කවුළු සහාය	2,584	3,904
මිලදී ගත් නව තොරතුරු තාක්ෂණ උපකරණ සඳහා සිදු කරන ලද ඇගයීම්	8	24

ගමනාගමන තොරතුරු

	2020	2019	වර්ධනය
ජාත්‍යන්තර ගුවන් ගමන්			
මගීන්			
පිටත් වූ	1,231,939	4,970,184	-75%
ගොඩබසින ලද	1,140,989	4,930,455	-77%
සංක්‍රමණය වූ	275,866	1,741,201	-84%
නැව්බඩු (මෙට්‍රික්ටොන්)			
ගෙන ආ	49,766	94,859	-48%
පිටතට ගෙන ගිය	86,327	151,547	-43%
ගුවන්යානා චලන			
නිත්‍ය පියාසර	19,442	60,883	-68%
කුලී පියාසර	1,300	992	31%
මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහන සමාගම් සංඛ්‍යාව			
නිත්‍ය සේවා	36	38	-5%
කුලී සේවා	39	7	457%
නැව් බඩු පමණක්	4	4	0%
දේශීය ගුවන් ගමන්			
ප්‍රවාහනය කළ මගීන්	8,960	24,313	-63%
ගුවන්යානා චලන	2,041	5,635	-64%
මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහන සමාගම්	7	10	-30%
නිත්‍ය පියාසර	2	2	0%
කුලී පියාසර	5	8	-38%

ගමනාගමන තොරතුරු

මගී චලන



නැව් භාණ්ඩ චලන



ගුවන්යානා චලන





මුල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන – 2020

ලාභ හෝ අලාභ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා	සටහන	2020 රු.	2019 රු.
ආදායම			
මෙහෙයුම් ආදායම්	23	**803,216,822**	2,288,452,284
මෙහෙයුම් නොවන ආදායම්	23	**182,992,523**	215,603,274
		986,209,345	2,504,055,558
වියදම්			
කාර්ය මණ්ඩල වියදම්	24	**354,048,327**	333,482,977
රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු	25	**1,781,594**	24,497,924
පුහුණුව සඳහා වියදම්	26	**5,078,282**	18,227,802
පරිපාලන හා වෙනත් වියදම්	27	**184,820,164**	190,867,775
ක්ෂයවීම්	29	**133,523,370**	63,817,302
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	30	**256,265**	98,614
භාවිතා කිරීමේ අයිති වත්කම් ක්ෂය වීමේ වියදම්	31	**21,034**	-
		679,529,036	630,992,394
බදු ගෙවීමට පෙර ලාභය		**306,680,309**	1,873,063,164
ආදායම් බදු වියදම්	28	**69,528,468**	524,261,818
වර්ෂය සඳහා ලාභය		**237,151,840**	1,348,801,346
වෙනත් ලාභ හෝ අලාභ			
විශ්‍රාම ගැනීමේ වරප්‍රසාද වගකීම් නැවත ගණනය කිරීම මගින් ඇතිවන ලාභ/(පාඩු)		**(20,183,552)**	(1,341,090)
වසර සඳහා සම්පූර්ණ ලාභ හෝ අලාභ		**216,968,288**	1,347,460,256

පිටු අංක 81 සිට 102 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යම කොටසක් වේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා	සටහන	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	29	**2,309,530,500**	1,672,783,311
අස්පෘශ්‍ය වත්කම්	30	**4,081,325**	1,840,090
භාවිත කිරීමේ අයිති වත්කම්	31	**357,573**	-
නොනිමි වැඩ - ප්‍රාග්ධන	32	**464,794,076**	1,185,859,250
ස්ථාවර තැන්පතු - කාර්යමණ්ඩල සුභසාධන සහ සමාජ ආරක්ෂණ අරමුදල		**128,487**	508,915
කල්තැබූ බදු වත්කම්		**10,377,440**	5,218,243
සම්පූර්ණ ජංගම නොවන වත්කම්		**2,789,269,401**	2,866,209,810
ජංගම වත්කම්			
ලේඛනගත භාණ්ඩ තොග		**6,963,707**	6,203,222
වෙළඳ ලැබිය යුතු දෑ	33	**718,952,055**	124,517,937
කාර්ය මණ්ඩල ණය	34	**90,686,852**	58,518,714
මූල්‍ය වත්කම්	35	**1,218,129,968**	862,000,918
අත්තිකාරම් පෙර ගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ	36	**513,923,665**	483,737,116
මුදල් හා මුදල් සමාන දෑ	37	**1,658,332,429**	2,148,909,180
සම්පූර්ණ ජංගම වත්කම්		**4,206,988,675**	3,683,887,087
සම්පූර්ණ වත්කම්		**6,996,258,076**	6,550,096,897
ස්කන්ධය			
ප්‍රාග්ධනය හා සංචිත			
රජයේ ප්‍රදාන	38	**562,818,117**	567,094,016
තබා ගත් ඉපයීම්	39	**3,762,707,811**	3,545,739,523
සම්පූර්ණ ප්‍රාග්ධනය සහ සංචිත		**4,325,525,928**	4,112,833,539
වගකීම්			
ජංගම නොවන වගකීම්			
කල් තැබූ බදු වගකීම්	40	**35,260,898**	33,607,253
කල්බදු වගකීම්	41	**353,339**	-
ප්‍රතිපාදන සහ වෙනත් වගකීම්	42	**94,073,855**	94,454,283
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	43	**50,084,994**	40,461,110
සම්පූර්ණ ජංගම නොවන වගකීම්		**179,773,086**	168,522,646
ජංගම වගකීම්			
වෙළඳ ගෙවිය යුතු දෑ	44	**2,309,954,594**	2,032,226,872
වෙනත් ගෙවිය යුතු දෑ	45	**61,855,239**	25,691,653
ආදායම් බදු වගකීම්	46	**119,149,229**	210,822,186
සම්පූර්ණ ජංගම වගකීම්		**2,490,959,062**	2,268,740,711
සම්පූර්ණ ස්කන්ධය සහ වගකීම්		**6,996,258,076**	6,550,096,897

පිටු අංක 81 සිට 102 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය අංගයක් වේ. 2020.12.31 දිනට අධිකාරියේ කටයුතු පිළිබඳ සත්‍යවූත් සාධාරණවූත් දසුනක් මෙම මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු වේ.

අධ්‍යක්ෂ - මූල්‍ය සහ ආදායම් කළමනාකරණ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සම්පාදනය කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

කපිතාන් තේමිය අබේවික්‍රම
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිළධාරී
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

උපුල් ධර්මදාස මහතා
සභාපති

2021 පෙබරවාරි 28

මූල්‍ය ප්‍රකාශන – 2020

ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා	රජයේ ප්‍රදාන රු.	තබාගත් ඉපයීම් රු.	මුළු මුදල රු.
2019 ජනවාරි 01 දිනට ශේෂය	571,332,766	3,010,096,178	3,581,428,944
කාල පරිච්ඡේදය සඳහා ලාභය	-	1,348,801,346	1,348,801,346
ප්‍රතික්ෂේපිත VAT බදු - 2003-2013		(13,158,001)	(13,158,001)
වසර සඳහා ක්‍රමක්ෂය	(4,238,750)	-	(4,238,750)
පෙර වසරේ ගැලපීම්	-	1,341,090	1,341,090
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් නැවත ගණනය කිරීම්	-	(1,341,090)	(1,341,090)
ශුද්ධ අතිරික්ත විසර්ජනය ඒකාබද්ධ අරමුදල	-	(800,000,000)	(800,000,000)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	567,094,016	3,545,739,523	4,112,833,539
කාලපරිච්ඡේදය සඳහා ලාභය	-	237,151,840	237,151,840
වසර සඳහා ක්‍රමක්ෂය	(4,275,899)	-	(4,275,899)
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් නැවත ගණනය කිරීම්	-	(20,183,552)	(20,183,552)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	562,818,117	3,762,707,811	4,325,525,928

පිටු අංක 81 සිට 102 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය අංගයක් වේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා	සටහන	2020 රු.	2019 රු.
මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය			
සාමාන්‍ය කාර්යයන්ගෙන් ලාභය/අලාභ (බදුවලට පෙර)		**306,680,309**	1,873,063,165
ගැළපුම්			
ක්ෂය කිරීම්	29	**133,523,370**	63,817,303
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම්	30	**256,265**	98,614
භාවිත කිරීමේ අයිති වත්කම්වල ක්ෂයවීමේ වියදම්	31	**21,034**	-
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්	38	**(4,275,899)**	(4,238,750)
ආයෝජනවලින් පොළී ආදායම	23	**(167,903,923)**	(197,681,316)
දේපළ පිරියත උපකරණ විකිණීමේ (ලාභය)/අලාභය		**125,663**	256,934
කල්බදු වගකීම්වල මූල්‍ය වියදම	41	**1,516**	-
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	43	**6,890,186**	7,964,547
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)		**275,318,521**	1,743,280,497
ලේඛණගත භාණ්ඩ තොග වැඩිවීම්		**(760,483)**	611,873
වෙළෙඳ ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	33	**(594,434,118)**	3,125,874
කාර්ය මණ්ඩල ණය (වැඩිවීම)/අඩුවීම	34	**(39,535,096)**	(9,829,814)
අත්තිකාරම්, පෙර ගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ (වැඩි වීම)/අඩුවීම	36	**12,402,778**	(266,299,665)
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම	44/45	**313,891,308**	476,401,635
මෙහෙයුම් කටයුතුවලින් උත්පාදනය වූ මුදල්			
ප්‍රතික්ෂේපිත VAT බදු		**-**	(13,158,001)
ගෙවන ලද නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය (පාරිතෝෂිකය)	43	**(17,449,856)**	(1,134,600)
ගෙවන ලද ආදායම් බදු	46	**(164,706,977)**	(573,149,050)
මෙහෙයුම් කාර්යයන්ගෙන් ලැබුණු ශුද්ධ මුදල		**(33,117,090)**	1,947,290,400
ආයෝජන කාර්යයන්ගෙන් ලැබුණු මුදල්			
දේපළ පිරියත උපකරණ අත්පත් කර ගැනීම්	29	**(10,668,748)**	(39,001,573)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	30	**(2,497,500)**	(269,728)
නොනිමි වැඩ වැඩිවීම	32	**(38,734,826)**	(973,603,580)
ආපසු ගැනීම්/වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	35	**(356,434,700)**	474,386,595
ලැබුණු පොළිය		**132,987,202**	187,001,989
දේපළ, පිරියත සහ උපකරණ විකිඨමෙන් ලද මුදල්		**72,525**	-
ආයෝජන කාර්යයන්හි යෙදූ ශුද්ධ මුදල		**(275,276,045)**	(351,486,297)
මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
ඒකාබද්ධ අරමුදලට දායක වීම		**-**	(800,000,000)
වීරවිල ඉඩම සඳහා කල්බදු ගෙවීම	41	**(26,784)**	-
මූල්‍ය කටයුතු සඳහා භාවිතා කරන ශුද්ධ මුදල්		**(26,784)**	(800,000,000)
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)		**(490,576,752)**	208,362,452
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	**2,148,909,180**	1,940,546,728
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	**1,658,332,429**	2,148,909,180

පිටු අංක 81 සිට 102 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය අංගයක් වේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය තොරතුරු

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි, ලියාපදිංචි කාර්යාලය කටුනායක, මිනුවන්ගොඩ පාරේ අංක 152/1 දරණ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලැබේ.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ 2002 දෙසැම්බර් 27 වන දින පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යස්ථාපිත මණ්ඩලයක් වශයෙන් සලකනු ලබන අතර එහි කාර්යභාරය වනුයේ 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේත්, 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතේත් ඇතුළත් නෛතික විධිවිධාන යටතේ කටයුතු කරමින් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් සම්මත කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව සිවිල් ගුවන්සේවාවේ නිරුපදත්‍රාව, කාර්යක්ෂමතාව, ක්‍රමවත්භාවය සහ සිවිල් ගුවන්සේවාවෙන් පරිසරයට විල්ලවන බලපෑම නියාමනය කිරීමය.

1.3 නිකුත් කිරීම සඳහා අවසරලත් දිනය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි, 2020 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2021 පෙබරවාරි 18 වන දින සිවිල් ගුවන්සේවා අධිකාරියේ යෝජනා සම්මතයකට අනුව නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ලාභ හෝ අලාභ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම්, මුදල් ප්‍රවාහය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය ද (මූල්‍ය ප්‍රකාශන) ඇතුළත් සටහන් ද ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති නියෝජනය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRs) සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) වලට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කළමනාකරණය මත පැවරී ඇත. 2020 වසරේ ප්‍රදර්ශන ආකෘතියට කියවන්නාගේ වැඩිදුර අවබෝධයට හේතු වන පරිදි වෙනස්කම් කිහිපයක් සිදු කොට ඇත.

2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ චේතිහාසික පිරිවැය සම්මුතියට අනුව පිළියෙළ කර ඇති අතර සහ මූල්‍යමය වත්කම් සාධාරණ අගයට අනුව ගණනය කොට ඇත.

2.3 ක්‍රියාත්මක කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

අධිකාරියේ ක්‍රියාත්මක වීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් ලෙස තීරණය කොට ඇති අතර මූල්‍ය ප්‍රකාශ ද ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

2.4 පවත්වාගෙන යාමේ අපේක්ෂාව

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන විට කළමනාකරණය, සිවිල් ගුවන්සේවා අධිකාරිය ලාභ ලබන සාර්ථක ව්‍යාපාරයක් වශයෙන් දිගින් දිගට නොකඩවා පවත්වාගෙන යාමට ඇති හැකියාව තක්සේරු කර ඇත. සිවිල් ගුවන්සේවා අධිකාරියට නිත්‍යානුකූලව පැවරී ඇති රාජකාරී සහ කාර්යයන් ඉටු කරමින් පෙනෙනතාක් දුර අනාගතයට එකී මෙහෙයුම් පැවැත්ම රඳවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් එය සතුව තිබෙන බවට සාධාරණ බලාපොරොත්තුවක් කළමනාකරණයට ඇත. අනාගතය පිළිබඳව උපයෝජ්‍ය වශයෙන් ඇති තොරතුරු සලකා බලන විට අධිකාරියට එහි මෙහෙයුම් නවතා දැමීමට හෝ ඈවර කිරීමට හෝ සිදුවිය හැකි බවත් පෙනෙන්නට නැත. මේ අනුව අධිකාරිය එහි මූල්‍ය ප්‍රකාශ සකස්කිරීමේ දී තවදුරටත් ලාභ ලබන ස්ථාවර ව්‍යාපාරයක පදනම යොදා ගනියි.

2.5 වැදගත් ගිණුම්කරණ මත නිමාන සහ උපකල්පන

අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, වාර්තාකරණ දිනයට වාර්තා කළ ආදායම් ප්‍රමාණය වියදම, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපෑම් ඇති වන, නිමාන සහ උපකල්පන ගොඩනගා ගැනීමට කළමනාකරණයට සිදුවේ. කෙසේ වුවද මෙකී උපකල්පන සහ නිමානවල ඇති අනිශ්චිතතාව හේතුවෙන් අනාගතයේ දී කිසියම් වත්කමක හෝ වගකීමක හෝ ඉදිරියට ගෙන යන ප්‍රමාණයට ප්‍රමාණාත්මක ගැලපුමක් සිදුකිරීම අවශ්‍ය විය හැකිය. මෙම සාධක අතරට මත, නිමාන සහ උපකල්පන ඇතුළත් විය හැකිය.

මත

අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී ගොඩනගනු ලැබන නිමාන සහ උපකල්පන හැරුණු විට මූල්‍ය ප්‍රකාශනයන්හි පිළිගෙන ඇති ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑම් ඇති කරන පහත සඳහන් මත අධිකාරිය විසින් ගොඩනගා ගෙන ඇත.

නිමාන සහ උපකල්පන

වළඹෙන මූල්‍ය වර්ෂය ඇතුළුව වත්කම් සහ වගකීම්වල ඉදිරියට ගෙන යන ශේෂයන්ට ගැලපුම් අවශ්‍ය වීමේ සැලකිය යුතු අවදානමක් ඇති කරවන, අනාගත සහ නිමාන අනිශ්චිතතාව ඇති කරන වෙනත් ප්‍රධාන ප්‍රභවයන් පිළිබඳ වැදගත් උපකල්පන සම්බන්ධව පහත සාකච්ඡා කෙරේ.

(අ) මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තාකර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ අගය සක්‍රිය වෙළඳපොළෙන් ව්‍යුත්පන්න කර ගත නොහැකි වන විට වට්ටම් කළ මුදල් ප්‍රවාහ මොඩලය සහ/හෝ ගණිත මොඩලය ඇතුළත් විවිධ ඇගයීමේ ශිල්ප ක්‍රම භාවිතා කිරීමෙන් එය ගණනය කරනු ලැබේ. මෙම මොඩලයන් අවශ්‍ය යෙදවුම් එසේ කළ හැකි අවස්ථාවන්හි නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත තුලින් උකහා ගනු ලබන අතර නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත නොමැති විට සාධාරණ අගය ස්ථාපනය කිරීම සඳහා මාන (විනිශ්චයන්) අවශ්‍ය වේ.

මෙම සාධක පිළිබඳ උපකල්පනයන්හි වෙනස්කම් නිසා මූල්‍ය මෙවලම්වල වාර්තා කරන ලද අගයන් කෙරෙහි බලපෑම් ඇති විය හැකිය. භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන නිමිත අගයට පෙන්නුම් කෙරෙන අතර පෙර වසරවලදී ඒවායේ පිරිවැයට පෙන්නුම් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ශේෂ පත්‍ර දිනට මූල්‍ය මෙවලම් (භාණ්ඩාගාර බිල්පත්) වල ඉදිරියට ගෙන ආ ශේෂය රු.1,232,748,534 (2019 : රු: 876,313,834/-).

(ආ) නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ඇගයීම
නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම්වල පිරිවැය නිශ්චය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුව සූත්‍ර ක්‍රමය භාවිතා කිරීමෙනි.

ශේෂ පත්‍ර දිනට නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ ඉදිරියට ගෙන ආ අගය රු. 50,084,994/- (2019) රු. 40,461,111/-

(ඇ) සාධාරණ අගය
සාධාරණ අගය වනුයේ අතේ දුර ගනුදෙනුවක දී පිටස්තර බලපෑම් රහිත දැනුම් සහ කැමැත්ත සහිත දෙපාර්ශවයක් අතර විකඟත්වයට එළඹෙනු ලබන ප්‍රතිශ්ධාවේ අගයයි. මූල්‍ය මෙවලමක් ආරම්භයේ දී පිළිගනු ලබන විට එහි සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් ඒ සඳහා ගෙවනු ලබන හෝ ලැබුණු හෝ ප්‍රතිශ්ධාවේ අගයයි. ආරම්භක පිළිගැනීමෙන් අනතුරුව සක්‍රිය වෙළඳපොළක මිල සඳහන් කර ඇති මූල්‍ය වත්කමක සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් එහි විකුණුම් මිලයි. සක්‍රිය වෙළඳපොළක මිල සඳහන් කර ඇති මූල්‍ය වගකීමක සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් එහි ඉල්ලුම් මිලයි. මුදල් සමාන දෑ සහ කෙටිකාලීන ආයෝජන වැනි කෙටිකාලීන මූල්‍ය මෙවලම්වල ඉදිරියට ගෙන යන අගය එකී සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් පිළිගත හැකිය.

(ඈ) ආදායම් බදු
අධිකාරිය ආදායම් බදුවලට යටත්වන අතර ආදායම් බදු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක විනිශ්චයක් අවශ්‍ය වේ.

විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

3 . මූල්‍ය වත්කම්

අධිකාරිය එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ප්‍රවර්ගවලට වර්ගීකරණය කරයි. ණය සහ ලැබිය යුතු දෑ, කල්පිරෙන තුරු තබාගන්නා සහ විකිණීමට තිබෙන වත්කම් වශයෙනි. කළමනාකරණය විසින් ආරම්භක පිළිගැනීමේ දී මෙම වර්ගීකරණය නිශ්චය කරනු ලබන අතර එය අදාළ ආයෝජන අත්පත් කරගත් අවශ්‍යතාවය මත රඳා පවතී.

3.1 වර්ගීකරණය

(අ) ණය සහ ලැබිය යුතු දෑ
ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රිය වෙළඳපොළක මිල සඳහන් කර නොමැති, නියමිත දිනට ගෙවිය යුතු හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත හෝ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. සාමාන්‍ය ගනුදෙනුවලින් ඉස්මතු වන ලැබිය යුතු දෑ ද මෙම ප්‍රවර්ගය යටතේ වර්ගීකරණය කරනු ලබන අතර එවැනි වත්කම්වලට සිදුවන හානි පිළිබඳව සමාලෝචනය කරනු ලැබේ.

(ආ) කල්පිරෙන තුරු තබා ගන්නා මූල්‍ය වත්කම්
කල්පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම් යනු අධිකාරියේ කලමනාකරණයට කල්පිරෙන තුරු රඳවා ගැනීමේ හැකියාවක් සහ ස්ථිර චේතනාවක් ඇති, නියමිත දිනට ගෙවිය යුතු සහ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. එහෙත් පහත සඳහන් මූල්‍ය වත්කම් මෙම ප්‍රවර්ගයට ඇතුළත් නොවේ.

- ආරම්භක පිළිගැනීමෙන් පසු අධිකාරිය විසින් ලාභය හෝ අලාභය හරහා නිගමනය කරනු ලබන සාධාරණ අගය සහිත වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්.
- අධිකාරිය විසින් විකිණීමට තිබෙන වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්.
- ණය සහ ලැබිය යුතු දෑ බවට අර්ථකථනය කළහැකි වත්කම්.

කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජනවලින් ලැබෙන පොළිය ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කරනු ලබන අතර 'ආයෝජන ආදායම්' වශයෙන් වාර්තා කරනු ලැබේ.

(ඇ) විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්
විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් වශයෙන් හඳුන්වනු ලබන්නේ අවිනිශ්චිත කාල සීමාවක් සඳහා රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන ඈවර කිරීමේ අවශ්‍යතාවට හෝ පොළි අනුපාත, විනිමය අනුපාත හෝ ස්කන්ධ වෙනස්වම් නිසා හෝ උද්ගතවන අවශ්‍යතාවට ප්‍රතිචාරයක් වශයෙන් විකිණීමට සිදු විය හැකි ණය සහ ලැබිය යුතු දෑ, කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන වත්කම් හෝ නොවන මූල්‍ය වත්කම් ය.

3.2 පිළිගැනීම සහ මානය

මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත ඉදිරියට ගෙන නොයන සියලුම මූල්‍ය වත්කම් ඒවා අත්පත් කර ගැනීම සඳහා සෘජුව වැය වූ ගනුදෙනු පිරිවැයට පිළිගනු ලැබේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට ඉදිරියට ගෙන යන මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයෙහි වියදමක් වශයෙන් සටහන් කරනු ලැබේ. මූල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් හාරගැනීමේ අයිතිය අවසන් වූ කල්හි හෝ මූල්‍ය වත්කම් මාරු කරනු ලැබ හිමිකමේ වරප්‍රසාද සහ අවදානම් සියල්ල ද අධිකාරිය විසින් සාධාරණ පරිදි මාරු කරනු ලැබූ කල්හි හෝ එවැනි මූල්‍ය වත්කම් පිලිගැනීම අත්හැර දමනු වත්කම් අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලැබේ. කල්පිරෙන තුරු තබා ගන්නා මූල්‍ය වත්කම් ද ණය සහ ලැබිය යුතු දෑ ද බලාත්මක පොළි ප්‍රමාණය භාවිතා කිරීමේ ක්‍රමක්ෂය කළ පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ.

විකිණීමට තිබෙන වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මුදල් නොවන ඇපවල සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීරණ ආදායම යටතේ පිළිගනු ලැබේ.

විකිණීමට තිබෙන වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති ඇප විකුණු කල්හි හෝ ඒවාට හානි සිදු වූ කල්හි හෝ වෙනත් විස්තීරණ ආදායම යටතේ පිලිගෙන ඇති සමුච්චිත සාධාරණ අගය ගැලපුම් මූල්‍ය වත්කම්වලින් ලද ශුද්ධ ලාභයක්/අලාභයක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලැබේ.

විකිණීමට තිබෙන ඇප සඳහා බලාත්මක පොළි ක්‍රමය භාවිතා කරමින් ගණනය කරන ලද පොළි ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

3.3 සාධාරණ අගය නිශ්චය කිරීම

ණය සහ අත්තිකාරම් වල මෙන්ම බැංකු සහ ගනුදෙනුකරුවන් වෙත පවතින වගකීම්වල සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ ණය තත්ත්වය, ද්‍රවශීලතාව සහ පිරිවැය සැලකිල්ලට ගනිමින් ගිවිසුම් මගින් එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කර ගනිමින් වර්තමාන අගය මොඩලයක් භාවිතා කරමින් ය.

වෙළඳ ලැබිය යුතු දෑ හි සහ ගෙවිය යුතු දෑ හි හානි සඳහා ප්‍රතිපාදන අඩුකර ඉදිරියට ගෙන යන අගය ඒවායේ සාධාරණ අගයට ආසන්න වෙතැයි උපකල්පනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3.4 පිළිගැනීම අත්හැරීම

පහත සඳහන් අවස්ථාවන් හි කිසියම් මූල්‍ය වත්කමක හෝ (අදාළ අවස්ථාවන්හි මූල්‍ය වත්කමකින් කොටසක හෝ සමාන මූල්‍ය වත්කම් භාණ්ඩයකින් කොටසක) හෝ පිළිගැනීම අත්හරිනු ලැබේ.

- අදාළ වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාර ගැනීමේ අයිතිවාසිකම් අවසන් වී ඇතිවිට
- වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාරගැනීමේ අයිතිය අධිකාරිය විසින් මාරුකර ඇති හෝ අධිකාරිය භාරග න්නා මුදල් 'අතින් අතට' වැඩ පිළිවෙලක් යටතේ වැඩි ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයකට ගෙවීමට බැඳී ඇති අවස්ථාවක් සහ

(අ) අධිකාරිය විසින් වත්කමේ ප්‍රතිලාභ සහ අවදානම් සියල්ල මාරුකර ඇති නම් හෝ

(ආ) අධිකාරිය විසින් වත්කමේ ප්‍රතිලාභ සහ අවදානම් සියල්ල මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් හෝ නොකර ඇති නමුත් වත්කමේ පාලනය මාරු කර ඇත්නම්,

අධිකාරිය විසින් කිසියම් වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාරගැනීමේ අයිතිය මාරුකර ඇත්නම් හෝ 'අතින් අතට' වැඩපිළිවෙලකට ඇතුළත් වී අදාළ වත්කමේ සියලු ප්‍රතිලාභ සහ අවදානම් මාරුකර හෝ රඳවාගෙන හෝ නොමැතිව එහි පාලනය මාරුකිරීමක් ද සිදු නොකර ඇත්නම් හෝ එවැනි වත්කමක් පිළිගැනීම සිදුකරනු ලබන්නේ අධිකාරිය එම වත්කමට තවදුරටත් මැදිහත් වනතාක් දුරකට පමණකි. එවැනි අවස්ථාවක අධිකාරිය එකී වත්කම් ආශ්‍රිතව ඇති වගකීම ද පිළිගනියි. මාරු කරන ලද වත්කම් සහ ඒ ආශ්‍රිත වගකීම, අධිකාරිය රඳවාගෙන ඇති වරප්‍රසාද සහ වගකීම් පිළිබිඹු වන පදනමක් මත මනිනු ලැබේ. මාරු කරන ලද වත්කම් සඳහා වන ඇපයක ස්වරූපය ගත් අධිකාරියේ මැදිහත්වීම මනිනු ලබන්නේ වත්කමේ ආරම්භක අගය සහ අධිකාරියට ආපසු ගෙවීමට සිදුවිය හැකි උපරිම ප්‍රතිඥා අගය යන දෙකෙන් අඩු අගයට ය.

4. දේපළ, පිරියත හා උපකරණ

4.1 පිරිවැය/ප්‍රත්‍යාගණනය

අයිතිකරු පදිංචිව සිටින දේපළ ඇතුළු දේපළ සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි අලාභ අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. ප්‍රතිසම්පාදන හෝ ප්‍රධාන පෙළේ පරීක්ෂණ වියදම් දැරූ කල්හි අයිතමයේ පිරිවැය විශ්වාසයකින් යුක්තව මැනිය හැකිනම් සහ අදාළ අයිතමය ආශ්‍රිතව අනාගතයේදී ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකිනම් එවැනි පිරිවැය මූලධන ගත කරනු ලැබේ.

දේපළ සහ උපකරණවල පිරිවැය වශයෙන් සලකනු ලබන්නේ ඒවා අත්පත් කර ගැනීමේ හෝ ගොඩනැගීමේ හෝ පිරිවැයක් ඒවා අවශ්‍ය පරිදි පාවිච්චි කළහැකි තත්ත්වයට ගෙනඒම සඳහා දරන ලද වියදමක් ය. දේපළ සහ උපකරණ ඒකක ප්‍රත්‍යාගණනය කරනවිට අදාළ වත්කම් වර්ගයට අයත් සියල්ල එකවර ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. අධිකාරිය සෑම වසර තුනකට වරක් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්තිය 2014 සිට වෙනස් කර සෑම වසර පහකට වරක් ප්‍රත්‍යාගණනය කිරීම ආරම්භ කර ඇත. කෙසේවුවද, ප්‍රත්‍යාගණනයට අයත් වන සාධාරණ අගය ඉදිරියට ගෙන ආ ප්‍රමාණයෙන් විශාල වශයෙන් වෙනස් වුවහොත් එවැනි වත්කම් යළි ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි ඉදිරියට ගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් සිදු වුවහොත් එකී වැඩිවීම කෙළින්ම ප්‍රත්‍යාග ණන සංචිතයට හර කරනු ලැබේ. එහෙත් එම වැඩිවීම නිසා එම වත්කමේම ආදායම් ප්‍රකාශයෙහි පෙර පිළිගත් ප්‍රත්‍යාගණනය අඩුවීමක් ප්‍රතිවර්ත්‍ය වන්නේ නම් එවැනි වැඩිවීමක් ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. කිසියම් වත්කමක ප්‍රත්‍යාගණනය හිඟයක් නිසා එම වත්කමේ ම ඊට පෙර ප්‍රත්‍යාගණනය අතිරික්තයක් හිලව් වන්නේ නම් කෙළින් ම ප්‍රත්‍යාගණනය සංචිතය ඇති අතිරික්තයට එරෙහිව එය හිලව් කරනු ලැබේ. වත්කමක් විකුණු විට හෝ ඉවත් කළ විට හෝ අදාළ ප්‍රත්‍යාගණනය සංචිතය රඳවා ගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

4.2 ක්ෂය කිරීම්

දේපළ පිරියත සහ උපකරණවල පිරිවැය/ තක්සේරු වටිනාකම මත සරල මාර්ග පදනම යොදා (වත්කමේ පිරිවැයේ ශේෂ අගයෙන් / තක්සේරු වටිනාකමෙන් 10%ක් අඩු කර) ක්ෂය වීම ගණනය කරනු ලැබේ. ඉඩම් හැර සියලු දේපළ, පිරියත සහ උපකරණ ඵලදායි ජීව කාලය අවසන් වන විට කපා හල හැකිවන ආකාරයට පහත සඳහන් ප්‍රතිශතයන්ගෙන් ක්ෂය කර ඇත.

ගොඩනැගිලි	6 2/3%
මෝටර් වාහන	12.5%
පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	25%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	25%
වෙනත් ස්ථාවර වත්කම්	25%

වත්කම් මිලදී ගත් දින සිටම ක්ෂය වීම ගණන් බලා ඇති අතර විකිනෙක වත්කමේ ක්ෂය කළයුතු මුල් අගය නිශ්චය කිරීමේ දී එහි පිරිවැයෙන්/ ප්‍රත්‍යාගණන අගයෙන් 10% ක් ශේෂ අගය වශයෙන් රඳවාගෙන ඇත.

LKAS 16 මගින් දක්වා ඇති පරිදි පවත්නා හොඳම තොරතුරු සහ වත්කම්වල අපේක්ෂිත ආර්ථිකමය ජීව කාලය මත පදනම් ව ක්ෂය වීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ජීව කාලය සහ ජීව අගයන් වික් වික් වාර්තාකරණ දිනය වන විට කළමනාකරණය මගින් සුදුසු පරිදි ගැලපීම් සිදු කොට සමාලෝචනය කෙරෙයි. මෙම ඇස්තමේන්තුවල පවත්නා අවිනිශ්චිතතාවන් සමහර මෘදුකාංගවල සහ තොරතුරු තාක්ෂණ උපාංගවල උපයෝගීතාව වෙනස් කරන්නා වූ යල්පැන ගිය තාක්ෂණික දෝෂ හේතුවෙන් සිදු වේ.

වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි	වසර 15-40
මෝටර් වාහන	වසර 8-15
පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වසර 4-10
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	වසර 4-10
වෙනත් ස්ථාවර වත්කම්	වසර 4-10

4.3 පිළිගැනීම අත්හැරීම

දේපළ සහ උපකරණ අයිතමයන් ඉවත් කළ විට හෝ පාවිච්චි කිරීමෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු විය නොහැකි තත්ත්වයට පත් වූ විට හෝ එවැනි දේපළ සහ උපකරණ පිළිගැනීම අත්හරිනු ලැබේ. දේපළ පිරියත සහ උපකරණ අයිතමයන් පිළිගැනීම අත්හැරීමෙන් සිදුවන ලාභය හෝ අලාභය වශයෙන් නිශ්චය කරනු ලබන්නේ එවැනි වත්කමක් විකුණාලත් මුදලක් එකී ඉදිරියට ගෙන ආ අගයත් යන දෙකේ වෙනස වන අතර එම ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි පෙන්වනු ලැබේ.

4.4 ස්පෘශ්‍ය වත්කම්වලට හානි සිදුවීම

අධිකාරිය සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේ දීම එහි ස්පෘශ්‍ය වත්කම්වලට හානි සිදුවීම නිසා කිසියම් අලාභයක් සිදුවී ඇති බව පෙනෙන්නට ඇත්දැයි නිශ්චය කිරීම සඳහා එම වත්කම්වල ඉදිරියට ගෙන ආ අගයන් සමාලෝචනය කරයි. එවැන්නක් පෙනෙන්නට තිබේ නම් හානි අලාභ කොපමණදැයි නිශ්චය කිරීම සඳහා අදාළ වත්කමෙන් අයකර ගත හැකි මුදල කොපමණදැයි තක්සේරු කරනු ලැබේ. එක් තනි වත්කමක් මත අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථාවක දී එම වත්කම අයත් වන සම්පූර්ණ මුදල් උත්පාදන ඒකකය සඳහාම අයකර ගත හැකි මුදල නිශ්චය කරනු ලැබේ. ඒ සඳහා හේතු සහිත සහ යථායෝග්‍ය වෙන් කිරීමේ පදනමක් හඳුනාගැනීමට හැකිවන අවස්ථාවන්හි වත්කම් මුදල් උත්පාදනය ඒකක වශයෙන්ද වෙන් කරනු ලැබේ. එසේ නැතහොත් එවැනි හේතු සහිත සහ යථායෝග්‍ය වෙන්කිරීමේ පදනමක් හඳුනාගත හැකි කුඩාම මුදල් උත්පාදන ඒකක කාණ්ඩයට වෙන් කරනු ලැබේ.

අයකර ගත හැකි මුදල වනුයේ විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගය හෝ පාවිච්චි කරන අතරතුර අගය යන දෙකෙන් වැඩි අගයයි. පාවිච්චිය අතරතුර අගය තක්සේරු කිරීමේදී මුදලේ කාල අගයපිළිබඳ වර්තමාන වෙළඳපොලේ තක්සේරුව සහ අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු ගැලපුම්කර නැති වත්කමකට විශේෂිත වූ අවදානම පිළිබිඹු කෙරෙන පූර්ව බදු වට්ටම් අනුපාතයක් යොදමින් ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක් (මුදල් උත්පාදන ඒකකයක)අයකර ගත හැකි මුදල එහි ඉදිරියට ගෙන ආ අගයට වඩා අඩු බවට ඇස්තමේන්තු කර ඇති අවස්ථාවක එකී වත්කමේ (මුදල් උත්පාදන ඒකකයේ) ඉදිරියට ගෙන යන අගය අයකර ගතහැකි ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබේ. එවිට වහාම ආදායම් ප්‍රකාශයෙහි හානි අලාභයක් පිළිගනු ලැබේ. එහෙත් අදාළ වත්කම ඉදිරියට ගෙනවුත් ඇත්තේ ප්‍රත්‍යාගණන අගයට නම් අදාළ හානි අලාභය ප්‍රත්‍යාගණන අඩුවීමක් ලෙස සලකනු ලැබේ.

4.5 කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ

කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ පිරිවැය මත සටහන් කෙරේ. මෙම ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්වලට ගොඩනැගිලි ඉදිකිරීමේ දී සෘජුව සිදු වන වියදම් සහ ප්‍රාග්ධන සම්පාදනය සඳහා බලාපොරොත්තු වන පද්ධති සංවර්ධනය අයත් වේ.

මෙම වියදම් සම්පූර්ණ කිරීමේ සහතිකය ලැබුණු පසු හෝ වත්කම භාවිතයට ගත හැකි විට CAASL වත්කම් රෙජිස්ටරයට ඇතුලත් කෙරෙනු ඇත.

4.6 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් මැනීම සඳහා පිරිවැය මොඩලය භාවිතා කරනු ඇත.

පිරිවැය මත (වත්කමේ ශේෂ අගයෙන් 10% ක් අඩුකර) සරල මාර්ග පදනම IT මෘදුකාංගවල ක්‍රමක්ෂය ප්‍රමාණයන් ගණනය කරනු ලැබේ. සියලුම IT මෘදුකාංග ඒවායේ ඵලදායී ජීව කාලය අවසන් වීම සමග කපා හැරීම සඳහා 50% ක ප්‍රතිශතයකින් වාර්ෂිකව ක්‍රමක්ෂය කරනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව ඉස්මතු වන අවස්ථාවලදී කලින් කලට සමාලෝචනය කෙරෙනු ඇත. තොරතුරු තාක්ෂණ මෘදුකාංගවල ඵලදායී ආයු කාලය පහත පරිදි වේ.

තොරතුරු තාක්ෂණ මෘදුකාංග	වසර 2- 4

4.7 කල්බදු ගිවිසුම්

4.7.1 භාවිත කිරීමේ අයිති වත්කම්

අධිකාරිය විසින් කල්බද්ද ආරම්භ වන දිනයේදී භාවිත කිරීමේ අයිති වත්කම් පිළිගනු ලැබේ. (පවතින වත්කම භාවිත කිරීමට හැකි වන දිනය ඇතුළුව) භාවිත කිරීමේ අයිති වත්කම් පිරිවැය මත ගණනය කෙරේ. භාවිත කිරීමේ අයිති වත්කම් කල්බදු කාල සීමාව තුළ සෘජු රේඛා පදනමක් මත ක්ෂය කෙරෙන අතර ඇස්තමේන්තු ගත භාවිත කිරීමේ අයිති වත්කම්වල ආයු කාලය පහත පරිදි වේ.

වත්කම	ඇස්තමේන්තුගත ආයු කාලය
ඉඩම්	වසර 30කට වඩා

4.7.2 කල්බදු වගකීම්

කල්බද්ද ආරම්භ වන දිනයේදී අධිකාරිය විසින් කල්බදු කාල සීමාව තුළ සිදු කළ යුතු බදු ගෙවීම් වල වර්තමාන අගය මත ගණනය කෙරෙන කල්බදු වගකීම් හඳුනා ගනියි. කල්බදු ගෙවීම්වල වර්තමාන අගය ගණනය කිරීමේදී අධිකාරිය විසින් කල්බද්ද ආරම්භ වන දිනයේ පවතින භාණ්ඩාගාර බැඳුම්කර අගය භාවිතා කරයි.

5. ලේඛනගත භාණ්ඩ තොග

සියළු තොග අගය කර ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිශ්චය කරනුයේ First in First out (FIFO) පදනම මතය. ලේඛනගත භාණ්ඩවලට ලිපිදුව්‍ය සහ පරිභෝජනය කළ හැකි දෑ අයත් වේ.

6. වෙනත් වත්කම්

වෙනත් වත්කම් අතරට වෙනත් ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ ද, අත්තිකාරම්, තැන්පතු, පෙරගෙවුම් සහ ලැබිය යුතු බදු මුදල් ද අයත් වේ.

(අ) අත්තිකාරම්, තැන්පතු, පෙරගෙවුම් වියදම්
එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයකට ප්‍රතිලාභ ලැබෙන හෝ සම්බන්ධකමක් ඇති බවට සැලකිය හැකි වියදම්, අත්තිකාරම්, තැන්පතු සහ පෙර ගෙවූ වියදම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. එවැනි වියදම් ඒවාට අදාළවන කාලසීමාව තුළ සමාන කාල පදනමකින් කපාහරිනු ලැබේ.

(ආ) වෙනත් ණයගැතියෝ
වෙනත් ණයගැතියෝ හානි අලාභ අඩු කළ පිරිවැයට පිළිගනු ලැබේ.

(ඇ) ලැබිය යුතු බදු මුදල්
ලැබිය යුතු බදු මුදල් පිරිවැයට පිළිගනු ලැබේ.

(ඈ) පෙර ගෙවූ කාර්ය මණ්ඩල
වීරිවැය අධිකාරියේ සේවකයින්ට සහන පොළි අනුපාත මත ලබාදී ඇති කාර්ය මණ්ඩල ඉතිරිය මෙයින් නියෝජනය වේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(ඉ) ලැබිය යුතු වැට් බදු
මෙමගින් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වැට් ආපසු ලැබීම් නියෝජනය වේ.

7. මුදල් හා මුදල් සමාන දෑ

කලින් දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට පමණක් යටත් අධි ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජන සහ අත ඇත මුදල් වලින් මුදල් සහ මුදල් සමාන දෑ සැදුම් ලබයි. මේවා තබාගන්නේ කෙටිකාලීන මුදල් අවශ්‍යතා පිරිමසා ගැනීමටය.

මුදල ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් සලකනු ලබන්නේ අතැති මුදල් සහ බැංකු තැන්පතුය. කෙටිකාලීන කල් පිරෙන ආයෝජන ද මුදල් හා සමාන දෑ වශයෙන් සලකනු ලැබේ. බැංකු අයිරාවන් ඒකාබද්ධ ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ ණය ගැනීම් ඇතුළත පෙන්වනු ලැබේ.

8. ප්‍රතිපාදන

අදාළ වගකීම් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් ගලනයක් අවශ්‍ය විය හැකි, එමෙන්ම වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාස කළ හැකි ඇස්තමේන්තුවක් ද සකස් කළ හැකි වර්තමාන වගකීමක් (විනිමය හෝ අනුමත) පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරිය මත පැවරී ඇති කල්හි ප්‍රතිපාදන පිළිගනු ලැබේ. මුදලෙහි කාල අගයෙහි බලපෑම වැදගත් වන්නේ නම් මුදලෙහි කාල අගය පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ උචිත අවස්ථාවන්හි වගකීමට විශේෂිත වූ අවදානම ද පිළිබිඹු කෙරෙන පූර්ව බදු වට්ටම් අනුපාතයකින් අපෙක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ.

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 7(h) වගන්තිය ප්‍රකාර ගුවන්යානා අනතුරු සහ සිදුවීම් පිළිබඳ විමර්ශනය ආරම්භ කිරීමේ සහ සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමේත් කාර්යයන් සහ රාජකාරී මෙන්ම ඒ සඳහා අවශ්‍ය බලතල ද අධිකාරිය මත පවරනු ලැබ ඇත. 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතේ VI පරිච්ඡේදයේ 53, 54 සහ 55 වගන්තිවල ඇතුළත් විධිවිධාන තුළද මෙම කාරණය තවදුරටත් සවිස්තරව සඳහන් වී ඇත.

ශ්‍රී ලංකාව අති විශාල සාගරික ගුවන් අවකාශයක් හිමි රාජ්‍යයකි. මෙම විශාල සාගරික ගුවන් අවකාශයට සහ ශ්‍රී ලංකා දේශයට ඉහළින් පියාසර කරන ගුවන්යානා චලන සංඛ්‍යාව මෙන්ම රට තුළට සහ ඉන් පිටතට මෙහෙයුම් කෙරෙන ගුවන්යානා සංඛ්‍යාව ද නිරන්තරයෙන් වැඩිවෙමින් පවතින හෙයින් ගුවන්යානා අනතුරු විමර්ශනය කිරීමේ කාර්යයන් සහ සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අරමුදලක් වෙන්කර තබා ගැනීමේ වෙනස් කළ නොහැකි වගකීමක් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය මත පැවරී ඇත.

මෙම කරුණු අනුව ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය සඳහාත් සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම් සඳහාත් රුපියල් මිලියන 50 ක අරමුදලක් සංචිතයක් වශයෙන් වෙන්කර තබාගැනීම සඳහා 2018 මැයි මස 30 වන දින පවත්වන ලද CAASL හි 145 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා පත්‍රයක් (DP/ May/2018/03 (a) ඉදිරිපත් කරන ලදී.

9. සේවක ප්‍රතිලාභ

9.1 නිශ්චිත දායක මුදල් සැලසුම්

පිළිවෙලින් අදාළ වන ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වීමේ හිමිකම් ලැබී ඇත. අධිකාරිය සේවකයින්ගේ දළ වැටුප අනුව නිශ්චිත දායක මුදල් ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලටත් සේවක භාරකාර අරමුදලටත් ගෙවන අතර ඊට අමතරව කිසිවක් ගෙවීමට නීතිමය වශයෙන් හෝ අනුමත වශයෙන් බැඳී නැත.

9.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායක මුදල් සැලසුම්වලට අමතරව පශ්චාත් රැකියා සැලසුම්ය. 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අධිකාරිය සේවකයින්ට පාරිතෝෂික ගෙවීමට නීතියෙන් බැඳී ඇත. මෙම වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සේවකයකු සේවයෙහි යෙදවෙන සෑම වක් වර්ෂයක් වෙනුවෙන්ම මාසයක වැටුප බැගින් ගණනය කිරීමෙන් නිශ්චය කරනු ලබන අතර එසේ ගණනය කිරීම සිදු කරන්නේ LKAS -19 හි දක්වා ඇති පරිදි සූත්‍ර ක්‍රමය පදනම් කරගෙනය. වසර අවසානයේ පාරිතෝෂික ප්‍රතිපාදන වටිනාකම සඳහා වෙනම ආයෝජනයක් නඩත්තු කෙරේ.

9.3 කාර්ය මණ්ඩල සුභසාධනය සහ සමාජ රක්ෂණ අරමුදල

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී පනතේ 20(5) වගන්තිය ප්‍රකාර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා සිවිල් ගුවන්සේවා අධිකාරියට බැඳෙන රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් කාර්යය මණ්ඩල සුභසාධන සහ සමාජ රක්ෂණ අරමුදල පිහිටවනු ලැබ ඇත. එක් එක් විශ්‍රාමික නිලධාරියා නමින් මෙම අරමුදලහි තැන්පත්ව ඇති මුදල ඒ ඒ නිලධාරියා සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් විශ්‍රාම ලබන විට සමුච්චිත පොළියද සමග නිදහස් කර දෙනු ඇත.

10. මූල්‍ය වගකීම්

10.1 මූලික පිළිගැනීම සහ මිණුම

LKAS 39 විෂය පථය තුළට ගැනෙන මූල්‍ය වගකීම් ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම් හෝ උචිත පරිදි ණය මුදල් සහ ණයට ගැනීම් වශයෙන් වර්ග කරනු ලැබේ. අධිකාරිය එහි මූල්‍ය වගකීම්වල වර්ගීකරණය මුල් පිළිගැනීමේ දී ම නිශ්චය කරයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ණය මුදල් සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය කළ පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ. මීට සෘජු ගනුදෙනු පිරිවැය ද ඇතුළත් වේ. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ද අධිකාරියේ මූල්‍ය වගකීම්වලට ඇතුළත් වේ.

11. වෙනත් වගකීම්

උපචිත වියදම් ඇතුළු වෙනත් ණයහිමියෝ වෙනත් වගකීම්වලට ඇතුළත් වේ. මෙම වගකීම් ඒවායේ සාධාරණ අගය වශයෙන් සලකනු ලබන වෙතිහාසික අගයට ප්‍රකාශ කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

12. ආදායම පිළිගැනීම

12.1 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ 12 වන වගන්තිය ප්‍රකාර අධිකාරිය ඊටම අයත් අරමුදලක් පවත්වාගෙන යායුතු අතර 12(2) වගන්තිය යටතේ අධිකාරියට ලැබෙන සියලුම මුදල් එම අරමුදලට ගෙවිය යුතු වේ. 12(2) වගන්තිය යටතේ ලැබුණු මුදල් SLFRS 15 අනුකූලව ඉදිරිපත් කිරීමේ කාර්යයන් සඳහා මුදල් ප්‍රකාශයන්හි ආදායම යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

12.2 ආදායම් මාර්ග

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පහත සඳහන් ක්‍රමවලින් ආදායම් ලබා ගනියි.

- මෙහෙයුම් ආදායම
  - විදේශ විකුණුම් අධිභාරය
  - අපගමන බදු රැස් කිරීමේ සේවා ගාස්තු
  - නියාමන සේවා : බලපත්‍රවල මුල්වර නිකුත් කිරීම සහ අලුත් කිරීම/ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර සංශෝධන/නියාමන සේවා ගාස්තු/ විභාග ගාස්තු.
- මෙහෙයුම් නොවන ආදායම
  - වෙනත් ආදායම්
  - පොලී ආදායම (කාර්ය මණ්ඩල ණය සහ මූල්‍ය සාධන පත්‍ර මගින්)

විදේශ විකුණුම් අධිභාර/අපගමන බදුවල සේවා ගාස්තු/නියාමන සේවා මගින් ලැබෙන ආදායම එම අදාළ සේවාවන් ලබා ගන්නා කාල සීමාවේ පවතින සාධාරණ අගයට අනුව හඳුනා ගැනේ.

12.3 පොළී ආදායම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය මෙවලම් ඇතුළු සියලුම පොළී උත්පාදන මූල්‍ය මෙවලම්වල පොළී ආදායම බලාත්මක පොළී අනුපාත ක්‍රමය යොදාගෙන ආදායම් ප්‍රකාශයෙහි "ආයෝජන ආදායම" වශයෙන් පිලිගනු ලැබේ. අනාගතයට ලැබිය යුතු මුදලක් ලැබීමේ හැකියාව අඩු වී ඇති අවස්ථාවක මූල්‍ය මෙවලමේ ආරම්භක බලාත්මක පොළී අනුපාතයෙන් වට්ටම් කරනු ලැබූ තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහය ද වන නැවත අයකර ගත හැකි මුදල දක්වා අධිකාරියේ ඉදිරියට ගෙන යන මුදල අඩු කරනු ලැබේ. අනතුරුව වට්ටම් පොළී ආදායම ලෙස නොකඩවා ප්‍රතිවර්තනය කරනු ලැබේ.

12.4 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

13. වියදම් පිළිගැනීම

සියලුම වියදම් ඒවා අදාළ වන කාලසීමාව තුළ දක්වන ලද සහ පිළිගන්නා ලද ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ.

වත්කමක ඵලදායි ජීවකාලයේ වෙනස්වීම් හෝ එහි අන්තර්ගත ප්‍රතිලාභ පාරිභෝජනය කිරීමට අපේක්ෂිත රටාවේ වෙනස්කම්වලට සරිලන පරිදි ක්ෂය කිරීමේ කාල පරාසය වෙනස් කරන අතර එවැනි වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් වශයෙන් ද සලකනු ලැබේ.

14. ණයට ගැනීමේ පිරිවැය

ණයට ගැනීමේ පිරිවැය වනුයේ අරමුදල් ණයට ගැනීමේ දී අධිකාරිය විසින් දරණු ලබන පොළිය සහ වෙනත් පිරිවැයයි. එකී වියදම් දරන ලද කාලසීමාව තුල සිදු වූ වියදම් ලෙස සලකනු ලැබේ.

15. ප්‍රවර්තන සහ කල්තැබූ ආදායම් බදු

15.1 කාල සීමාව සඳහා වූ බදු වියදම් තුළට ප්‍රවර්තන සහ කල්තැබූ බදු අයත් වේ. බදු ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. එහෙත් කිසියම් බදු මුදලක් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හෝ සෘජුව ස්කන්ධය තුළ හෝ පිළිගෙන ඇති අයිතමයන්ට අදාළ වන්නේ නම් එවැනි බදු පිලිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙහි හෝ සෘජු ලෙස ස්කන්ධයෙහි හෝ පිළිගනු ලැබේ.

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් සැදුම්ලන්නේ ප්‍රවර්තන වර්ෂයට මෙන්ම පෙර වර්ෂවලට ද අදාළව බදු අයකරන බලධාරීන්ගෙන් අයකර ගැනීමට ඇති හෝ ඔවුනට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණයන්ගෙනි. මෙකී බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට පෙර හෝ ඉන්පසුව හෝ සම්මත කරනු ලබන බදු නීති සහ බදු අනුපාතයන්ය. මේ අනුව 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එකී සංශෝධනවල විධිවිධානවලට අනුකූලව බදු කාර්යයන් සඳහා ගැලපුම් කරන ලද වාර්ෂික ලාභය මත පදනම්ව බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබේ.

වත්කම් සහ වගකීම්වල බදු පාදක සහ මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරියට ගෙනයන අගයන් අතර පැන නගින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදවමින් කල්තැබූ ආදායම් බද්ධ පැන නගින්නේ ගනුදෙනුව සිදුකරන අවස්ථාවේ ගිණුම් කෙරෙහි හෝ බදු අය කළ හැකි පොළිය කෙරෙහි හෝ බලපෑමක් සිදු නොවන ව්‍යාපාර හවුලක් නොවන ගනුදෙනුවකට අදාළ වත්කමක හෝ වගකීමක හෝ මූලික පිළිගැනීමේ දී නම් එය ගිණුම්ගත කරනු නොලැබේ. කල් තැබූ ආදායම් බදු නිශ්චය කරනු ලබන්නේ වාර්තා කරන කාලය අවසන් වන විට හෝ ඊට පසුව හෝ සම්මත කර තිබුණු සහ අදාළ කල්තැබූ ආදායම් බදු වත්කම උපලබ්ධි වන විට හෝ අදාළ කල්තැබූ ආදායම් බදු වගකීම නිරවුල් කරන විට හෝ අදාළව පවතී යයි අපෙක්ෂා කරනු ලබන බදු අනුපාත (සහ නීති) උපයෝගී කරගෙනය. කල්තැබූ ආදායම් බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික කල්තැබීම් ඊට එරෙහිව පාවිච්චි කළ හැකි අනාගත බදු අය කළ හැකි පොළියක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන තාක් දුරකට ය.

තාවකාලික කල්තැබීම් ප්‍රතිවර්තනය කිරීමේ කාලය අධිකාරිය විසින් පාලනය කරනු ලබන සහ පෙනෙන අනාගතයේ දී එය ප්‍රතිවර්තනය නොවිය හැකි බව විශ්වාස කළ හැකි අවස්ථාවන්හි දී හඳුනා ගනු ලැබේ.

කල්තැබූ ආදායම් බද්ද අනුබද්ධිත සහ ආශ්‍රිත සමාගම්වල කළ ආයෝජනයන් හි ඇති වන තාවකාලික වෙනස්වීම් සඳහා, විශේෂයෙන් ම අධිකාරිය විසින් තාවකාලික වෙනස නැවත ආපසු හැරවීම පාලනය කරන සහ තාවකාලික වෙනස්වීම ආපසු හැරවෙන බවට පිළිඹිබු නොවන අවස්ථාවකදී ලබා දෙන්නකි.

ප්‍රවර්ථක බදු වත්කම්වලට එරෙහිව බදු වගකීම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතිවාසිකමක් තිබේ නම් සහ කල්තැබූ ආදායම් බදු වත්කම් සහ වගකීම් එකම බදු අයකිරීමේ බලධාරියෙකු බදු ගෙවිය යුතු එකම ආයතනයක් මත හෝ ශුද්ධ පදනමකින් ශේෂ නිරවුල් කිරීමට අපේක්ෂා කරන වෙන් වෙන් වූ බදු ගෙවිය යුතු ආයතන මත හෝ පනවන ලද බදු මුදල්වලට අදාළ වන්නේ නම් හෝ එවැනි වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ. කටයුතු නොකළ අලාභ සහ කටයුතු නොකළ බදු ණය මුදල් ඉදිරියට ගෙන ආ ශේෂයන්හි බදු බලපෑම් එකී අලාභ හිලව් කිරීමට ප්‍රමාණවත් බදු ගෙවිය යුතු ලාභ අනාගතයේ දී ලැබෙනු ඇතැයි සිතිය හැකි නම් වත්කම් වශයෙන් පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

15.2 විලම්බිත බදු වත්කම් සහ වගකීම් සඳහා විශ්ලේෂණය

	2020	2019
ආරම්භක ශේෂය	**28,389,010**	28,584,877
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වලින්	**1,653,645**	2,230,073
ක්ෂණික බදු ක්ෂය වීමෙන්	**(5,159,197)**	(2,425,941)
ශුද්ධ විලම්බිත බදු වගකීම්	**24,883,458**	28,389,019

2018 වසරට පෙර ගිණුම් වර්ෂ සඳහා පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් වූ ප්‍රතිපාදන සඳහා කල්තැබූ ආදායම් බදු වගකීම සැලකිල්ලට ගෙන නැත.

15.3 ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කළ බදු වියදම් සහ ගිණුම්කරණ ලාභය අතර සැසඳීම පහත පරිදි වේ.

	2020 රු.	2019 රු.
ආදායම් බද්දට පෙර ගිණුම් ලාභය	**306,680,309**	1,873,063,164
අඩු කළා: වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සහ බද්දෙන් නිදහස් ආදායම	**311,173,020**	257,059,797
	(4,492,711)	1,616,003,367
අඩු කළ නොහැකි වියදම්	**140,795,485**	91,184,783
ව්‍යාපාරයෙන් ලද ව්‍යවස්ථාපිත ආදායම	**136,302,774**	1,707,188,151
අඩු කළා: බදු නිදහස් ලාභය		-
බදු අය කළ හැකි ආදායම - ව්‍යාපාර ආදායම	**136,302,774**	1,707,188,150
බදු අය කළ හැකි ආදායම - ව්‍යාපාර නොවන ආදායම	**168,005,644**	201,431,880
බදු අය කළ හැකි මුළු ආදායම	**304,308,418**	1,908,620,030
ආදායම් බදු වියදම්		
බදු අය කළ හැකි ආදායම - ව්‍යාපාර සහ ව්‍යාපාර නොවන ආදායම 24% (2019-28%)	**73,034,020**	534,413,608
ආදායම් බදු වියදම්	**73,034,020**	534,413,608

16. විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය/ගනුදෙනු

ශ්‍රී ලංකාවේ ව්‍යාවහාර මුදල් නොවන වෙනත් ව්‍යවහාර මුදල් වර්ග යොදාගෙන සිදුකරනු ලබන සියලු ගනුදෙනු එකී ගනුදෙනු සිදුකරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදාගෙන ශ්‍රී ලංකා රුපියල්වලින් වාර්තා කරනු ලැබේ. සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයකදී ම විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වාර්තා කරන දිනයේ බලපැවැත්වෙන විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල් වලට යළි පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් අදාළ ගනුදෙනුව සිදු කළ දිනයේ පැවති විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල් දක්වා පරිවර්තනය කරනු ලැබේ. මූල්‍ය අයිතම නිරවුල් කිරීමේ දී සහ මූල්‍ය අයිතම යළි පරිවර්තනය කිරීමේ දී පැන නගින විනිමය වෙනස්කම් එකී වෙනස්කම් පැන නැගුණු වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

17. වාර්තාකරණ කාලයට පසු සිදුවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සියළු සිදුවීම් සම්පයෙන් නිරීක්ෂණය කරන අතර ශේෂ පත්‍ර දිනයෙන් පසු වැදගත් සිදුවීම් සම්බන්ධව ප්‍රවර්ථන මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය ගැළපුම් හෝ හෙළිදරව් කිරීම් සුදුසු පරිදි සිදුකරනු ලැබේ.

18. අසම්භාව්‍ය වගකීම්

පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අනාගත වගකීමක් උද්ගත විය හැකිනම් හෝ පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වහයෙන් වර්තමාන වගකීමක් පැවරී ඇත්නම් සහ ඒ සඳහා ගෙවීමක් සිදු කළ නොහැකි නම් හෝ ගෙවිය යුතු මුදල සාධාරණ අන්දමින් ඇස්මේන්තු කළ නොහැකි නම් හෝ ඒවා අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කරනු ලැබේ.

19. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්ට අදාළ අංක 07 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත.

මුදල් නොවන ස්වභාවයේ ගනුදෙනු අතීත හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම් කල්තැබීම් හෝ උපචිත වීම් සහ මුදල් ප්‍රවාහ ආයෝජනය කිරීම හෝ මූල්‍යනය කිරීම ආශ්‍රිත ආදායම් හෝ වියදම් කිසිවක් යනාදියේ බලපෑම් අනුව ගැලපුම් කරන ලද ලාභය හෝ අලාභය මෙකී වක්‍ර ක්‍රමයෙන් හෙළිදරව් වෙයි.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

20. රජයේ ප්‍රදාන

රජයේ ප්‍රතිපාදන සාධාරණ වටිනාකමින් පිළිගනු ලැබුවේ ඒවා ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට හෝ ඒවා අධිකාරියට පැවරූ විට ය.

අධිකාරිය පිහිටුවන ලද අවස්ථාවේ දී සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලද වත්කම්වල සහ පහත සඳහන් වත්කම්වල සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර රජයේ ප්‍රදානයන්හි අගය වශයෙන් පෙන්වා ඇත.

රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය/තක්සේරු අගය මත (වත්කම් පිරිවැය/තක්සේරු වටිනාකමේ ශේෂ අගයෙන් 10% ක් අඩු කර) සරල මාර්ග ක්‍රමය යොදමින් ක්‍රමක්ෂය ප්‍රමාණ ගණනය කරනු ලැබේ. අනුරූපී ගිණුමක් ලෙස පවත්වාගෙන යනු ලබන රජයේ ප්‍රදාන යටතේ ගිණුම් ගත කරනු ලබන ඉඩම් හැර සියලු දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ ඵලදායි ජීවකාලය පුරා පහත සඳහන් ප්‍රතිශතයන්ගෙන් වාර්ෂිකව ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

ගොඩනැගිලි	6 2/3%
මෝටර් වාහන	12.5%
පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	25%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	25%
වෙනත් ස්ථාවර වත්කම්	25%

21. ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සහ අදාළ පාර්ශව ගනුදෙනු

21.1 ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති LKAS -24 අදාළ පාර්ශව අනාවරණයන් අනුව ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් වන්නේ අධිකාරියේ කාර්යයන් සැලසුම් කිරීමේ, මෙහෙයවීමේ සහ පාලනය කිරීමේ වගකීම දරන තැනැත්තන්ය. එබැවින් අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය එහි ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් වශයෙන් වර්ගීකරණය කරනු ලැබ ඇත.

	2020 රු.	2019 රු.
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	**3,809,915**	2,426,420
පශ්චාත් රැකියා ප්‍රතිලාභ	-	-
වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ	-	-
අවසන් කිරීමේ ප්‍රතිලාභ	-	-

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

21.2 අදාළ පාර්ශව ගනුදෙනු

සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග පහත සඳහන් වැදගත් ගනුදෙනු සිදු කර ඇත.

ආයතනයේ නම	සම්බන්ධතාවය	ගනුදෙනුවේ ස්වභාවය	2020 රු.	2019 රු.
සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්	රජයට අයත්	විදේශ විකිණුම් අධිභාර ආදායම	**223,595,211**	794,054,426
ලංකා විදුලිබල මණ්ඩලය	-එම-	විදුලි ගාස්තු	**13,096,725**	14,949,551
සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (පෞද්) සමාගම	-එම-	විදුලි ගාස්තු	**861,011**	1,312,014
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	-එම-	ජල ගාස්තු	**219,747**	92,885
සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (පෞද්) සමාගම	-එම-	ජල ගාස්තු	**475,998**	497,965
මහා භාණ්ඩාගාරය	-එම-	අපගමන බදු	**7,548,000,772**	22,125,349,426
සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (පෞද්) සමාගම	-එම-	අපගමන බදු	**2,111,645,812**	5,749,564,198
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	-එම-	අපගමන බදු	**429,225,521**	2,451,397,483
සේවක භාර අරමුදල් මණ්ඩලය	-එම-	සේවක භාරකාර අරමුදල	**7,379,359**	7,236,500
සේවක අර්ථසාධක අරමුදල	-එම-	සේවක අර්ථසාධක අරමුදල	**36,896,796**	36,182,499
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	-එම-	ආදායම් බදු	**164,706,977**	573,149,050
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	-එම-	මුද්දර ගාස්තු	**1,284,493**	1,628,876
මාර්ග සංවර්ධන අධිකාරිය	-එම-	පලාලි ගුවන් තොටුපල සංවර්ධනය	**-**	410,702,753
සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (පෞද්) සමාගම	-එම-	පලාලි ගුවන් තොටුපල සංවර්ධනය	**-**	137,014,875
මිහින්දෝරු දෙපාර්තමේන්තුව	-එම-	පලාලි ගුවන් තොටුපල සංවර්ධනය	**-**	6,971,220
ලංකා විදුලිබල මණ්ඩලය	-එම-	පලාලි ගුවන් තොටුපල සංවර්ධනය	**-**	3,213,896
ශ්‍රී ලංකා ටෙලිකොම්	-එම-	විදුලි සංදේශ ගාස්තු	**4,504,637**	4,582,180
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	-එම-	ඉන්ධන ගාස්තු	**347,744**	167,637
සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (පෞද්) සමාගම	-එම-	ඉන්ධන ගාස්තු	**3,902,142**	4,394,840
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	-එම-	රක්ෂණ ගාස්තු	**17,842,298**	12,420,136
ලංකා බැංකුව	-එම-	ආයෝජන	**1,621,865,492**	1,266,822,749
පීපල්ස් බැංකුව	-එම-	ආයෝජන	**857,950,000**	408,000,000
ශ්‍රීලංකන් කේටරින් සමාගම	-එම-	ආහාරපාන සේවා	**685,929**	179,400
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	-එම-	රත්මලාන ගුවන්තොටුපල සංවර්ධනය	**-**	503,257,124
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	-එම-	බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ සඳහා පුහුණු කළ ඉව අල්ලන සුනඛයින්	**22,111,831**	-
මාර්ග සංවර්ධන අධිකාරිය	-එම-	අධිවේගී මාර්ග ගාස්තු	**1,622,071**	2,212,174
ලැබිය යුතු දෑ	-එම-			
සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්	-එම-	විදේශ විකිණුම් අධිභාර ආදායම	**2,009,880**	33,943,219
ගෙවිය යුතු දෑ	-එම-			
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	-එම-	CAASL ගොඩනැගිල්ල සඳහා රඳවා ගැනීම්	**20,084,250**	40,168,499
මහා භාණ්ඩාගාරය	-එම-	අපගමන බදු	**921,708,695**	1,248,398,880
සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (පෞද්) සමාගම	-එම-	අපගමන බදු	**199,703,550**	270,486,424
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	-එම-	අපගමන බදු	**99,851,775**	135,243,212

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

තනි තනිව වැදගත් වන ගනුදෙනු සඳහා LKAS 24 - 'අදාළ පක්ෂ අනාවරණය කිරීම්' අනුව සීමිත අනාවරණය කිරීම් සිදු කර ඇත්තේ ඒවායේ විශාලත්වය හේතුවෙන් සහ රජයේ පාලිත/ආශ්‍රිත ආයතන සමග සිදු කර ඇති සියලුම ගනුදෙනු ග්‍රහණය කර ගැනීම හා අනාවරණය කිරීම ප්‍රායෝගික නොවන බැවිනි.

ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන ආයතනවලින්/ආයතනවලට ලැබිය/ගෙවිය යුතු ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ ලැබීම්, වෙළඳාම සහ වෙනත් ගෙවිය යුතු දේ යටතේ ඇතුළත් වේ.

22. මූල්‍ය අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. සිවිල් ගුවන්සේවා කර්මාන්තයට නියාමන සේවා සැපයීම මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යය වේ. කොටස්, ණයකර සහ ණය මුදල් ආදී මූල්‍ය මෙවලම්වලින් මෙම අධිකාරිය මූල්‍යනය නොවේ. මූල්‍ය මෙවලම් පාවිච්චිය නිසා පහත සඳහන් අවදානම්වලින් අවම බලපෑමක් පමණක් අධිකාරිය වෙත ඇතිවේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම

22.1 ණය අවදානම

මෙම අධිකාරියෙහි පාර්ශෝගිකයකු කොන්ත්‍රාත්තු ගත බැඳීම් සපුරාලීමට අපොහොසත් වන අවස්ථාවන්හි සහ ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර සහ බාහිර පාර්ශව වලින් ලැබිය යුතු මුදල් නොලැබීමෙන් අධිකාරියට සිදුවන මූල්‍ය අලාභය ණය අවදානම ලෙස හැඳින්විය හැකිය.

ආයෝජන

රජයේ භාණ්ඩාගාර බිල්පත්වල පමණක් අයෝජනය කිරීම මගින් සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ නිල බැංකුකරු වන ලංකා බැංකුවේ පමණක් කෙටිකාලීන තැන්පතු කිරීම මගින් ණය අවදානමට ලක්වීමේ අවස්ථා අධිකාරිය විසින් අවම කරගනු ලැබ ඇත.

සේවක ණය

සේවකයින්ගේ මාසික වැටුපෙන් ණය ශේෂ ආපසු අයකර ගන්නා බව තහවුරු කර ගැනීම මගින් හෝ සේවකයා ආයතනයෙන් ඉවත්ව යන අවස්ථාවෙහි ඇපකරුවන්ගෙන් ණය මුදල් අයකිරීම මගින් ණය අවදානමට නිරාවරණය වීමේ අවස්ථා ශ්‍රී ලංකා ගුවන්සේවා අධිකාරිය විසින් අවම කරගනු ලැබ ඇත. මෙම ණය මුදල් වැය කර සේවකයින් මිලදී ගන්නා දේපළවල පරම හිමිකරු වන්නේ ද ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියයි.

22.2 ද්‍රවශීලතා අවදානම

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට එකී මූල්‍යමය බැඳීම් ඉටුකළ යුතු අවස්ථාවන්හි එසේ ඉටු කළ නොහැකිවීමේ අවදානම ද්‍රවශීලතා අවදානමයි. නොපිළිගත හැකි අලාභ සිදුවීම හෝ අධිකාරියේ කීර්තිනාමයට හානියක් සිදුවීමේ අවදානමක් ඇතිවීම හෝ වළක්වා ගනිමින් සාමාන්‍ය තත්ත්ව යටතේ මෙන්ම අනපේක්ෂිත තත්ත්ව යටතේ ද මූල්‍යමය බැඳීම් ඉටුකිරීමට සිදුවන අවස්ථාවන්හි එවැනි බැඳීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් මුදල් සෑමවිටම අධිකාරිය සතුව තිබෙන බවට හැකිතාක් දුරට සහතික වීම ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා අධිකාරියේ ප්‍රවේශය වේ.

අධිකාරිය රඳවා තබා ගන්නා රුපියල් මිලියන 5ට වැඩි අතිරික්ත මුදල් කෙටිකාලීන මධ්‍යකාලීන සහ දීර්ඝ කාලීන මූල්‍ය මෙවලම්වල ආයෝජනය කිරීම මගින් එහි ද්‍රවශීලතාවය පවත්වා ගන්නා බවට අධිකාරිය සහතික වෙයි. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ පුරෝකථනය සිදුකරනු ලැබේ. අධිකාරියේ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් මුදල් එය සතුව පවතින බව සහතික කිරීම සඳහා මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය විසින් අධිකාරියේ ද්‍රවශීලතා අවශ්‍යතා පිළිබඳ පෙරලුම් පුරෝකථන අධීක්ෂණය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

23. ආදායම්

	2020	2019
මෙහෙයුම් ආදායම්	**803,216,822**	2,288,452,284
මෙහෙයුම් නොවන ආදායම	**182,992,523**	215,603,274
මුළු ආදායම	**986,209,345**	2,504,055,558
මෙහෙයුම් ආදායම්		
විදේශ විකුණුම් අධිභාරය	**680,256,647**	1,989,473,679
අපගමන බදු රැස්කිරීමේ සේවා ගාස්තුව	**61,095,942**	222,074,304
නියාමන සේවාවන්ගෙන් ලැබුණු ආදායම	**61,864,233**	76,904,301
	803,216,822	2,288,452,284
මෙහෙයුම් නොවන ආදායම්		
කුලී ආදායම	**38,471**	70,041
සංචාරක බංගලාව වෙන් කර ගැනීම්	**63,250**	179,200
ටෙන්ඩර් ඉල්ලුම්පත් ගාස්තු	**51,900**	67,200
ගුවන් ගාස්තු සහ ප්‍රවේශ පත්‍ර පාඨමාලාවෙන් ලැබීම්	**285,600**	468,800
පරිපාලන දඩ මුදල්	**550,848**	90,000
ගුවන්සේවා ශත සංවත්සරය ග්‍රන්ථය විකිණීමෙන්	**-**	2,490
විවිධ ආදායම්	**518,441**	1,534,735
පරිපාලන ගාස්තු - ශිෂ්‍යයන් සඳහා වීසා නිර්දේශ	**108,000**	155,000
කාර්ය මණ්ඩල ණය පොළී ආදායම	**4,279,616**	4,117,999
භාණ්ඩාගාර බිල්පත්වලින් ලද පොළිය	**82,332,927**	157,043,183
ඇමතුම් තැන්පතුවලින් ලද පොළිය	**62,511,530**	31,108,226
වෙනත් ආයෝජනවලින් ලද පොළිය	**18,779,850**	7,275,956
	169,520,433	202,112,830
වෙනත් මෙහෙයුම් නොවන ආදායම්		
කාර්ය මණ්ඩල ණයවලින් ලද පොළිය (IFRS ගැළපුම්)	**9,196,191**	9,251,694
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	**4,275,899**	4,238,750
	13,472.090	13,490,444
මුළු ආදායම	**986,209,345**	2,504,055,558

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රාථමික ආදායම වන්නේ මගී ගුවන් ප්‍රවේශ පත්‍රවලින් ලැබෙන ආදායමයි. එම නිසා 2020 වර්ෂයේදී කොවිඩ් - 19 වසංගතය නිසා ඇති කරන ලද සීමා හේතුවෙන් ආදායම විශාල වශයෙන් පහළ යන ලදී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව එක් එක් දිනය අවසානයේ පවතින මුදල් ශේෂය යොදාගෙන හදිසි යෝජනා සිදු කිරීම සඳහා බැංකු කටුනායක ශාඛාවේ සහ මහජන බැංකු සීදුව ශාඛාවේ අරමුදල් කළමනාකරණ ගිණුම් ආරම්භ කර ඇත. මෙම කෙටිකාලීන ආයෝජන මගින් ඉපයූ පොලී ආදායම වෙනත් ආදායම් යටතේ දක්වා තිබේ.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

24. කාර්ය මණ්ඩල වියදම්

	2020	2019
වැටුප් සහ වේතන	**128,647,386**	127,536,653
වෙනත් දීමනා	**114,221,817**	104,299,465
සේවක අර්ථසාධක අරමුදල	**36,890,796**	36,182,499
සේවක භාරකාර අරමුදල	**7,378,159**	7,236,500
නිවාඩු මුදල් කිරීම	**10,428,105**	6,500,077
ප්‍රසාද දීමනා	**9,650,614**	8,566,568
අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප්	**9,135,704**	9,656,272
සුභසාධන වියදම්	**19,748,528**	16,288,701
පාරිතෝෂික	**6,890,187**	7,964,547
සේවකයන්ගේ මරණයකදී ලබා දෙන ප්‍රදාන	**1,860,840**	-
ණය ප්‍රතිලාභ මත කාර්ය මණ්ඩල පිරිවැය (IFRS ගැළපුම්)	**9,196,191**	9,251,695
සම්පූර්ණ කාර්ය මණ්ඩල වියදම්	**354,048,327**	333,482,977

25. රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

	2020	2019
වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා වියදම් - දේශීය	**1,251,760**	5,115,009
වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා වියදම් - විදේශීය	**529,834**	19,382,915
මුළු හමුවීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වියදම්	**1,781,594**	24,497,924

26. පුහුණු වියදම්

	2020	2019
පුහුණු වියදම් - දේශීය	**1,632,671**	3,924,209
පුහුණු වියදම් - විදේශීය	**3,445,611**	14,303,593
මුළු පුහුණු වියදම්	**5,078,282**	18,227,802

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

27. පරිපාලන සහ වෙනත් වියදම්

	2020	2019
පරීක්ෂණ	**1,044,254**	2,348,330
එළිමහන් රැස්වීම්	**247,235**	394,628
ගෘහස්ථ රැස්වීම්	**520,809**	646,084
ගමන් වියදම් - දේශීය	**1,622,071**	2,212,174
උපදේශන සහ නීති ගාස්තු	**81,132**	596,406
බාහිර තාක්ෂණික සහාය	**15,806,454**	13,581,840
අනුකූලතා කළමනාකරණ පිරිවැය	**-**	4,010
සම්මුඛ පරීක්ෂණ/කාර්ය මණ්ඩල ඇගයීම්	**105,500**	248,036
අධ්‍යක්ෂ මණ්ඩල ගෙවීම්	**958,500**	1,092,500
දේපළ පිරියත උපකරණ නඩත්තුව	**1,114,188**	1,086,959
ලිපිද්‍රව්‍ය සහ පාරිභෝගික ද්‍රව්‍ය වියදම්	**6,510,633**	9,483,473
දේශීය ගුවන් තොටුපල සංවර්ධනය	**-**	2,492,128
වෙනත් සැපයුම්	**2,557,964**	909,289
විදුලි සංදේශන	**8,079,981**	8,804,023
තැපැල් ගාස්තු	**92,171**	364,117
ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයට දායක මුදල්	**31,851,288**	36,922,885
ප්‍රකාශන සහ දැන්වීම් සඳහා දායක මුදල	**1,866,248**	5,801,820
විභාග ගාස්තු	**68,100**	696,200
මුද්‍රණ වියදම්	**2,190,024**	3,272,948
බැංකු ගාස්තු	**750**	850
කල්බදු වගකීම්වල මූල්‍ය පිරිවැය	**1,516**	-
විගණන ගාස්තු	**1,200,000**	1,200,000
වත්කම් ඉවත් කිරීමේ අලාභය	**125,663**	256,934
පරිවර්තන සහ යතුරුලියන ගාස්තු	**450,101**	306,010
සුභසාධන උපයෝගිතා - ක්‍රීඩා	**-**	225,098
විවිධ වියදම්	**37,520**	160,399
ඉන්ධන සහ ලිහිසි	**4,600,029**	5,500,360
වාහන නඩත්තුව	**6,579,123**	8,372,213
කුලීය සහ කුලී ගාස්තු	**19,146,000**	19,146,000
පොදු - සුභසාධනය	**2,019,113**	2,880,472
කාර්යාල ගොඩනැගිල්ල නිල නිවාසය සඳහා වියදම්		
විදුලිබලය	**13,420,707**	17,838,656
ජලය	**1,215,382**	1,302,763
සුරක්ෂිතතාව	**11,966,097**	9,061,257
පවිත්‍ර කිරීමේ සේවා	**12,121,997**	12,070,017
වෙනත් නඩත්තු කටයුතු	**11,737,418**	7,474,868
කළමනාකරණ සේවා	**-**	950,000
උද්‍යාන අලංකරණය සහ නඩත්තුව	**-**	371,950
ගුවන්සේවා සංවර්ධනය	**22,265,618**	3,968,008
සමාගම් සමාජයීය වගකීම	**424,000.00**	-
තොරතුරු තාක්ෂණ නඩත්තුව	**2,632,670**	3,936,101
සංවිධානමය අවස්ථා	**-**	1,032,731
ප්‍රවර්ධනාත්මක කටයුතු	**-**	86,221
පර්යේෂණ, සැලසුම් සහ සංවර්ධනය	**-**	3,566,000
ගුවන් ගාස්තු සහ ප්‍රවේශ පත්‍ර පාඨමාලාවේ වියදම්	**159,910**	203,017
මුළු පරිපාලන සහ වෙනත් වියදම්	**184,820,164**	190,867,775

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2019 ජනවාරි 29 වන දින කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අරමුදල් වලින් ඉව අල්ලන සුනඛයින් 20 දෙනෙකු මිලට ගෙන ඔවුන් පුහුණු කිරීම සඳහා ගුවන් හමුදාවට භාරදීමටත්, ඔවුන්ව තම භාරයට ගෙන තම මුදලින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ආරක්ෂාව සඳහා භාවිත කිරීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලබා දීමට අවසර ලැබෙන ලදී. එම නිසා, සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් රු. 22,111,831 ක මුදලකට ඉව අල්ලන සුනඛයින් 20 දෙනෙකු මිලට ගෙන ඇත. මෙය ගුවන් සේවා සංවර්ධන වියදම් යටතේ දක්වා ඇත.

28. ආදායම් බදු වියදම්

දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා වන ආදායම් බදුවල ප්‍රධාන කොටස් පහත පරිදි වේ.

	2020	2019
වර්තමාන ආදායම් බදු		
වර්තමාන බදු අයකිරීම		
ආදායම් බදු	**73,034,020**	524,457,686
කල්තැබූ බදු		
කල්තැබූ බදු ක්‍රමයට අනුව අය කිරීම / (ආපසු හැරවීම) (සටහන 39)	**(3,505,552)**	(195,868)
මුළු බදු වියදම්	**69,528,468**	524,261,818

අධිකාරිය විසින් උපයන ලාභ (බදුවලට පෙර) මත පැනවෙන බද්ද, අධිකාරියේ ලාභවලට අදාළ වන මූලික බදු අගය (24%) (2019- 28%) භාවිතා කරමින් ලබා ගන්නා සෛද්ධාන්තික අගයෙන් වෙනස් වේ. එය පහත පරිදි වේ.

	2020	2019
බද්දට පෙර ලාභය	**306,680,309**	1,873,063,164
24% අගයට ගණනය කරන ලද බද්ද (2019 - 28%)	**73,603,274**	524,457,686
බදු සඳහා අඩු කළ නොහැකි වියදම්වලට වන බද්ද	**74,112,271**	-
බද්දට අයත් නොවන ආදායම් සඳහා බදු බලපෑම		
බදු සඳහා අඩු කළ හැකි වියදම්/ ආදායම්වලට බලපෑම	**(74,681,525)**	(71,976,743)
කල්තැබූ ආදායම් බදු වත්කම් හඳුනා නොගත් බදු පාඩු	**(3,505,552)**	(195,868)
සම්පූර්ණ බදු වියදම්	**69,528,468**	524,261,818

29. දේපළ පිරියත සහ උපකරණ

i. මහා භාණ්ඩාගාරයෙන්/රජයෙන් හුවමාරු කරන ලද දේපළ, පිරියත සහ උපකරණ එම වත්කම් ලැබුණු දිනයෙහි පැවති සාධාරණ අගයෙන් දක්වයි. (2003 දී අගැයීම කර ඇත.) IFRS හැරවීම සඳහා, නැවත ගණනය කළ එම වත්කම්වල අගයන් 2011 ජනවාරි 1 දින වූ පිරිවැය ලෙස සළකා ඇත.

ii. වර්ගීකරණ වෙනස්කම් වසර තුළදී හඳුනාගෙන ඇති අතර, නැවත වර්ගීකරණය LKAS 1 ට අනුව සටහන්වී 30 සහ 31 හි දක්වා ඇති ආකාරයට වී අනුව සිදු කොට ඇත. ඉහත නැවත වර්ගීකරණයෙන් ලාභ වලට බලපෑමක් සිදුව නොමැත.

iii. සිවිල් භාවිතය සඳහා රත්මලාන ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් SLAF Y)12 Hangars, MA)60 Hanger, B)200 Hangar රත්මලානෙහි පිහිටි ගාල්කිරීමේ පිලිවැස්ම සමග වර්තමාන ප්‍රදේශයේ සිට උතුරු ප්‍රදේශයට නැවත ස්ථානගත කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නැවත ස්ථානගත කිරීමේ පිරිවැය ලෙස අතිරික්ත මුදල්වලින් රු. 759,800,000 ක් ලබා දීමට ද අවසර ලබා දී ඇත. මෙම මුදල 2020.02.10 දින ගොඩනැගිලි ශීර්ෂය යටතේ ප්‍රාග්ධනීකරණය කර ඇත.

iv. 2019 ජනවාරි 1 දින කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය ඉන් අනතුරුව ගන්නා ලද පෙබරවාරි 5 දින සහ අප්‍රේල් 2 දිනය තීරණ යටතේ ආපසු හරවමින්, පලාලි ගුවන් තොටුපොළ ප්‍රාදේශීය වාණිජ ගුවන් ගමන් මෙහෙයුම් සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල විසින් ලබා දුන් මිලියන 900 ක සහ රු. මිලියන 1050 ක මුදලින් සංවර්ධනය කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

v. 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ 9 වන වගන්තියට අනුව ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා ගරු අමාත්‍යවරයා විසින් මඩකලපුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙතට සහ යටතට මාරු කිරීමට විසින් 2016 ජූලි 1 වන දින අංක 1973/78 ගැසට් නිවේදනය පලකරන ලදී. ඒ අනුව, ඉඩම් සහ ගොඩනැගිලි ගුවන්සේවා අධිකාරි රෙජිස්ට්‍රාර්වරයා වෙතට 2017 දී සහ 2018 දී ලබා දෙන ලදී. මෙම දේපළ ගුවන් තොටුපොළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා (සීමාසහිත) වෙත මෙහෙයුම් සඳහා ලබා දී ඇත.

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

vi. සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ 9 වන වගන්තියට අනුව, ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍ය විසින් දෙවන උපලේඛනයේ දක්වා ඇති පහත සඳහන් අහස් යාත්‍රා අංගනත්, එම පනතේ තෙවන උපලේඛනයේ දක්වා ඇති ගගනගාමී පහසුකම් සහ ඊට අදාළ වන ඉඩමත් වහාම ක්‍රියාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත ලබා දීමට සහ ඒ යටතට පත් කිරීමට 2017.12.21 දින අංක 2050/38 දරන අති විශේෂ ගැසට්පත්‍රය පළ කරන ලදී.

අහස යාත්‍රා අංගන (දෙවන උපලේඛනයේ දක්වා ඇති පරිදි)

- කටුනායක ගුවන් තොටුපොළ
- රත්මලාන ගුවන් තොටුපොළ

ගගනගාමී පහසුකම් සහ ඊට අදාළ ඉඩම් (තෙවන උපලේඛනයේ දක්වා ඇති)

- කඳවල පාර, රත්මලාන පිහිටා ඇති සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය, ගොඩනැගිල්ල සහ එහි ආකෘතීන් සහ ඊට අදාළ ඉඩම
- අත්තිඩිය, රත්මලාන පිහිටා ඇති ගගනගාමී සන්නිවේදන සම්ප්‍රේෂණ ස්ථානය, ගොඩනැගිල්ල සහ එහි ආකෘතීන් සහ ඊට අදාළ ඉඩම
- මඩම්පැල්ල, ගම්පහ පිහිටා ඇති බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා වන ගුවන් විදුලි මං සෙවුම් සහය, ගොඩනැගිල්ල සහ එහි ආකෘතීන් සහ ඊට අදාළ ඉඩම
- කපුන්ගොඩ, පමුණුගම, ගම්පහ හි පිහිටා ඇති බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා වන ගුවන් විදුලි මං සෙවුම් සහය, ගොඩනැගිල්ල සහ එහි ආකෘතීන් සහ ඊට අදාළ ඉඩම
- පිදුරුතලාගල කන්දේ පිහිටා ඇති රේඩාර් ස්ථානය, ගොඩනැගිල්ල සහ එහි ආකෘතීන් සහ ඊට අදාළ ඉඩම
- ගුවන්සේවා කාර්ය මණ්ඩලය සඳහා සංචාරක නිකේතන ඉදි කොට ඇති පිදුරුතලාගලහි පිහිටි ඉඩම, ඊට අදාළ ඕනෑම ආකෘතියක් සමඟ
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර නව නගරයෙහි අංක 249 අදියර II, ග්‍රාමසේවක කොට්ඨාසයේ, නුවරගම්පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති පාර්සල් අංක 976 දරන හෙක්ටයාර 0.125 ක බිම් කැබැල්ල

ඉහත දේපළවල අගයන් ඒවායේ මිනුම් සැලසුම් සහ ගණනය කිරීම් අවසන් වූ විට සහ 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ ප්‍රතිපාදන අනුව වත්කම් හුවමාරු වූ විට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වත්කම් රෙජිස්ටරයට ඇතුලත් කෙරෙනු ඇත.

වත්කම් වර්ගය	01/01/2020 දිනට ශේෂය	එකතු කිරීම් / හුවමාරු කිරීම්	ඉවත් කිරීම්	31/12/2020 දිනට ශේෂය	31/12/2019 දිනට ශේෂය
ඉඩම්	575,826,244			**575,826,244**	575,826,244
ගොඩනැගිලි	1,038,330,214	765,207,364		**1,803,537,578**	1,038,330,214
වාහන	132,502,263			**132,502,263**	132,502,263
පිරියත සහ යන්ත්‍ර සූත්‍ර	119,351,121	2,680,796	(594,000)	**121,437,918**	119,351,121
ගෘහ භාණ්ඩ සහසවිකිරීම්	56,559,781	2,580,587		**59,140,368**	56,559,781
වෙනත් ස්ථාවර වත්කම්	625,254			**625,254**	625,254
	1,923,194,877	770,468,748	(594,000)	**2,693,069,625**	1,923,194,877

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ක්ෂය වීම	01/01/2020 දිනට ශේෂය	වසර සඳහා ගාස්තුව	ඉවත් කිරීම්	31/12/2020 දිනට ශේෂය	31/12/2019 දිනට ශේෂය
ගොඩනැගිලි	61,240,313	102,672,565		**163,912,877**	61,240,313
වාහන	95,153,700	5,770,511		**100,924,211**	95,153,700
පිරියත සහ යන්ත්‍ර සූත්‍ර	66,533,574	15,926,356	(395,812)	**82,064,118**	66,533,574
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	27,065,397	9,078,927		**36,144,325**	27,065,397
වෙනත් ස්ථාවර වත්කම්	418,582	75,011		**493,593**	418,582
	250,411,566	133,523,370	(395,812)	**383,539,125**	250,411,566
ලියන ලද අගය				**2,309,530,500**	1,672,783,311

30. අස්පෘශ්‍ය වත්කම්

වත්කම් වර්ගය	01/01/2020 දිනට ශේෂය	එකතු කිරීම් / හුවමාරු කිරීම්	ඉවත් කිරීම්	31/12/2020 දිනට ශේෂය	31/12/2019 දිනට ශේෂය
තොරතුරු තාක්ෂණ මෘදුකාංග	16,081,967	2,497,500.00	-	**18,579,466.95**	16,081,967

ක්ෂය වීම	01/01/2020 දිනට ශේෂය	වසර සඳහා ගාස්තුව	ඉවත් කිරීම්	31/12/2020 දිනට ශේෂය	31/12/2019 දිනට ශේෂය
තොරතුරු තාක්ෂණ මෘදුකාංග	14,241,877	256,265		**14,498,142**	14,241,877
ලියන ලද අගය				**4,081,325**	1,840,090

31. විරවිල ඉඩම - භාවිත කිරීමේ අයිති වත්කම

අධිකාරිය වෙත 2008 වර්ෂයේ ජනවාරි මස රජයෙන් දුන් වසර 30 ක කල්බද්දට අනුව විරවිල සර්කිට් බංගලාව පිහිටි ඉඩම ලැබී ඇත.2019.12.31 දක්වා එම කල්බදු ගෙවීම් අධිකාරිය විසින් ලාභ හා පාඩු හිණුමෙන් අය කරගෙන ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් LKAS 17 අභිබවමින් SLFRS 16 නිකුත් කොට ඇත. එම නිසා, සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් 2020 ජනවාරි 1 වන දින සිට අතීතයට බල පවත්නා පරිදි SLFRS 16 හි C7 සිට C13 ඡේද අනුව පළමු භාවිතා කිරීමේදී හඳුනාගන්නා ප්‍රමිතිය ක්‍රමයෙන් එකතු වන ලෙසට ක්‍රියාත්මක වන ලෙසට මෙම ප්‍රමිතිය යොදා ගෙන ඇත.

භාවිත කිරීමේ අයිති වත්කම්වල හඳුනා ගත ධාරක අගයන් පහත දැක්වේ.

	2020	2019
2020 ජනවාරි 1 වන දිනට	**378,607**	-
එකතු කිරීම්	**-**	-
ක්ෂය වීමේ වියදම	**(21,034)**	-
2020 දෙසැම්බර් 31 දිනට	**357,573**	-

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

32. ඉටු වෙමින් පවතින මූලධන වැඩ

i. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් පුත්තලමේ සහ බණ්ඩාරවෙල දේශීය ගුවන් තොටුපොළවල් සංවර්ධනය කිරීමට මිනුම් සැලසුම් සඳහා ජාතික අයවැයෙහි යෝජනා කෙරුණු පරිදි මුදල් වැය කොට ඇත. මෙම දේශීය ගුවන් තොටුපොළවල සංවර්ධනය තවමත් අවසාන කොට නොමැති හෙයින්, එම ඉදි කිරීම් ආරම්භ නොකරන ලදී.

ii. 2019.12.31 දින දක්වා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් දරන ලද රු. 446,509,332 ක මුදල 'කෙරෙමින් පවතින වැඩ - ප්‍රාග්ධන' යන්න යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති අතර, රු. 170,621,991 ක අත්තිකාරම් ගෙවීම් අත්තිකාරම් - පලාලි ලෙස දක්වා ඇත. 2020.12.31 දින දක්වා වන අවසාන බිල්පත් තවමත් ඉදිකරන්නන් විසින් ලබා දී නොමැති හෙයින් වත්කම තවමත් ප්‍රාග්ධනීකරණය කර නොමැත.

iii. තොරතුරු තාක්ෂණ සංවර්ධනය යටතේ සර්වර් අතථ්‍යකරණය Server Virtualization කිරීම සහ HRIS මෘදුකාංග සඳහා කරන ලද අර්ධ ගෙවීම් පහත දැක්වේ.

	2020	2019
දේශීය ගුවන්තොටුපල - බණ්ඩාරවෙල	**677,000**	677,000
දේශීය ගුවන්තොටුපල - පුත්තලම	**315,000**	315,000
දේශීය ගුවන්තොටුපල - රත්මලාන	**-**	754,474,756
ජාත්‍යන්තර ගුවන් තොටුපල - පලාලි	**446,509,332**	430,392,493
තොරතුරු තාක්ෂණ සංවර්ධනය	**17,292,744**	
	464,794,076	1,185,859,250

33. වෙළඳ ලැබිය යුතු දෑ

කොවිඩ් 19 වසංගත තත්ත්වයේ අභියෝග හේතුවෙන් ශ්‍රී ලංකා එයාර්ලයින්ස් සහ සමහර ගුවන්සේවාවන් විසින් 2020 වර්ෂයට වන අපගමන බද්ද ගෙවා නැත. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය අපගමන බද්ද එකතු කිරීමේ සහ වියදම් කිරීමේ බලයලත් අධිකාරිය වන හෙයින් සියලුම හඳුනා ගත් මුදල් අගයන් වෙනත් ණයගැතියෝ යටතේ දක්වා ඇත.

	2020	2019
ලැබිය යුතු විදේශ විකුණුම් අධිභාර සහ අපගමන බදු අය කිරීමේ සේවා ගාස්තු ආදායම	**31,576,152**	123,676,641
වෙනත් ණයගැතියෝ	**687,375,903**	841,296
	718,952,055	124,517,937

34. කාර්ය මණ්ඩල ණය

	2020	2019
කාර්ය මණ්ඩල ණය	**140,306,603**	100,771,508
කල් තැබූ කාර්ය මණ්ඩල පිරිවැය (ණය)	**(49,619,751)**	(42,252,794)
	90,686,852	58,518,714

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

35. මූල්‍ය වත්කම්

	2020	2019
භාණ්ඩාගාර බිල්පත්	**1,232,748,534**	876,313,834
අඩු කලා - කල් තැබූ පොළී ආදායම	**(14,618,566)**	(14,312,916)
	1,218,129,968	862,000,918

විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් (2019.12.31 දිනට ශේෂය) සඳහා රු. 40,461,111 ක වෙනම ආයෝජනයක් නඩත්තු කෙරෙන අතර එය මූල්‍යමය වත්කම් යටතේ දක්වා ඇත.

36. අත්තිකාරම්, පෙර ගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ

	2020	2019
අත්තිකාරම්	**173,858,816**	196,406,301
පෙර ගෙවුම්	**8,103,104**	5,204,322
ලැබිය යුතු බදු VAT	**241,172,350**	233,926,423
ලැබිය යුතු පොළී ආදායම	**41,169,645**	5,947,275
පෙර ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය	**49,619,751**	42,252,794
	513,923,665	483,737,116

ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ සිට අධිකාරියේ විගණන ඉන්වොයිස් විගණනය කිරීම ආරම්භ කොට නැත. 2015-2019 දක්වා VAT ලැබිය යුතු අගයන් ප්‍රමාණය VAT ලැබිය යුතු ප්‍රමාණයෙන් 90% කට වඩා නියෝජනය කරයි.

37. මුදල් සහ මුදල් සමාන දෑ

	2020	2019
බැංකුවේ ඇති මුදල්		
ජංගම ගිණුම : 000 202 6666	**5,354,213**	140,739,958
ජංගම ගිණුම : 000 202 6678	**370,637,638**	605,722,250
ජංගම ගිණුම : 324 100 190 023 731	**34,733,513**	603,828,485
ඇමතුම් තැන්පතු	**1,246,950,000**	798,000,000
සුළු මුදල් අත්තිකාරම්	**657,065**	618,487
මුදල් ප්‍රවාහ ප්‍රකාශ සඳහා සම්පූර්ණ මුදල් සහ මුදල් හා සමාන දෑ	**1,658,332,429**	2,148,909,180

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

38. ලැබුණු රජයේ ප්‍රදාන

i. 2002 අංක 34 දරන ගුවන්සේවා අධිකාරි පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සිවිල්ගුවන්සේවා අධිකාරිය වෙත ලැබුණු මඩකලපුව ගුවන් තොටුපොළ ගොඩනැගිලි සහ ඉඩම්වල අගය

ii. ICAO ව්‍යාපෘතියෙන් ලැබුණු 65-3651 සහ 65-3653 රථ දෙකෙහි අගය

iii. ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජයීය සංවර්ධන වැඩසටහන සඳහා ජපානයේ ප්‍රදාන සහය වෙතින් බාහිර සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලැබුණු ඇල්කොහොල් ස්වසන විශ්ලේෂක පරීක්ෂණ වීකක 3 හි අගය

01.01.2019 දිනට රජයේ ප්‍රදාන	571,332,766
2019 වර්ෂය පුරාවට ලැබුණු ප්‍රදාන - වීකතු	-
2019 වර්ෂය සඳහා ක්‍රමක්ෂය - අඩු	(4,238,750)
31.12.2019 දිනට රජයේ ප්‍රදාන	567,094,016
2020 වර්ෂය පුරාවට ලැබුණු ප්‍රදාන - වීකතු	-
2020 වර්ෂය සඳහා ක්‍රමක්ෂය - අඩු	(4,275,899)
31.12.2020 දිනට රජයේ ප්‍රදාන	562,818,117

	2020	2019
ඉඩම්	**522,374,500**	522,374,500
ගොඩනැගිලි	**33,403,094**	35,704,790
පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	**1,172,201**	1,674,275
වාහන	**10,126,108**	11,561,088
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	**18,113**	18,113
වීකතුව	**567,094,016**	571,332,766
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	**(4,275,899)**	(4,238,750)
වර්ෂය අවසානයේ ශේෂය	**562,818,117**	567,094,016

39. රඳවා ගත් ඉපයීම්

	2020	2019
වසර ආරම්භයේ	**3,545,739,523**	3,010,096,178
වර්තමාන වසයේ ලාභය	**237,151,840**	1,348,801,346
පෙර වසරේ ගැලපීම් - VAT	**-**	(13,158,001)
පෙර වසයේ ගැලපීම් - පාරිතෝෂික	**-**	1,341,090
වෙනත් විස්තරාත්මක ආදායම් / (වියදම්)	**(20,183,552)**	(1,341,090)
වීකාබද්ධ අරමුදලට මාරු කිරීම්	**-**	(800,000,000)
වසර අවසානයේ	**3,762,707,811**	3,545,739,523

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

40. කල් තැබූ බදු වගකීම්

	මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය		විස්තරාත්මක ආදායම් පිළිබඳ ප්‍රකාශය	
	2020	**2019**	**2020**	**2019**
කල්තැබූ බදු වගකීම	**14,846,280**	13,192,635	**1,653,645**	
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම	**20,414,618**	20,414,618		2,230,073
ඉක්මන් කළ බදු ක්ෂය	**35,260,898**	33,607,253	**1,653,645**	2,230,073
කල්තැබූ බදු වත්කම - අදාළ වසරට				
ඉක්මන් කළ බදු ක්ෂය	**10,377,440**	5,218,243	**5,159,196**	-
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම				2,425,941
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම	**10,377,440**	5,218,243	**5,145,126**	2,425,941
වෙනත් විස්තරාත්මක ආදායම්				
කල් තැබූ ආදායම් බදු අය කිරීම (28 සටහන)			**(3,505,552)**	(195,868)

වර්තමාන බදු වගකීම්වලට එරෙහිව වර්තමාන බදු වත්කම් හිලව් කිරීමට නෛතික, බලාත්මක කළ හැකි අයිතියක් පවතින්නේ නම් සහ කල්තැබූ ආදායම් බදු එකම රාජ්‍ය මූල්‍ය අධිකාරියට සම්බන්ධ වේ නම් කල්තැබූ ආදායම් බදු වත්කම් සහ වගකීම් බෙරුම් කෙරෙයි. ශුද්ධ කල්තැබූ බදු අගය පහත පරිදි වේ.

	2020	**2019**
කල්තැබූ බදු වත්කම්	**10,377,440**	5,218,243
කල්තැබූ බදු වගකීම්	**(35,260,898)**	(33,607,253)
ශුද්ධ කල්තැබූ බදු වත්කම් සහ වගකීම්	**(24,883,458)**	(28,389,010)

41. කල්බදු වගකීම්

	2020	**2019**
2020 ජනවාරි 1 වන දිනට	**378,607**	-
එකතු කිරීම්	**-**	-
වැඩිවූ පොළිය	**1,516**	-
ගෙවීම්	**(26,784)**	
2020 දෙසැම්බර් 31 දිනට	**353,339**	-

42. ප්‍රතිපාදන හා වෙනත් වගකීම්

	2020	**2019**
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල	**128,487**	508,915
බැංකු සුරැකුම් තැන්පතු (අපගමන බද්ද)	**43,945,368**	43,945,368
අනතුරු විමර්ශන අරමුදල	**50,000,000**	50,000,000
	94,073,855	94,454,283

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

43. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනා ගෙන ඇති වගකීමේ සංචරණය පහත පරිදි වේ.

	2020	2019
වර්ෂය ආරම්භයේ දී	**40,461,111**	33,631,163
ජංගම සේවා පිරිවැය	**4,826,489**	3,932,965
පොලී පිරිවැය	**2,063,698**	2,690,493
වසර තුළ කළ ගෙවීම්	**(17,449,856)**	(1,134,600)
නිගමන කාලය තුළ වූ වෙනස්කම් හේතුවෙන් ඇති වූ (ලාභ)/පාඩු	**20,183,552**	1,341,090
වර්ෂය අවසානයේ	**50,084,994**	40,461,111

සේවක ප්‍රතිලාභ පිරිවැය තීරණය කිරීමේදී, ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය යොදාගනිමින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් ගණනය කිරීමට වසර අවසානයේ භාවිතා කළ ප්‍රධාන නිගමන වන්නේ,

	2020	2019
වට්ටම් අනුපාතය	**6%**	8.50%
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය	**1%**	2.50%
ජීවත් වීමේ වියදම් දීමනාව වැඩිවීමේ අනුපාතය	**0%**	0%
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය	**0%**	0%
විශ්‍රාම ගැනීමේ වයස	**අවුරුදු 60**	අවුරුදු 60

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීමට බාහිර වශයෙන් අරමුදල් එක් නොවන අතර, වසර අවසානයේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙනම ආයෝජනයක් නඩත්තු කෙරේ.

44. වෙළඳ ගෙවිය යුතු දෑ

i. 2019 ඔක්තෝබර් 11 වන දින කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 1.050 ක මුදලක් යාපනය (පලාලි) අන්තර්ජාතික ගුවන් තොටුපොළ ප්‍රාදේශීය වාණිජමය ගුවන් ගමන් සඳහා සංවර්ධනය කිරීමට අපගමන බද්දෙන් ප්‍රේෂණය වූ මුදල් රඳවා තබා ගැනීමට අනුමැතිය හිමි විය. රඳවා ගත රු. 1,050,000 ක මුදල “තැන්පතු - යාපනය අන්තර්ජාතික ගුවන් තොටුපොළ සංවර්ධනය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය” යටතේ දක්වා ඇත.

	2020	2019
පරීක්ෂණ ගාස්තු සහ මෙහෙයුම් සඳහා තැන්පතු	**7,725,019**	6,556,025
සීමාසහිත ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම, සංචාරක සංවර්ධන අධිකාරියට සහ රජයේ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	**1,228,944,925**	1,664,531,840
තැන්පතු - යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධනය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	**1,050,000,000**	313,018,895
වෙනත් ණයහිමියෝ	**23,284,650**	48,120,112
	2,309,954,594	2,032,226,872

මූල්‍ය ප්‍රකාශන – 2020

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

45. වෙනත් ගෙවිය යුතු දෑ

	2020	2019
උපචිත වියදම්		
කාර්ය මණ්ඩල වියදම්		
නිවාඩු මුදල් කිරීම	**9,761,991**	6,500,077
බෝනස්	**9,560,112**	-
සේවක අර්ථසාධක අරමුදල	**5,906,772**	10,000
සේවක භාරකාර අරමුදල	**817,578**	1,200
සුභසාධන ගෙවීම්	**581,986**	606,451
උපයන විට ගෙවන බදු	**201,123**	-
දීමනා ගෙවීම්	**189,438**	-
වැටුප් හා වේතන	**30,000**	10,000
පුහුණුව	**-**	101,300
පරිපාලන හා වෙනත් වියදම්		
ICAO සඳහා දායක මුදල්	**16,343,796**	5,504,475
බාහිර තාක්ෂණික සහාය	**2,726,000**	1,295,671
විදුලි සංදේශනය	**777,015**	1,444,311
විගණන ගාස්තු	**3,718,000**	2,518,000
විදුලිබලය	**1,437,564**	1,376,496
සුරක්ෂිතතාව	**91,020**	1,141,226
පවිත්‍රතා සේවා	**14,612**	1,165,414
මුද්‍රණ වියදම්	**3,431,994**	1,400,000
වෙනත් වියදම්	**6,266,238**	2,617,033
	61,855,239	25,691,653

46. ආදායම් බදු වගකීම්

	2020	2019
වර්ෂය ආරම්භයේ දී ශේෂය	**210,822,185**	259,513,549
වර්ෂය සඳහා ප්‍රතිපාදන	**73,034,020**	524,457,686
වර්ෂය තුළ ගෙවීම්	**(164,706,977)**	(573,149,050)
වර්ෂය අවසානයේ දී ශේෂය	**119,149,229**	210,822,185

47. ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල වෙනස්කම් කිරීමට හෝ හෙළි කිරීමට තරම් ප්‍රමාණවත් වැදගත් සිදුවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් පසුව සිදු වී නොමැත.

මූල්‍ය ප්‍රකාශන – 2020

විගණකාධිපතිගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. AVA/B/CAASL/01/20/13 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 20 May 2021

සභාපති

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශනය

1.1 මතය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ("අධිකාරිය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශන – 2020

විගණකාධිපතිගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු අඩංගු කර ඇති නමුත් මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මූල්‍ය ප්‍රකාශන සහ මගේ විගණක වාර්තාව ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන් මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු කියවා, අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේදී ලබාගත් මගේ දැනුම හෝ වෙනත් ආකාරයකින් ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න හා ද්‍රව්‍යමය වශයෙන් වැරදි ලෙස ප්‍රකාශ කර ඇත්දැයි සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත මා විසින් සිදු කර ඇති කාර්යය පදනම් කරගෙන, මෙම අනෙකුත් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇති බව මා නිගමනය කරන්නේ නම්, එම කරුණ වාර්තා කිරීමට මා බැඳී සිටිමි. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වගකිව යුතුය.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

මූල්‍ය ප්‍රකාශන – 2020

විගණකාධිපතිගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ. මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් විනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

මූල්‍ය ප්‍රකාශන – 2020

විගණකාධිපතිගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අඳාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

මූල්‍ය ප්‍රකාශන – 2020

විගණකාධිපතිගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.5 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) මහා භාණ්ඩාගාරයට අයත් කළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව දීමනා නොගෙවිය යුතු වුවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව, අධිකාරියේ ඉහළ කළමනාකරණ නිලධාරීන් 27 දෙනෙකු සඳහා එක් නිලධාරියකුට රු.50,000 බැගින් වූ කළමනාකරණ දීමනාවක් 2018 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවා ඇත. ඒ අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධිකාරිය විසින් මුළු දීමනා ගෙවීම් සඳහා රු. 14,050,000 ක මුදලක් වැය කර ඇත.

(ආ) 2020 දෙසැම්බර් 31 දක්වා මිලදී ගැනීම් සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අධිකාරියට ලැබිය යුතු එකතු කළ අගය මත බදු (ආදාන බදු) රු. 241,172,350 කි. ඉහත වටිනාකම ආපසු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිහිපයක් පැවැත්වුවද අවසන් තීරණයක් ගෙන නොමැත. මෙම මුදල අයකර ගැනීමේ හැකියාව සැකසහිත බව නිරීක්ෂණය කෙරේ. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් ලබා දී නොමැත.

(ඇ) අධිකාරියේ පරිපාලන අත්පොතෙහි (SLCAP-5000) 18.3.2(ඉ) ඡේදයට අනුව, ප්‍රවාහන සහ සංචලතා දීමනාව වසර පහකට නොඅඩු කාල සීමාවකදී අධිකාරියේ උද්ධමනය සහ මූල්‍ය සෞඛ්‍යය සැලකිල්ලට ගනිමින් අධිකාරිය විසින් සියයට 10 ට නොවැඩි ප්‍රතිශතයකින් සංශෝධනය කළ හැක. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අධිකාරියේ අයහපත් මූල්‍ය තත්ත්වය නොසලකා 2020 ජුනි 23 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව 2016 වසරේ සිට 2020 දක්වා හිඟ ප්‍රවාහන දීමනා ලෙස රුපියල් 9,286,520 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය පෙර වසරේ රුපියල් 1,348,801,346 සිට සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් 236,772,763 දක්වා රුපියල් 1,112,028,583 කින් හෝ සියයට 82.5 කින් අඩු වී ඇත. කාර්ය සාධන වාර්තාවට අනුව, වසංගත තත්ත්වය හේතුවෙන් සෑම අංශයකම කාර්ය සාධනය පහත වැටී ඇත. තවද, රට සහ නිශ්චිත ප්‍රදේශ කලින් කලට අගුලු දැමීම හේතුවෙන්, අධිකාරියේ කාර්ය මණ්ඩලයට නිවසේ රැඳී සිටීමටත් නිවසේ සිට වැඩ කිරීමටත් අවසර දී තිබුණි. කෙසේ වෙතත්, අධිකාරිය විසින් එම තත්ත්වයන් සැලකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයට සාමාන්‍ය නිවාඩු මුදල් ලෙස රුපියල් 10,428,105 ක් ගෙවා ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 37 ක් හෙවත් රුපියල් 3,928,028 ක වර්ධකයක් විය. එම තීරණය විවාදාත්මක එකක් වූ අතර එය සාධාරණීකරණය කළ නොහැකි බව නිරීක්ෂණය විය.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන – 2020

විගණකාධිපති වාර්තාවට පිළිතුරු - 2020

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

මෙය අංක AVA/B/CAASL/01/20/13 දරන 2021 මැයි 20 දිනැති ඔබේ වාර්තාවලට අදාල වේ.

ඉහත සඳහන් වාර්තාව සඳහා පිළිතුරු පහත ඉදිරිපත් කර ඇත.

2.5 වෙනත් කරුණු

(a) ඔබගේ නිරීක්ෂණයට එකඟ නැත

කළමනාකරණ දීමනාව සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයට ලිඛිතව යවා ඇත. මේ අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට අනුව, 2002 අංක 34 දරන පනත හරහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත පැවරී ඇති බලතල සැලකිල්ලට ගනිමින් ගෙවීම් අඛණ්ඩව සිදු කෙරේ.

එබැවින් ඉහත කරුණු සලකා බලා මෙම ප්‍රකාශය ඉවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

(b) ඔබගේ නිරීක්ෂණයට එකඟ නැත

සාකච්ඡා සහ පසු විපරම් ක්‍රියා සිදුවෙමින් පවතින අතර, මුදල් ආපසු ලබා ගැනීම ගැන සැකයක් නැත. එබැවින් මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොතිබුණි.

එබැවින් ඉහත කරුණු සලකා බලා මෙම ප්‍රකාශය ඉවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

(c) ඔබගේ නිරීක්ෂණයට එකඟ නැත

පරිපාලන අත්පොතෙහි (SLCAP 5000) ඇති ප්‍රතිපාදන අනුව නියමිත වේලාවට දීමනාව සිදු නොවූවත් එය සංශෝධනය කිරීමට හිමිකම් ඇති බැවින් හිඟ මුදල් ගෙවීම සිදු කර ඇත. එබැවින් නියමිත දින සිට ප්‍රවාහන දීමනාව සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

මෙම ගෙවීම් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා ගත හැකි වූ අතර, අදාළ වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ලාභයක් ලබා ඇත. එබැවින් කාර්ය මණ්ඩලයේ මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය මෙම සාමාන්‍ය ගෙවීම සිදු කිරීමට තීරණය කළේය. මූල්‍ය අලාභයක් සිදුවුවහොත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය මෙම ගෙවීම සිදු නොකරයි.

එබැවින් මෙම නිරීක්ෂණය විගණන වාර්තාවෙන් ඉවත් කරන මෙන් මම කාරුණිකව ඉල්ලා සිටිමි.

(d) ඔබගේ නිරීක්ෂණයට එකඟ නැත

පරිපාලන අත්පොත (SLCAP 5000) විධිවිධාන අනුගමනය කරමින්, ගෙවීම් සඳහා නියමිත අවසරය ඇතිව නිවාඩු මුදල් ගෙවීම ක්‍රියාත්මක කර ඇත.

මෙම ගෙවීම් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා ගත හැකි වූ අතර, එම වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ලාභයක් ලබා ඇත. එබැවින් කාර්ය මණ්ඩලයේ මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය මෙම චර්යානුගත ගෙවීම් සිදු කිරීමට තීරණය කළේය. පාඩුවක් සිදුවුවහොත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය මෙම ගෙවීම් සිදු නොකරයි.

එබැවින් ඉහත කරුණු සලකා බලා මෙම ප්‍රකාශය ඉවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

උපුල් ධර්මදාස
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

optima
Designing Your Year!
Designed & Produced by
Optima Designs (Pvt) Ltd.
A full service design and print company.
www.optimadesigns.lk



සැමට නිරුපදුත සහ කාර්යක්ෂම අහසක්

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක
දුරකථනය: 94 – 11 – 2358800
ෆැක්ස්: 94 – 11 – 2253038
විද්‍යුත් තැපෑල: info@caa.lk
වෙබ් අඩවිය: www.caa.lk